වාර්ෂික වාර්තාව

2020





Great Life Deserves a Great Tea - Ceylon Tea

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වාර්ෂික වාර්තාව

2020

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

LEAF TO CUP

PLUCKING

Plucking is the process of manually harvesting the top two tea leaves and a bud. The coarse leaves are never harvested. A long tradition dictates that tea leaves are plucked, never picked. Almost all Ceylon Tea is hand-plucked by expert tea pluckers who select only the tender most bud and two leaves, carefully isolating and breaking them off so as not to damage the leaf and importantly, to minimise the length of stalk attached to the leaf.



WITHERING



On arrival at the factory, the leaf is spread on withering troughs to dry, usually on the upper floors of the factory, with air being forced gently through the bed of leaves for around eight hours.

GRADING AND SORTING

The final stage of manufacturing is sifting and sorting, separating tea into grades based on particle size. Most of the stalk and fibre are removed to give the tea its cleanest and purest fragrance, flavour and appearance. In turn, the stalk and fibre are used to make instant teas, tea extracts, flavours and fragrances.





ROLLING



Withered leaves are fed into rolling machines, where they are twisted, releasing enzymes that give the tea its characteristic flavour. The nature and degree of rolling is masterfully controlled by the tea-maker so as to obtain the exact character he wishes the finished product to have. This rolling process also determines the twisted shape of the particles of made tea.

FIRING

Next, the tea leaves are passed slowly through a hot-air chamber until they become the familiar black colour. The leaves reduce to about one-fourth of their original volume after firing.



FERMENTATION



The rolled leaves are then spread out on tables, left to absorb oxygen for approximately three hours, turning them a coppery brown colour. During this process the polyphenol oxidises into theaflavin and thearubigins which give black tea its distinct color and taste. Deciding when to stop 'fermentation' is a crucial demonstration of the tea maker's skill because the key features of the beverage (e.g. flavour, aroma, colour, and liquoring characteristics) are largely determined during this time.

CEYLON TEA
SYMBOL OF QUALITY

Ceylon Tea
Pure Enchantment in a Cup

Only genuine Ceylon Tea from Sri Lanka carries this quality mark

පටුන

දැක්ම හා මෙහෙවර - 04
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් - 05
විගණන කමිටුවේ සාමාජිකයන් හා නිරීක්ෂකයන් - 06
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය - 06
ප්‍රවර්ධන හා අළෙවිකරණ කමිටුවේ සාමාජිකයන් - 07
සභාපතිතුමාගේ පණිවිඩය - 08
මූලික සංසන්දනාත්මක දර්ශක - 11
සංස්ථාපිත පසුබිම - 12
ව්‍යුහය හා සිදුකළ ක්‍රියාකාරකම් - 13
තේ කොමසාරිස් අංශය - 14
තේ අපනයන අංශය - 23
තේ ප්‍රවර්ධන අංශය - 26
තේ රසබැලිමේ ඒකකය - 32
විශ්ලේෂණ විද්‍යාගාරය - 35
පරිපාලන අංශය - 39
අභ්‍යන්තර විගණන අංශය - 40
තොරතුරු තාක්ෂණ අංශය - 40
කර්මාන්ත පැතිකඩ - 41
මූල්‍ය සමාලෝචනය - 77
විගණකාධිපතිතුමාගේ වාර්තාව - 112
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල - 128

තැපැල් ලිපිනය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය 574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථන අංකය : +94-11-2587814/2582121/2583687
ෆැක්ස් : +94 112587341/2589132
විද්‍යුත් තැපෑල : teaboard@pureceylontea.com
වෙබ් අඩවිය : www.srilankateaboard.lk
www.pureceylontea.com

දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ
ශ්‍රී ලාංකීය තේ
"වඩාත් ආකර්ශනීය පානය"
බවට පත්කිරීම

මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මගින්
රටට ලැබෙන විදේශ විනිමය ඉපයීම්
වැඩිකරගැනීම සහ එමඟින්
වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ
ආර්ථික සංවර්ධනය
සුරක්ෂිත කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් - 2020

සභාපති

ජයම්පති මොල්ලිගොඩ මයා

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

සාමාජිකයන්

ඩබ්ලිව්.එච්.එස්. සමරසේන මයා
අමාත්‍යතුමාගේ නියෝජිත

මහින්ද විද්‍යානපතිරණ මයා
2020.02.13 සිට මේ දක්වා
සභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

ඩී.ඩී. මාතරආරච්චි මයා
2020 අගෝස්තු දක්වා
මුදල් අමාත්‍යාංශය

නරේන් දඹවින්න මයා
2020 මැයි දක්වා

සමන්ත දොඩන්වෙල මයා
2020 මැයි සිට මේ දක්වා
කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය

චන්දිම වික්‍රමසිංහ මයා
ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය

සංපේ හේරත් මයා
තේ අපනයනකරුවන්ගේ සංගමය

ඩබ්ලිව්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මය
වැවිලි අමාත්‍යාංශය

සුනිල් පොහොලියද්ද මයා
2020 අගෝස්තු දක්වා

ලලිත් ඔබේසේකර මයා
2020 ඔක්තෝබර් සිට
ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

ඩී. පීවනාදන් මයා
2020 ඔක්තෝබර් සිට

ජයන්ත කරුණාරත්න මයා
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

කේ.එල්. ගුණරත්න මයා
ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය

නිරීක්ෂකයන්

අනිල් අල්විස් මයා
2020 පෙබරවාරි සිට
වෙළඳ අමාත්‍යාංශය

විගණන කමිටුවේ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් - 2020

සභාපති

ඩබ්ලිව්.එම්.ඩී.ටී.වික්‍රමසිංහ මිය
අතිරේක ලේකම් (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය

සාමාජිකයන්

ඩී.පීවනාදන් මයා
අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය

චන්දිම වික්‍රමසිංහ මයා
සභාපති, ශ්‍රී ලංකා තේ කර්මාන්ත ශාලා හිමියන්ගේ සංගමය

නිරීක්ෂකයන්

කේ.ඒ.සී.සමන්ත මයා
ප්‍රධාන අභ්‍යන්තර විගණක, වැවිලි අමාත්‍යාංශය

එස්.ඒ. සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

එස්.ඩී.කටුවාවල මිය
විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය - 2020

එස්.ඒ. සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ ජනරාල්

එච්.එල් පවිත්‍රි පීරිස් මෙනවිය
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)

ආචාර්ය කේ.ආර්.ඩබ්. අබේවික්‍රම මයා
වැඩ බලන අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා)

එච්.ඩී.කේ.ජයසිංහ මයා
ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක

ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා
තේ කොමසාරිස්

පී.ඒ.හිරෝෂ් ජයංග මයා
අධ්‍යක්ෂ (මුදල්)

එස්.අයි.සී. පෙරේරා මයා
සහකාර අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)

ප්‍රවර්ධන හා අලෙවි කමිටු සාමාජිකයන් - 2020

සභාපති

ජයම්පති මොල්ලිගොඩ මයා
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

සාමාජිකයන්

අනුර සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ ජනරාලල ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තරංගනි වික්‍රමසිංහ මිය
අතිරේක ලේකම්, වැවිලි අමාත්‍යාංශය

සංජේ හේරත් මයා
සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය

සුරංග හේරත් මයා
ප්‍රධාන විධායක නිලධාරී, ඇමසන් ට්‍රේඩින් පුද්. සමාගම

මුහද්දල් ජෆර්ජි මයා
සාමාජික, තේ අපනයනකරුවන්ගේ සංගමය

එච්.එල් පවිත්‍රි පීරිස් මෙනවිය
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), ශ්‍රී ලංකා තේ මණ්ඩලය

හසිත ද අල්විස් මයා
උපදේශක, වැවිලි අමාත්‍යාංශය

දිල්හාන් සී ප්‍රනාන්දු මයා
ප්‍රධාන විධායක නිලධාරී එම්.ජේ.එෆ්.සංගමය

ටියාබ් අක්බරලි මයා
අධ්‍යක්ෂ, අක්බාර් සහෝදරයෝ

විශ් ගෝවින්දසාමි මයා
කළමනාකරණ අධ්‍යක්ෂ, ශන්ෂයින් හෝල්ඩින් සමාගම

ජයන්ත කරුණාරත්න මයා
සභාපති, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

නිරීක්ෂක

අනිල් කුක් මයා
ඒෂියා සියකා කොමොඩිටිස් (පුද්ගලික) සමාගම

සභාපතිතුමාගේ පණිවුඩය



හැදින්වීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දැක්ම වනුයේ ගෝලිය වෙළෙඳපොළ තුළ "වඩාත් ආකර්ශනීය පානය" බවට සිලෝන් තේ පත් කිරීම බව පළමු කොටම සඳහන් කිරීමට මම කැමැත්තෙමි. ඒ අනුව කර්මාන්තයේ තිරසාර සංවර්ධනය තුළින් රටෙහි විදේශ විනිමය ආදායම ඉහළ නැංවීමේ අරමුණින් කටයුතු ආරම්භ කර ඇති අතර එමගින් වතු ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සහතික කර ඇත.

"සෞභාග්‍යයේ දැක්ම " රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් තේ කර්මාන්තය සඳහා ලබා දී ඇති ඉලක්ක පහත දැක්වෙන පරිදි සඳහන් කළ හැකිය.

(අ) ශ්‍රී ලංකාවේ තේවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට ක්‍රමවේද හඳුන්වා දීම

(ආ) අපගේ තේ පිරිසිදු සිලෝන් තේ ලෙස ජාත්‍යන්තර වෙළඳපොලේ ප්‍රවර්ධනය කිරීම

(ඇ) තේ තොග වශයෙන් අපනයනය කිරීම අඩු කිරීම සහ අගය එකතු කළ තේ අපනයනය කිරීම දිරිමත් කිරීම. (මෙමගින් ඉදිරි දශකය තුළ තේවලින් ලැබෙන ආදායම දෙගුණයක් කිරීමට අපේක්ෂා කෙරේ)

(ඈ) ශ්‍රී ලංකාවේ අහිමි වූ තේ වෙළඳපොල නැවත ග්‍රහණය කර ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම ප්‍රයත්න දැරීම

(ඉ) කාබනික තේ වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය දිරිගැන්වීම සහ

(ඊ) තේ වතුවල ඵලදායිතාව සහ බෝගවල ගුණාත්මකබව පිළිබඳ ගැටලු සඳහා විසඳුම් ලබා දීම සහ ඒ සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම සඳහා තේ පර්යේෂණ ආයතනය ප්‍රතිව්‍යුහගත කර සංවර්ධනය කිරීම.

කොවිඩ් වසංගතය තත්වය හමුවේ ශ්‍රී ලංකා තේ කර්මාන්තය යථා තත්ත්වයට පත් විය. "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය හා අදාළ අමාත්‍යමණ්ඩල තීරණ අනුව යමින් තේ වගා බිමේ සිට පාරිභෝගිකයා දක්වා සිලෝන් තේවල ගුණය වර්ධනය කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් බොහෝ වැඩසටහන් දියත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ කාර්ය සාධනය

2020 වර්ෂයේ දී ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ විශිෂ්ට කාර්ය සාධනයක් සිදු වී ඇත. විශේෂයෙන්, සිලෝන් තේ ප්‍රවර්ධන ව්‍යාපාරය හේතුවෙන්, වෙනත් සම්භවයක් සහිත තේ අඩු මිලට සැපයුම හේතුවෙන් ඇතිවන තරගය, ඉහළ ප්‍රවාහන ගාස්තු, කොවිඩ්-19 මාර්ගෝපදේශ යටතේ දැඩි සෞඛ්‍ය ආරක්ෂක පියවරයන් හේතුවෙන් සැපයුම් සංවිධානය කිරීමේ දුෂ්කරතා වැනි අභියෝග අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් බාර ගන්නා ලදී.

මෙම පරිපාලනය භාර ගැනීමට පෙර, 2018 සහ 2019 වසරවල දී සිලෝන් තේ බෙදා හැරීමේ මිල ගණන් පිළිවෙලින් කිලෝ ග්‍රෑමයකට රුපියල් 822 ක් සහ රුපියල් 823 ක් විය. එය 2020 වසර තුළදී කිලෝග්‍රෑමයකට රුපියල් 867 දක්වා ඉහළ ගොස් ඇති අතර, ඒ හේතුවෙන් කොළඹ වෙන්දේසියේ දී සාමාන්‍ය විකුණුම් තේ මිල ද කිලෝග්‍රෑමයකට රුපියල් 627 දක්වා ඉහළ ගොස් ඇත (2019 ට සාපේක්ෂව 2020 දී රුපියල් 82 ක වැඩිවීමකි). කෙසේ වෙතත්, 2020 දී තේ නිෂ්පාදනයේ පහත වැටීමක් දැක ගත හැකි අතර කිලෝ ග්‍රෑම් මිලියන 279 ක් පමණක් ලබා ගෙන ඇත. 2021 ජුනි මාසය දක්වා වූ පළමු මාස 6 ක කාලය තුළදී සමස්ත නිෂ්පාදනයෙන් කිලෝග්‍රෑම් මිලියන 161ක් සාක්ෂාත් කර ඇති අතර, එකී ප්‍රමාණය 2020 වසරේ එම කාල සීමාව හා සසඳන විට 25%ක වර්ධනයකි. බෙදා හැරීමේ මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 43 ක් දක්වා ඉහළ ගියද, අඩු නිෂ්පාදනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ තේ අපනයන ආදායම 2019 දී රුපියල් බිලියන 240 සිට 2020 දී රුපියල් බිලියන 230 දක්වා පහත වැටී ඇත.

කොවිඩ් -19 වසංගත කාල වකවානුව තුළ අනුගමනය කරන ලද දැඩි සෞඛ්‍ය ආරක්ෂක පියවරයන්ට සමගාමීව, පෞද්ගලික හා රාජ්‍ය අංශ සඳහා බාධාවකින් තොරව එදිනෙදා ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී.

- ඊ-වෙන්දේසි මාර්ගගත වේදිකාව දියත් කිරීම: කොවිඩ් -19 වසංගත කාල වකවානුවේ දී ඊ-වෙන්දේසි ක්‍රමය ක්‍රියාත්මක කිරීම තේ කර්මාන්තයේ ඉමහත් ජයග්‍රහණයක් වූ අතර එමගින් කර්මාන්තයේ සියලුම පාර්ශවකරුවන්ට, විශේෂයෙන් තේ කර්මාන්තශාලා සහ දළු සැපයුම්කරුවන්/ වගා කරන්නන් හට ප්‍රයෝජන සැලසිය.

- කොවිඩ් -19 හි බලපෑම අවම කිරීම උදෙසා ඇතැම් තානාපති කාර්යාල විසින් සකස් කරන ලද රෙගුලාසි මත පදනම්ව, තානාපති කාර්යාල මගින් අපනයනකරුවන්ට ලේඛන නිත්‍යානුකූල කිරීම සඳහා පහසුකම් සපයනු වස් ශ්‍රී ලංකා තේ මණ්ඩලය අතරමැදියෙකු ලෙස කටයුතු කළේය.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වාණිජ බැංකු හරහා ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ රුපියල් මිලියන 500 ක යෝජනා ක්‍රමය යටතේ සෑම තේ කර්මාන්තශාලාවක් සඳහා මිලියන 3 බැගින් වූ වාරික ණයක් ලබා දෙන ලදී.

සිලෝන් තේවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම

සිලෝන් තේවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම ජාත්‍යන්තර වෙළඳපොල සමග තරග කිරීමේදී ඉතාමත් වැදගත් වන අතර රජයේ ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ තේවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා ක්‍රම හඳුන්වා දීම පිළිබඳ අවධාරණය කෙරේ. තේ වල ගුණාත්මක භාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීම උදෙසා වගාකරුවන්, තේ නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් දිරිමත් කිරීම සහ සිලෝන් තේ සඳහා ඇති පිළිගැනීම අඩුවීමට හේතුවන අක්‍රමිකතා අවම කිරීමේ අරමුණෙන් නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

අ) කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම උදෙසා තේ කම්හල් නවීකරණ කටයුතු වෙනුවෙන් 2020 වසරේ දී තේ කම්හල් 30ක් සඳහා රුපියල් මිලියන 18.9ක මුදලක් ගෙවන ලදී.

ආ) තේ නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කළ අතර 2020 වසරේ දී තේ වගා කරන ප්‍රදේශවල හෙක්ටයාර 48ක නැවත වගා කිරීම සඳහා රුපියල් මිලියන 15.8ක මුදලක් ගෙවන ලදී. තේ දළුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ පියවරක් වශයෙන්, තේ කර්මාන්ත ශාලා 250 ක් සඳහා තෙතමනය මාපක ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 25ක සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

ඇ) නැවත සිටුවීම /අළුතින් සිටුවීම සහ පිරවීමේ අවශ්‍යතාවය සඳහා ගුණාත්මක තේ පැලෑටි වැඩි කිරීමේ අරමුණෙන් රුපියල් මිලියන 457ක මුදලක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ (රුපියල් මිලියන 250) සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (රු. මිලියන 207) අධීක්ෂණය යටතේ ගුණාත්මක තේ තවාන් ස්ථාපිත කිරීමේ වැඩ සටහන සඳහා වෙන් කරන ලදී.

(ඈ) නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඉහළ ඵලදායිත්වයක් සහිත තේ ඉඩම් ප්‍රදර්ශනය සහ ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් ආදර්ශ තේ ඉඩම් ව්‍යාපෘතිය 2019දී හඳුන්වා දෙන ලදී. යෝජනා ක්‍රමය යටතේ ආදර්ශ තේ ඉඩම් 40ක් සංවර්ධනය කිරීමට නියමිතය.

අපගේ තේ පිරිසිදු සිලෝන් තේ වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොල තුළ ප්‍රවර්ධනය කිරීම

අපගේ සිලෝන් තේ ජාත්‍යන්තර වෙළඳපොල තුළ පිරිසිදු සිලෝන් තේ වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් රජය විසින් සකස් කරන ලද ඉලක්ක අනුව යමින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය විසින් විදේශීය වෙළෙඳපොළ තුළ බොහෝ ක්‍රියාකාරකම් දියත් කර තිබේ. එහෙයින්, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සිලෝන් තේ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවී ඇති අතර අපනයනකරුවන්ට බෙදාහැරීමේ මිල ඉහළ නැංවීමට පහසුකම් සලසා ඇත. ආරම්භ කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම් පහත පරිදි සාරාංශගත කරනු ලැබේ.

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ උපදෙස් ලබා ගනිමින් සිලෝන් තේවල සම්භවය හඳුනා ගැනීම සඳහා භූගෝලීය හඳුනා ගැනීම (G.I ව්‍යාපෘතිය) - ශ්‍රී ලංකා තේ මණ්ඩලය AFD වෙතින් අරමුදල් සපයා ගැනීමේ ක්‍රියාවලියක නියැලෙමින් සිටින අතර, ISOTOPE භාවිත කරමින් යෝරෝපා සංගමයේ G.I රෙගුලාසි යටතේ සිලෝන් තේ ලියාපදිංචි කිරීම සඳහා අවැසි තාක්ෂණික සහයෝගය ලබා ගැනීම උදෙසා UNIDO සහ CIRAD සමග තාක්ෂණික සහයෝගිතාවයෙන් කටයුතු කරමින් සිටී.
- සිංහ ලාංඡනය අළුත් කිරීම සහ සිංහ ලාංඡනය අලුතෙන් ලියාපදිංචි කිරීම මෙන්ම පකිස්ථානයේ සිංහ ලාංඡනය භාවිත කිරීමේ නීති කඩ කිරීම් හඳුනාගෙන ඒ සඳහා අවැසි පියවර ගැනීම, මෙහෙවරට හා නිත්‍යානුකූල බවට අදාළ ව විදේශීය වෙළඳපොල තුළ සිලෝන් තේ නාමය ව්‍යාජ්‍ය කිරීම හා නීති කඩ කිරීම් පාලනය කිරීම සහ අපනයනකරුවන්ට ඕසෝන් ලාංඡනය සහ පී.අයි ලාංඡනය භාවිත කිරීමට බලය ලබා දීම.
- චීනය තුළ මාර්ගගත හා මාර්ග අපගත ක්‍රමවේද ඔස්සේ පිරිසිදු සිලෝන් තේ අලෙවිය සඳහා ෆුජියන් ස්ටාර් චයිනා ජාත්‍යන්තර වෙළඳ සමාගම සමග අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත.
- ඉරානය සමග "තෙල් ණය සඳහා තේ පියවීමේ යාන්ත්‍රණය" උදෙසා ඉලක්ක සැකසීම සහ ඉරානය සමග ගිවිසුම අත්සන් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම.
- 2020 දෙසැම්බර් සිට 2021 අප්‍රේල් දක්වා රටවල් 12ක කළු තේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමට නියමිතය (රුසියාව / යුක්‍රේනය / ඕස්ට්‍රේලියාව / ඇමරිකා එක්සත් ජනපදය / චිලි / ජපානය / චීනය / ජර්මනිය / ඉරානය / තුර්කිය / සෞදි අරාබිය / එක්සත් අරාබි එමීර් රාජ්‍යය). රුසියාවේ සහ යුක්‍රේනයේ ගෝලීය දැන්වීම් ප්‍රචාරණ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම.
- නිලධාරී වශයෙන් ලබා දෙන තේ සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය බෙදා හැරීම (කුවේටයේ කියුරියෝසිටි හෝටලයේදී "ශ්‍රී ලාංකික රාත්‍රිය"), මෙල්බර්න් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පවත්වන ලද ජාත්‍යන්තර තේ සැමරුම් උත්සවය, අනෙකුත් ආයතන සමග ඒකාබද්ධ ප්‍රවර්ධන වැඩ සටහන් - 2020 වසර සඳහා NCE අපනයනකරුවන්ගේ සම්මාන, ප්‍රවර්ධන කටයුතු සඳහා සිලෝන් තේ දූත කාර්යාලවලට යැවීම.

ඒ අනුව, ඉදිරි වර්ෂය සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 1.40 ක අපනයන ආදායමක් ලබා ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර තේ කර්මාන්තය සඳහා කාර්ය සාධන ඉලක්ක අපි සකස් කර ඇත්තෙමු.

සාම්ප්‍රදායික වැවිලි ආර්ථිකයේ සිට හරිත සමාජ-ආර්ථික රටාවකට රාජ්‍ය ප්‍රතිපත්ති මාරුවීම

දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් ලබා දෙමින් සහ පසෙහි සාරවත් බව සහ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නංවමින් සාම්ප්‍රදායික වැවිලි ආර්ථිකය හරිත සමාජ-ආර්ථික රටාවක් බවට පරිවර්තනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයත් සමඟ, තේ වගා කරන්නන් හට එන්. පී. කේ පෝෂ්‍ය පදාර්ථ ලබා දීම අභියෝගයක් වී ඇත. එයට හේතුව වන්නේ, සමබර ලෙස පෝෂ්‍ය පදාර්ථ කළමනාකරණ කිරීමේ ක්‍රම සහ පසෙහි සාරවත්බව කළමනාකරණය කිරීම් උපාය මාර්ගයන් අනුගමනය නොකර කොටස්කරුවන් අධික ලෙස රසායනික පොහොර භාවිත කිරීම සහ අනවශ්‍ය ලෙස ඒ මත යැපීම යි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, වගා කරන ලද බිම් ප්‍රමාණයේ සහ රසායනික පොහොර භාවිතයේ ඉහළ යාම යන සාධක නොතකා ජාතික තේ නිෂ්පාදනය ක්‍රමයෙන් පහත හෙළමින් පසුගිය වසර ගණනාව තුළ පසෙහි ගුණාත්මකබව අඩු වී ඇත. කෘත්‍රිම පොහොර හා කෘෂි රසායනික ආනයනය සීමා කිරීමට සහ තහනම් කිරීමට මෙන්ම තේ වගාව සඳහා කාබනික/ජෛව පොහොර නිෂ්පාදනය සඳහා දිරිමත් කිරීමට රජය ගත් තීරණයට සමගාමීව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඉදිරි 2021 වසර තුළදී වැඩ සටහන් රාශියක් සිදු කිරීමට නියමිතව ඇත.

නිගමනය

2020 වර්ෂයේ සාක්ෂාත් කරගත් සාර්ථකත්වය උදෙසා ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍ය සහ වැවිලි අමාත්‍යාංශයේ ලේකම් සහ ඔහුගේ කණ්ඩායම, සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් හා කාර්ය මණ්ඩලයේ ඉමහත් ප්‍රයත්නය හා දායකත්වය අතිශයින් අගය කරන්නෙමු.

තේ සඳහා අගය එකතු කිරීමේ චක්‍රයේ සිටින ගොවීන්ගේ සිට තේ නෙලන්නන්, නිෂ්පාදකයින්, තැරැව්කරුවන් සහ අපනයනකරුවන්/ වෙළඳ නාම අලෙවිකරුවන් දක්වා සහ රජයේ නියාමකයින්/ පහසුකම් සපයන්නන් දක්වා ගෝලීය වටිනාකම් දාමයේ ක්‍රියාකාරීන් සඳහා නිසි පිළිගැනීමක් ලබා දිය යුතු ය. කර්මාන්තයේ පැවැත්ම සහ සාර්ථකත්වය උදෙසා වටිනාකම් දාමය පුරාවට පාර්ශවකරුවන්ගේ කැපවීම ප්‍රශංසනීය වේ. සාර්ථක වර්ෂ අවසානයක දී එකී සියලු දෙනාගේම සහයෝගය ඉහලින් අගය කරන අතර ඉදිරි වසරවලදීත් තේ කර්මාන්තයේ සියළුම පාර්ශවකරුවන්ට නිර්හිතව හා අභිමානයෙන් කථා කිරීමට මෙන්ම තිරසාර සාර්ථකත්වයක් විඳහා දැක්වීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරමි.

ජයම්පති මොල්ලිගොඩ
සභාපති
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මූලික සංඛ්‍යාත්මක දර්ශක

වර්ගය	ඒකකය	2018	2019	2020	විචලනය(%) 2019Vs 2020
තේ නිෂ්පාදනය					
සමස්ථ තේ නිෂ්පාදනය	කි. ග්‍රෑ මිලියන	303.94	300.12	278.85	(7.09)
උන්නතාංශය අනුව වර්ගීකරණය					
උඩරට	කි. ග්‍රෑ මිලියන	64.97	63.05	62.24	(1.28)
මැදරට	කි. ග්‍රෑ මිලියන	47.13	47.17	46.73	(0.93)
පහතරට	කි. ග්‍රෑ මිලියන	191.84	189.90	169.88	(10.54)
සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය					
සාම්ප්‍රදායික (ඉපෙව, ඇතුළුව)	කි. ග්‍රෑ මිලියන	277.33	273.89	252.72	(7.73)
සී.ටී.සී. තේ	කි. ග්‍රෑ මිලියන	24.02	23.59	24.10	2.16
හරිත තේ	කි. ග්‍රෑ මිලියන	2.60	2.64	2.03	(23.19)
ඉහත නිෂ්පාදන දත්ත සඳහා ක්ෂණික තේ අඩංගු නැත.					
ක්ෂණික තේ නිෂ්පාදනය	කි. ග්‍රෑ මිලියන	3.08	4.3	3.1	(29.62)
තේ අලෙවිය (රාජ්‍ය, පෞද්ගලික සහ සෘජු අලෙවිය ඇතුළුව)					
සමස්ථ තේ අලෙවිය	කි. ග්‍රෑ මිලියන	291.31	301.92	268.24	(11.16)
උඩරට	කි. ග්‍රෑ මිලියන	57.28	59.97	56.46	(5.85)
මැදරට	කි. ග්‍රෑ මිලියන	48.68	52.14	48.05	(7.84)
පහතරට	කි. ග්‍රෑ මිලියන	185.34	189.81	163.72	(13.74)
සමස්ථ තේ අලෙවි මිල		581.93	545.02	628.21	15.26
උඩරට	රු./කි. ග්‍රෑ	571.81	509.40	580.90	14.04
මැදරට	රු./කි. ග්‍රෑ	520.87	470.96	553.94	17.62
පහතරට	රු./කි. ග්‍රෑ	601.10	576.62	666.32	15.56
තේ අපනයනය					
තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයන හැර)	කි. ග්‍රෑ මිලියන	271.80	283.00	256.58	(9.34)
බාණ්ඩය අනුව අපනයන ප්‍රමාණය					
කළු තේ	කි. ග්‍රෑ මිලියන	266.90	277.53	251.78	(9.28)
හරිත තේ	කි. ග්‍රෑ මිලියන	2.40	2.27	1.99	(12.47)
ක්ෂණික තේ	කි. ග්‍රෑ මිලියන	2.50	3.04	2.81	(7.55)
තේ අපනයනය වටිනාකම (ප්‍රති අපනයන හැර)	රු.බිලියන	220.25	227.00	218.80	(3.61)
බාණ්ඩය අනුව අපනයන ආදායම					
කළු තේ	රු.බිලියන	212.95	219.35	210.62	(3.98)
හරිත තේ	රු.බිලියන	4.03	4.41	4.11	(6.85)
ක්ෂණික තේ	රු.බිලියන	3.27	4.12	4.07	(1.30)
සමස්ත තේ අපනයන ප්‍රමාණය	කි. ග්‍රෑ මිලියන	282.40	292.66	265.57	(9.26)
සමස්ත තේ අපනයන වටිනාකම	රු.බිලියන	231.80	241.00	230.17	(4.49)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා රේගුව

1. සංස්ථාපිත පසුබිම

"1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29, 2006 අංක 44 සහ 2018 අංක 13 දරණ පනත් මගින් සංශෝධිත 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ තේ පාලන දෙපාර්තමේන්තුව - 1957 අංක 51 දරණ තේ පාලන පනත, තේ අපනයන කොමසාරිස් දෙපාර්තමේන්තුව - 1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනත, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය- 1925 තේ පර්යේෂණ ආඥාපනත සහ ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ මණ්ඩලය ඒකාබද්ධ කරමින් 1976 ජනවාරි 1වන දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. 1993 දී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය 1993 අංක 52 දරණ තේ පර්යේෂණ පනතේ කළමනාකරණය යටතට පත්විය. ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමාන නීති හා රෙගුලාසි හැඩගස්වා ගැනීමේ අවශ්‍යතාවයන් මත පදනම්ව ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි හා තේ පාලන පනතෙහි සංශෝධනයන් සිදු වෙමින් පවතී."

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවීමට පෙර, පුද්ගලික අංශය විසින් ගෝලීය මට්ටමෙන් සිදු කරන ලද ශ්‍රී ලංකා තේ (සිලෝන් තේ) ප්‍රවර්ධනය කිරීමේ කාර්යය තේ ප්‍රවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවන ලදී. 1976 දී, තේ ප්‍රවර්ධන මණ්ඩලය පාර්ලිමේන්තුව මගින් අහෝසි කරන ලද අතර තේ ප්‍රවර්ධන මණ්ඩලය තේ කර්මාන්තයට ඇති බලතල සහිතව ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතට පත් කරන ලදී.

නියාමන ආයතනය ලෙස තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වේ. එනම්, නිෂ්පාදනය, වගා කිරීම වැඩි දියුණු කිරීම, නැවත සිටුවීම, පැරණි වතු පුනරුත්ථාපනය කිරීම, කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම ආදියයි. එයට අමතරව, තේ වතු කළමනාකරණයෙහි සහ දේශීය හා විදේශීය තේ නිෂ්පාදනයෙහි හා අලෙවිකරණයෙහි නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන පාලනය කිරීම මෙන්ම මෙහෙයවීම මෙමගින් සිදු කෙරේ. "ශ්‍රී ලංකා තේ වල ගුණාත්මකභාවය" පවත්වා ගැනීම සඳහා කර්මාන්තශාලාවේ සිට බෙදා හැරීමේ අවස්ථාව දක්වා වූ සමස්ත ක්‍රියාවලියම අධීක්ෂණය කර ඇගයීමට ලක් කර ඇති අතර පුර්ව බෙදාහැරීම, තැරැව්කරුවන්ගේ ගබඩාවන්, මිශ්‍ර කරන්නන් හා අපනයනකරුවන්ගේ ගබඩා, චිකුණුම් අවස්ථාවෙහි තේ වල ගුණාත්මක ප්‍රමිතීන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියා මාර්ග රාශියක් ආරම්භ කර තිබෙන අතර, මිශ්‍ර කිරීම සහ ගබඩා කිරීම සනිපාරක්ෂකව කිරීම පිළිබඳ උපදේශන සේවා සැපයීමද සිදු කෙරේ.

සංවර්ධන කාර්යයන් යටතේ, කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම සහ තේ නැවත වගා කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඵලදායිතාව ඉහළ නැංවීම යන කාරණා සඳහා සහනාධාර ලබා දීම යන කටයුතු සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහසුකම් සලසනු ලබයි. තවද, සංවේදක හා රසායනික විශ්ලේෂණයන් මගින් තේවල ගුණාත්මකභාවය සහතික කිරීම තේ සංවර්ධනය යටතේ පවතින තවත් ප්‍රධාන වගකීමක් වේ.

ගෝලීය වශයෙන් ශ්‍රී ලංකා තේ අලෙවිකරණය හා ප්‍රවර්ධනය කිරීම, තේ පිළිබඳ සංඛ්‍යාලේඛන එකතු කිරීම සහ අවශ්‍ය පැහැදිලි කිරීම් සිදු කිරීම, සැබෑ වෙළඳපොළවල නිපුණතාවය ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රමුඛ පෙලේ වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකා තේ ව්‍යාප්ත කිරීම හා ඉල්ලුමක් රඳවා ගැනීම ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් සිදු කෙරේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම හා ඒ සඳහා උපදෙස් ලබා දීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ. මූල්‍ය කටයුතු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මගින් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර විශේෂයෙන් එමගින් භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා නිර්දේශ සහ අනුමැතීන් ලබා දේ.

2. ව්‍යුහය සහ සිදු කළ ක්‍රියාකාරකම්



2.1 තේ කොමසාරිස් අංශය

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පත් කර ඇති තේ කොමසාරිස් වරයා ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. තේ කොමසාරිස් අංශය විසින් 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත අනුව තේ කර්මාන්තයේ සංවර්ධනය, නිෂ්පාදනය, අපහරණය හා අදාළ නියාමන සහ අධීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු පාලනය කරයි.

ගම්පොල, බණ්ඩාරවෙල, රත්නපුර, මාතර, බදුරලිය, ගාල්ල සහ නුවර එළිය යන ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශිය කාර්යාල 07ක් වෙතට තේ කොමසාරිස් අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත.

තේ කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා තේ ක්ෂේත්‍රයේ කටයුතු විධිමත් කිරීමේ වගකීම තේ කොමසාරිස් අංශය සතු වේ. කාර්යක්ෂමතාව ඇති කර ගැනීම සඳහා තේ කොමසාරිස් කොට්ඨාසයේ කටයුතු නියාමන, සංවර්ධන හා අපනයන යන ප්‍රධාන අංශ තුනක් (03) යටතේ සිදු කෙරේ.

තේ කොමසාරිස් අංශය තේ කර්මාන්තයේ අඛණ්ඩ පැවැත්ම උදෙසා පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි

- තේ නිෂ්පාදකයන් සහ කර්මාන්ත ශාලා ලියාපදිංචිය/බලපත්‍ර ලබාදීම සහ අලුත් කිරීම.
- හරිත තේ දළු වෙළෙන්දන් ලියාපදිංචිය සහ අධීක්ෂණය
- කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය සහ අධීක්ෂණය
- වෙන්දේසි අයිතිය සඳහා කසල තේ මධ්‍යස්ථාන ලියාපදිංචිය
- තේ නිෂ්පාදන ක්‍රියාවලිය, හරිත තේ වෙළෙන්දන් සහ කසළ තේ මධ්‍යස්ථාන සඳහා අධීක්ෂණ හා උපදේශන සේවා ලබා දීම .
- හරිත තේ දළුවල තත්වය ඉහළ දැමීම සඳහා සහ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තශාලා නවීකරණය සහ නැවත වගාව සඳහා සහනාධාර ලබාදීම (පවතින වගා බිමවල යලි වගා කිරීම සහ අලුතින්ම වගා බිම් ඇති කිරීම.
- කර්මාන්ත ශාලා සහ වෙළෙන්දන් මගින් දළු සැපයුම්කරුවන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම අධීක්ෂණය කිරීම.
- තේ කර්මාන්තශාලාවල හා ගබඩාවල මනා නිෂ්පාදන ක්‍රම පිළිබඳව අධීක්ෂණය
- තේ නිෂ්පාදනයට අදාළ සංඛ්‍යා දත්ත රැස් කිරීම හා අදාළ ආයතනවලට ඒවා ලබා දීම.
- තේ ක්ෂේත්‍රයේ අවභාවිතාවන් පාලනය කිරීම සඳහා තේ කර්මාන්තශාලාවල, වෙළෙඳුන්ගේ මධ්‍යස්ථානවල සහ කසළ තේ සැකසුම් මධ්‍යස්ථානවල විශේෂ විමර්ශන පැවැත්වීම.
- ශ්‍රී ලංකා තේ මණ්ඩල නිලධාරීන්ගෙන් හෝ පොලිසියෙන් ලද තේ සාම්පල පරීක්ෂණ සඳහා යොමු කිරීම.
- සාම්පල වාර්තාව අනුව අවශ්‍ය පියවර ගැනීම.
- අධිකරණ නඩු සම්බන්ධ බලය ඇති පොලිස් නිලධාරීන් වෙත ලිපි යැවීම.
- තේ බිම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ අලුත් තොරතුරු ලබා ගැනීම
- " ආදර්ශ තේ බිම" වැඩසටහන යටතේ තේ වගාකරුවන්ට (අක්කර 10ට වැඩි) සහනාධාර ලබා දීම
- තේ ඉඩම් සඳහා ග්ලයිපොස්පේට් අනුමත කිරීම.
- තේ තවාන් ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රියාත්මක කිරීම.
- තේ සඳහා අපනයන බලය ලබා දීම.
- තේ අපනයනයේ තත්ව ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම.

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වගන්තිය යටතේ සාදන ලද සහ තේ කොමසාරිස්වරයා වෙත පවරන ලද තේ බිම් නියාමන නියෝග පහතින් සඳහන්වේ.

(අ) 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (නිමි තේ පිරිසැකසුම සහ සනීපාරක්ෂක තත්ත්ව) නියෝගය .

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නැවත වගාව සහ කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර ක්‍රමය

2.1.1 මූලික ජයග්‍රහණ

- හෙක්ටයාර් 140.25ක් සඳහා රු. මිලියන 25.18ක තේ නැවත වගා කිරීමේ සහනාධාරය ලබා දුනි.
- කර්මාන්තශාලා 25ක් සඳහා රු.මිලියන 14.24ක කර්මාන්තශාලා නවීකරණ සහනාධාරයක් ලබා දුනි.
- තේ වවන්නන් හට සනනාධාර ලබා දීම සඳහා ආදර්ශ තේ ඉඩම් ව්‍යාප්තිය ආරම්භ කරන ලදී (අක්කර 10ට වැඩි).
- යටතේ රු. මිලියන 9.1ක් ඉඩම් (පුද්ගලයන්) 24 දෙනෙකු සඳහා ලබා දෙන ලදී.
- තේ ඉඩම් ලියාපදිංචියට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කිරීම (තොරතුරු යාවත්කාලීන කිරීම)
- තේ ඉඩම් සඳහා ග්ලයිපොස්පේට් (glyphosate) අනුමත කිරීම.
- තේ තවාන් සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කිරීම හා තවාන් 27ක් සඳහා රු. මිලියන 13.85ක් ලබා දීම.

2.1.2 නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස් අංශය විසින් තේ නිෂ්පාදන සහ එම නිෂ්පාදකයන් සතු ලියාපදිංචි කිරීමට තිබෙන කර්මාන්තශාලා සම්බන්ධ අනුමත තොරතුරු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. පනතට අනුව නිෂ්පාදකයකු ලෙස ලියාපදිංචි වීමට කිසියම් අයෙකු හිමිකම් ලබන්නේ ද යනවග තීරණය කිරීමට කොමසාරිස් අංශය ට බලය පවතී. සෑම නිෂ්පාදකයෙකුම තේ නිෂ්පාදනය සඳහා මෙන්ම කොළඹ වෙන්දේසිය ඔස්සේ තේ විකිණීම සඳහා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි විය යුතුයි.

ගුණාත්මක තත්වයේ තේ නිෂ්පාදනයට හිතකරවන පරිදි තම ගොඩනැගිලි, උපකරණ සහ මෙහෙයුම් ක්‍රම ක්‍රියාත්මක වන්නේ ද යනවග සහතික කරලීම සඳහා මෙන්ම කර්මාන්ත ශාලාව විසින් නිපදවන තේවල ගුණාත්මක බව අධීක්ෂණය කිරීමේදී සහාය වීම, කසල තේ බැහැර කිරීම පාලනය කිරීම සහ සාධාරණ මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසාදීම සඳහා සියලුම නිමි තේ නිෂ්පාදන කර්මාන්තශාලා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

නිෂ්පාදන ක්‍රියාවලිය වනුව ලියාපදිංචි තේ කර්මාන්තශාලා ආකාර 04කට වර්ග කළ හැකිය. සාම්ප්‍රදායක, CTC, හරිත සහ අතින් සාදන ලද ආදී වශයෙනි. තේ කොමසාරිස් විසින් සාදන ලද TC05 ආකෘතිය භාවිත කර සෑම ලියාපදිංචි තේ නිෂ්පාදකයෙකු විසින්ම තම නිෂ්පාදන පිළිබඳ දත්ත ඊළඟ මාසයේ පස්වන දිනට පෙර තේ කොමසාරිස් වෙත ලබා දිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම 1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි.

වගුව 2.1.1 මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

තත්වය	කර්මාන්තශාලා ගණන			
	ඉහල	මධ්‍යම	පහල	එකතුව
තම වත්තේ තේ දළු වලට සීමාවූ	65	18	11	94
තම තේ දළු සහ මිලදීගත් තේ දළු:-				
අ) මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා අඩු නම් තේ දළු	14	25	98	137
ආ) මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා වැඩි නම් තේ දළු	57	31	11	99
මිලදීගත් තේ දළු වලින් පමණක්	08	39	260	307
ක්‍රියාත්මක වන ලියාපදිංචි තේ කර්මාන්තශාලා	170	40	427	637
ක්‍රියාත්මක නොවන ලියාපදිංචි තේ කර්මාන්තශාලා	24	58	97	179
ලියාපදිංචි මුළු තේ කර්මාන්තශාලා සංඛ්‍යාව	194	98	524	816

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.1.3 මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවිය හැකි සාධාරණ මිල ගණන්

තේ පාලන පනතේ විධිවිධාන වලට අනුව මිලදී ගන්නා තේ දළුවලින් තම නිෂ්පාදනයන් කරනු ලබන කර්මාන්තශාලා තේ කොමසාරිස් විසින් නියම කරනු ලබන මිල ගණන් මත පදනම්ව එම කර්මාන්ත ශාලා විසින් නිපදවන තේවල නියමිත මිල පිළිබඳව අවධානය යොමුකරමින් මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවීම් කළ යුතුය. කර්මාන්ත ශාලා මගින් අමු තේ දළු වෙළෙන්දන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීමේදී එක් එක් කර්මාන්තශාලාවල මාසික ශුද්ධ විකුණුම් සාමාන්‍යය මත පදනම් ව තීරණය කරනු ලබයි.

නිමි තේ වලින් ලබන ඉපැයීම් දළු සැපයුම්කරුවන් සහ කර්මාන්ත ශාලා අතර 68:32 අනුපාතය ට අනුව බෙදිය යුතුයි. කර්මාන්තශාලා විකුණුම් සාමාන්‍යය මාසික උන්නතාංශ සාමාන්‍යය ඉක්මවන්නේ නම්, එම වැඩිවූ ආදායම 50:50 අනුපාතයට බෙදනු ලබයි. නිමි තේ වලට අමු දළු වලින් 21.5%ක නිපැයුම් අනුපාතයක් මත පදනම් ව මිල සූත්‍රය ගොඩ නගනු ලැබේ.

2.1.3.1 ප්‍රමාද වූ ගෙවීම්

සමාලෝචිත වර්ෂය තුළ 2019 දෙසැම්බර් 31 දිනට හරිත තේ දළු සපයන්නන් සඳහා ගෙවීමට තිබූ මුළු අගය වුයේ රුපියල් මිලියන 541කි. 2020 වර්ෂයේ දී, තේ කොමසාරිස් අංශය මැදිහත්වීමෙන් රුපියල් මිලියන 56ක් අය කරගෙන තේ දළු සපයන්නන් වෙත ගෙවන ලදී. ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් තව තවත් ප්‍රමාද ගෙවීම් එකතු වීම නතර විය. හරිත තේ දළු සඳහා සාධාරණ මිලක් පැවතිය දී යම් කර්මාන්තශාලාවක් ප්‍රමාද ගෙවීම් සහිත කර්මාන්තශාලාවක් ලෙස හඳුනා ගනී නම්, එකී කර්මාන්තශාලාවට අවවාද කරනු ලබන අතර ප්‍රමාද වූ ගාස්තු නොගෙවන්නේ නම්, අදාළ කර්මාන්තශාලාවේ ලියාපදිංචිය අත්හිටුවීම, අහෝසි කිරීම හෝ 1993 සංශෝධිත තේ මණ්ඩල පනත අනුව තැරැව්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. එවැනි කර්මන්තශාවල ලියාපදිංචිය නැවත ලබා දීම සලකා බලනු ලබන්නේ ගෙවීමට ඇති අදාළ ගාස්තු ගෙවා නිම කළ පසුවය.

වගුව 2.1.2 ගෙවීමට ඇති ගාස්තු පිළිබඳ විස්තරය (රුපියල්)

ප්‍රදේශය	මුදල (රුපියල්)			2020.12.31 දිනට කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය (රු)	ගෙවිය යුතු මුදල (රු)	
	2020 .01 .01 දිනට මුදල	2020 වර්ෂයේදී එකතුවූ මුදල	පියවාගත් සහ ගෙවන ලද මුදල		ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින්	වසා දමන ලද කර්මාන්තශාලා වලින්
බදුරලිය	47,868,679.5	-	-	47,868,679.5	4,919,055.0	42,949,625.5
බණ්ඩාරවෙල	1,003,982.4	22,018,428.1	-	23,022,410.5	18,485,078.5	4,537,332.0
ගාල්ල	103,865,461.0	54,850,980.1	20,065,458.2	138,650,982.9	89,220,196.3	49,430,786.6
ගම්පොල	86,820,951.1	30,350,426.6	1,807,800.9	115,363,576.8	100,621,212.1	14,742,364.7
මාතර	18,037,735.0	41,082,192.3	6,322,808.4	52,797,118.6	50,264,477.0	2,532,641.6
නුවර එළිය	28,454,288.7	245,969.5	658,860.0	28,041,398.1	5,502,590.6	22,538,807.5
රත්නපුර	255,250,277.7	126,350,400.3	27,072,491.8	354,528,185.2	182,352,912.1	172,175,273.1
එකතුව	541,301,374.9	274,898,396.8	55,927,419.0	760,272,352.5	451,365,521.4	308,906,831.0

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.1.4 තේ දළුවල තත්ත්ව පාලනය

නිමි තේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය වන්නේ තේ දළු හෙයින්, මිල දී ගත් තේ දළු යොදා ගනිමින් තේ නිෂ්පාදනය කරන අවස්ථාවලදී තේ දළු වල තත්ව පාලනය ඉතාමත් වැදගත් වේ. උසස් තත්වයේ තේ දළු යොදා ගනිමින් තේ නිෂ්පාදනය කරන්නේ නම් නිමි තේ වල තත්වය උසස්වන අතර කුඩා තේ වතු හිමියන් සහ තේ නිෂ්පාදකයන් යන දෙපාර්ශවයටම ඉහළ ප්‍රතිලාබ ලැබේ.

අමු තේ දළුවල තත්ත්වය සම්බන්ධයෙන් අදාළව ගැසට් නිවේදනයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2010 දෙසැම්බර් 14 වැනි දින පළකර තිබේ. නිමි තේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය වන්නේ තේ දළු ය. තේ කොමසාරිස් අංශය මගින් තේ දළුවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

අ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම.

ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා “B leaf 60” වැඩසටහන

ඇ) උත්සව සමයේදී බෝග කළමනාකරණය කිරීමේ වැඩසටහන

ඈ)" ආදර්ශ තේ බිම්" ව්‍යාපෘතිය

ඉ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය

ඊ) තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන

උ) තේ තවාන් සඳහා සහනාධාර ව්‍යාපෘතිය

අ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම

තේ පාලන පනතට අනුව, තේ දළු වෙළඳාමේ යෙදීම සඳහා තේ කොමසාරිස් අංශයෙන් වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට සිදු වේ. ලියාපදිංචි සෑම තේ වෙළෙන්දෙකුම තේ කොමසාරිස් අංශය මගින් නියාමනය කරනු ලැබේ.

වගුව 2.1.3(2020) වසර තුළදී තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව

ප්‍රදේශය	2020.01.01 දිනට බලපත්‍ර ලබා දුන් වෙළෙඳුන්	බලපත්‍ර අලුත් කිරීම	නිකුත් කරන ලද නව බලපත්‍ර	2020.12.31 දිනට තේ දළු වෙළඳාම සඳහා ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව
බදුරලිය	243	223	31	254
බණ්ඩාරවෙල	163	160	16	176
ගාල්ල	275	252	15	267
ගම්පොල	181	165	05	170
මාතර	275	252	20	272
නුවර එළිය	100	88	06	94
රත්නපුර	498	436	62	498
එකතුව	1735	1576	155	1731

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා "B leaf 60" වැඩසටහන

දළු නෙළීමේ ප්‍රමිති සහ ප්‍රවාහනය කිරීමේ ප්‍රමිති වැඩිදියුණු කිරීම මගින් පසු අස්වනු හානි අවමකර ගැනීමෙන් දළුවල ගුණාත්මක බව ඉහළනැන්වීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතී. මෙම වැඩසටහන ආරම්භයේදි තේ දළුවල ප්‍රමිතිය පැවතියේ හොඳම දළු 33%, හොඳම තත්ත්වයට වඩා අඩු 32% සහ බාල තේ දළු 35% වශයෙනි. නමුත් වර්තමාන තේ දළුවල ප්‍රමිතිය වන්නේ හොඳම දළු 34% , හොඳම තත්ත්වයට වඩා අඩු 20% සහ බාල තේ දළු 56% වශයෙනි. ක්ෂේත්‍රය තුළ දී හොඳම තේ දළු ප්‍රමිතිය අවම වශයෙන් 60% ක මට්ටමක පවත්වා ගැනීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී

.වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා තේ දළු හැසිරවීම හා ප්‍රවාහනය සම්බන්ධ රෙගුලාසි පැනවීම හා පාර්ශවකරුවන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදී උපායමාර්ග මේ වන විටත් ක්‍රියාත්මක කර ඇත.

ඇ) උත්සව සමයේදී බොග කළමනාකරණය කිරීමේ වැඩසටහන

උත්සව සමයේ දි දීර්ඝ කාලයක් තේ කර්මාන්තශාලා වසා තැබීම හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම කරගැනීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙය 2005 වසරේ දී ආරම්භ කළ අතර ඒ යටතේ විවිධ ක්‍රියාකාරකම් හදුන්වා දෙමින් අස්වනු හානිය මුළුමනින්ම පාහේ පාලනය කිරීමට තේ කොමසාරිස් අංශයට හැකි වී ඇත.

වගුව 2.1.4: ප්‍රාදේශිය වශයෙන් පවතින තේ දළු ප්‍රමිතීන්

ප්‍රදේශය	2020		
	වඩාත්ම හොඳ	වඩාත්ම හොඳ මට්ටමට වඩා පහල	බාල තත්වයේ
බදුරලිය	42	24	34
බණ්ඩාරවෙල	24	19	57
ගාල්ල	42	20	38
ගම්පොල	28	21	51
මාතර	41	15	44
නුවරඑළිය	27	20	53
රත්නපුර	36	24	40

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඇ) "ආදර්ශ තේ බිම්" ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ භාණ්ඩාගාරය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් වෙන්කර තිබේ. මෙම ව්‍යාපෘතිය මෙම වසරේ දී තව දුරටත් සාර්ථකව ක්‍රියාත්මක කළ අතර ඉඩම් 24ක් සඳහා මේ යටතේ රුපියල් මිලියන 9ක සහනාධාර සපයා ඇත.

පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම වැඩසටහන සකස්කර තිබේ.

- ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රය තුළ අර්ධ යාන්ත්‍රික තිරසාර තේ වගාවන් ප්‍රවර්ධනය කිරීම. (මෙය ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ)
- තේ ක්ෂේත්‍රය තුළ තේ ඉඩම් හා ශ්‍රම ඵලදායිතාවය ඉහල නැංවීම.
- වසර පුරාවට නිරන්තර හා ස්ථාවර අස්වැන්නක් ලබා ගැනීම.
- තේ වගාවේ ප්‍රශස්ත ආර්ථිකමය ආයු කාලට වැඩි කිරීම.
- නිෂ්පාදන පිරිවැය අඩු කිරීම. (දළු නෙලීමේ පිරිවැය 60% කින් අඩු කිරීමට බලාපොරොත්තු වේ)
- තේ දළුවල ප්‍රමිතිය ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගැනීම.
- සහනිකලාභී බවට පත්වීම සඳහා මනා කෘෂිකාර්මික භාවිතාවන් තේ වගාවන් තුළට හඳුන්වා දීම.

  උදා: වැසි වනාන්තර සහයෝගිතා සහතිකය

වගුව 2.1.5: ආදර්ශ තේ බිම් සඳහා සහනාධාර ගෙවීම්

ප්‍රදේශය	ආදර්ශ තේ බිම් සහනාධාර යෝජනා ක්‍රමය			
	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවීම් සිදු කළ ඉඩම් ප්‍රමාණය	ගෙවූ මුදල (රු.)	කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
බදුරලිය	03	02	600,000	03
බණ්ඩාරවෙල	03	-	-	03
ගාල්ල	4	-	-	65
ගම්පොල	5	4	1,800,000	14
මාතර	5	4	1,250,000	73
නුවර එළිය	5	12	4,550,000	15
රත්නපුර	6	2	900,000	12
එකතුව	30	24	9,100,000	185

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඉ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය

දේශීය අරමුදල් යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාරය විසින් අරමුදල් වෙන්කර ඇත. වර්ෂය තුළ දී තේ නැවත වගා කිරීමේ සහනාධාර සඳහා ඉහත මුදල් භාවිත කෙරේ. ඒ අනුව, වාණිජ්‍ය හා පුද්ගලික ක්ෂේත්‍රයේ අක්කර 10ට වැඩි වතු සඳහා සහනාධාර ලබා දෙමින් පවතී. තේ නැවත වගා කිරීම, අලුතින් වගා කිරීම හා වගා බිම්වල අඩු පාඩු සිටුවීම සඳහා සහනාධාර සැපයීම අරමුණ වේ.

යෝජනා ක්‍රමයේ අරමුණු පහත පරිදි වේ.

(i) තේ නිෂ්පාදනය ඉහල නැංවීම.

(ii) තේ බිම්වල ඵලදායිතාවය වැඩි කිරීම.

(iii) තේ නැවත වගා කිරීමේ ජාතික අනුපාතය 3% ක ප්‍රමාණයක පවත්වා ගැනීම.

වගුව 2.1.6: නැවත වගා කිරීමේ / අඩුපාඩු සිටුවීමේ සහනාධාර යෝජනා ක්‍රමය

ප්‍රදේශය	නැවත වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය			
	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)	ප්‍රමාණය (හෙක්)	කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
බදුරලිය	28	1,540,975	8.2	62
බණ්ඩාරවෙල	33	-	-	45
ගාල්ල	03	3,182,200	14.8	265
ගම්පොල	48	6,383,900	37.1	197
මාතර	04	7,092,050	41.1	35
නුවර එළිය	29	5,642,500	28.7	87
රත්නපුර	55	1,335,950	10.3	102
එකතුව	200	25,177,575	140.3	793

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඊ) තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ දිවයිනේ සියලුම තේ ඉඩම් ලියාපදිංචි කිරීමට සැලසුම් කෙරේ. තේ ඉඩම් සම්බන්ධ සියලු තොරතුරු ක්‍රමවත් පිළිවෙලකට පරිගණක ගත කරමින් මෘදුකාංග වැඩසටහනකට ඇතුළත් කරන ලදී.

ඇ) තේ තවාන් සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

තේ මණ්ඩල අරමුදල්වලින් අයවැය ප්‍රතිපාදනයක් 2020 වසර සඳහා සම්මත තේ තවාන් පිහිටුවීමට වාණිජ්‍ය අංශය සහ අක්කර 10ට වැඩි තේ වතු හිමියන් සඳහා සහනාධාර ගෙවීමට භාවිත කරන ලදී. එකවර අවම වශයෙන් තේ පැල 100,000ක් පිහිටුවීමට අදහස් කරන, ඉහළ සෙවණක් සහ විසුරුම් ජල බින්දු වාරි තාක්ෂණ පද්ධතියක් මෙන්ම ස්ථිර ව්‍යුහයක් සහිත තවාන් පමණක් මෙම සහනාධාර ක්‍රමය මගින් ආවරණය කරයි. අවම වශයෙන් තේ පැල 100,000ක ප්‍රමාණයේ තවානක් සඳහා රුපියල් 1,500,000.00ක සහනාධාරයක් හිමි වේ. අනුමත තවාන් අවම වශයෙන් වසර 3ක් පැවතිය යුතු අතර සහනාධාරය නිකුත් කිරීමට පෙර තවාන් හිමියා, වතු හිමියා හෝ ප්‍රාදේශීය වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කළ යුතුය. සියලුම තවාන් කටයුතු ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය.

වගුව 2.1.7 : තේ තවාන් සඳහා සහනාධාර ගෙවීම්

ප්‍රදේශය	තේ තවාන් සඳහා සහනාධාර යෝජනාක්‍රමය	
	ගෙවීම් කළ තවාන් ගණන	ගෙවන ලද මුදල (රු)
බදුරලිය	-	-
බණ්ඩාරවෙල	01	600,000
ගාල්ල	03	1,550,000
ගම්පොල	-	-
මාතර	13	4,200,000
නුවර එළිය	-	-
රත්නපුර	10	7500,000
එකතුව	27	13,850,000

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.1.5 තත්වය ඉහල නැංවීමේ ක්‍රියාකාරකම්

ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙහෙයුම් ක්‍රමවේද ආදිය සුදුසු තත්වයේ පැවතීම නිම් තේ වල උසස් තත්ත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. උසස් තත්ත්වයේ නිම් තේ නිෂ්පාදනය සඳහා ඉහත සඳහන් කළ තත්වයන් හිතකර නොවන්නේ නම් එවැනි කර්මාන්තශාලා ලියාපදිංචිය අත්හිටුවීමට මෙන්ම අවලංගු කිරීමට 1957 අංක 51 දරණ තේ පාලන පනත ප්‍රකාරව තේ කොමසාරිස් වරයාට බලය ඇත. තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා තේ පාලන පනත මගින් තේ කොමසාරිස් අංශය ට බලය ලබාදෙන අතර නිම් තේවල සහ දළුවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති නිර්මාණය කර ක්‍රියාත්මක කරනු ලබයි.

අ) කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය

ආ) තේ කර්මාන්තශාලා සහ ගුදම්වල මනා නිෂ්පාදන පිළිවෙත් ස්ථාපිත කිරීම

ඇ) හිදිසි අධීක්ෂණ ක්‍රම (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)

ඈ) පහළ ශුද්ධ චිකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය

ඉ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම හා කසල තේ මධ්‍යස්ථානවල මනා නිෂ්පාදන පිළිවෙත් වර්ධනය කිරීම

ඊ) කසළ තේ පිරිසකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය ලබා දීම

අ) කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාරය විසින් දේශීය අරමුදල් යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කර ඇත. මෙම වෙන්කළ මුදල් කර්මාන්තශාලා නවීකරණ යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ තේ කර්මාන්තශාලා වෙනුවෙන් උපයෝගි කරගනු ලබයි. යෝජනා ක්‍රමයේ අරමුණු පහත පරිදි වේ.

(i) තේ නිෂ්පාදනය වැඩි කිරීම

(ii) නිම් තේවල තත්වය ඉහල නැංවීම

(iii) තේ කර්මාන්තයට නව තාක්ෂණය හඳුන්වා දීම

(iv) තේ කර්මාන්තශාලා නවීකරණය කිරීම

වගුව 2.1.8: කර්මාන්තශාලා නවීකරණය සඳහා සහනාධාර ගෙවීම.

ප්‍රදේශය	ලද අයදුම්පත් සංඛ්‍යාව	ගෙවන ලද කර්මාන්තශාලා ගණන	ගෙවූ මුදල (රු)	සිදු කළ පරීක්ෂණ ගණන
බදුරලිය	03	04	2,593,333.3	17
බණ්ඩාරවෙල	07	-	-	19
ගාල්ල	01	04	1,548,333.0	08
ගම්පොල	03	03	1,413,739.0	10
රත්නපුර	12	05	2,508,333.0	16
මාතර	02	09	6,176,705.0	02
නුවර එළිය	-	-	-	-
එකතුව	28	25	14,240,443.3	72

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ආ. තේ කර්මාන්තශාලාවල මනා නිෂ්පාදන පිළිවෙත් (GPM) ස්ථාපිත කිරීම

මෙම වැඩසටහන යටතේ පරීක්ෂා කිරීමේ අයිතම 187 කින් සමන්විත කලින් තීරණය කර ගන්නා ලද පිරික්සුම් ලැයිස්තුවක් උපයෝගී කරගනිමින් තක්සේරු කිරීම් 611ක් සිදු කළ අතර ඒ අනුව තේ නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වගුව 2.1.9: ප්‍රාදේශීය වශයෙන් තේ කර්මාන්තශාලාවල මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව

ප්‍රදේශය	මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව	කර්මාන්තශාලා ශ්‍රේණිගත කිරීම			
		විශිෂ්ටය	හොඳයි	සාමාන්‍යයි	දුර්වලයි
බදුරලිය	108	27	20	2	0
බණ්ඩාරවෙල	96	23	35	1	0
ගාල්ල	147	51	31	1	0
ගම්පොල	84	46	34	4	0
මාතර	35	42	50	3	0
නුවර එළිය	52	21	16	15	0
රත්නපුර	89	38	40	11	0
එකතුව	611	248	226	37	0

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

දුර්වල තත්වයෙන් පවතින කර්මාන්තශාලාවලට තම ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අවසර නොදීමේ ප්‍රතිපත්තියක් 2019 වසරේ සිට තේ කොමසාරිස් අංශය විසින් අනුගමනය කරමින් සිටී.

ඇ) හදිසි අධීක්ෂණ ක්‍රමය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම)

තේ කර්මාන්තයේ අවහාවිතාවන් පාලනය කිරීම සඳහා කාර්ය කණ්ඩායම් මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් පවති. සහකාර තේ කොමසාරිස්ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් විසින් මෙහෙයුම් සිදු කරනු ලබයි. 2020 වසරේදී තේ කොමසාරිස් අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා හදිසි පිරික්සීම් 264ක් සිදුකර ඇත.

වගුව 2.1.10: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

ප්‍රදේශය	සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව
බදුරලිය	50
බණ්ඩාරවෙල	52
ගාල්ල	39
ගම්පොල	17
මාතර	41
නුවර එළිය	29
රත්නපුර	36
එකතුව	264

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඈ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය

ශුද්ධ විකුණුම් සාමාන්‍යය නමැති ඉණිමගෙහි පහලම ගරාදියෙහි සිටින තේ කර්මාන්ත ශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ තේ දළුවල ප්‍රමිතිය සහ තේ නිෂ්පාදනයේ ප්‍රමිතිය වැඩිකිරීම මගින් එවැනි කර්මාන්තශාලා වල ශුද්ධ විකුණුම් සාමාන්‍ය මට්ටම ඉහළට ගැනීමයි. මෙම වැඩසටහන් යටතේ තේ කර්මාන්තශාලා ආකාර හතරකට වර්ගීකරණය කෙරේ. එනම්, දුර්වල, සාමාන්‍ය, හොඳ, විශිෂ්ට ආදී වශයෙනි. ස්ථාපිත ප්‍රතිපත්තියට අනුව, 2019 සිට ක්ෂේත්‍රය තුළ දුර්වල කර්මාන්තශාලා පැවතිය නොහැක.

ඉ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන වල මනා නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම

කසල තේ පිරිසැකසීම යනු විනාශ නොකළ කසල තේ වලින් භාවිත කළ හැකි තේ වෙන් කර ගැනීමේ ක්‍රියාවලියයි. කසල තේ අළෙවි කරන සෑම වෙළෙන්දෙකුම කසළ තේ සැකසුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය. කසල තේ පිරිසැකසීමේ මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම1957 තේ පාලන පනතේ අංක 51 ප්‍රකාරව ආරම්භ කර තිබේ. කසළ තේ මධ්‍යස්ථානවල ප්‍රමිතීන් ඉහල නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් සැපයීමේ අරමුණෙන් මනා නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

වගුව 2.1.11: කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ගණන සහ 2020 වර්ෂය සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන

ප්‍රදේශය	2020.01.01 දින වන විට ලියාපදිංචි සැකසුම්කරුවන්	වර්ෂය තුළ අලුත් කිරීම	වර්ෂය තුළ අලුතින් නිකුත් කිරීම	2020.12.31 දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව	2020.12.31 දිනට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර මගින් ළඳුන් විසින් මලදී ගන්නා ලද තේ ප්‍රමාණය (කිලෝ)වෙ
බදුරලිය	9	10	01	11	675	3,306,724
බණ්ඩාරවෙල	1	01	0	01	1,116	4,504,089
ගාල්ල	21	01	15	16	640	2,094,912
ගම්පොල	262	176	08	184	2,014	9,730,564
මාතර	9	01	08	09	528	1,823,403
නුවර එළිය	1	05	-	05	1,682	10624972
රත්නපුර	2	03	0	03	1,096	4,769,463
එකතුව	305	197	32	229	7,751	36,854,127

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඊ) කසල තේ සකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය

කසල තේ සැකසුම්කරුවන් හට වෙන්දේසි අයිතිවාසිකම් ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදයක් සැලසුම් කර ඇත. වෙන්දේසි අයිතිවාසිකම් අයදුම් කිරීම සඳහා, කසල තේ සැකසුම් මධ්‍යස්ථානය තුළ මනා නිෂ්පාදන භාවිතාවන් (GMP) පිළිබඳ ප්‍රමිතියෙන් 80%ක් තිබිය යුතුය. 2020 වසරේ දී, කසල තේ සැකසුම් මධ්‍යස්ථාන 20ක් සඳහා වෙන්දේසි අයිතිය ලබා දෙන ලදී. කසල තේ සැකසුම්කරුවන් හට වෙන්දේසි අයිතිවාසිකම් ප්‍රදානය කිරීමේ අනුමැතිය ලබා දීමේ අරමුණු පහත පරිදි වේ.

- කසල තේ සඳහා වෙළඳපොළ ලබා දීම
- කසල තේවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- කසල තේවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම
- කසල තේ වෙළඳපොලේ නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සහ ඒ සඳහා නීතිමය ක්‍රියා පටිපාටි සකස් කිරීම
- නිරපේක්ෂ කසල තේ බැහැර කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රියා පටිපාටියක් සකස් කිරීම

වගුව 2.1.12: ජාත්‍යන්තර සහතිකයෙන් පිදුම් ලද කර්මාන්තශාලා ගණන

ප්‍රදේශය	කර්මාන්තශාලා ගණන		
	HACCP සහතිකය	ISO 22000 සහතිකය	අනෙකුත් ජාත්‍යන්තර සහතිකකිරීම් (RA/CQC)
බදුරලිය	09	09	06
බණ්ඩාරවෙල	46	20	10
ගාල්ල	19	19	07
ගම්පොල	36	36	83
මාතර	07	21	07
නුවර එළිය	98	98	36
රත්නපුර	23	23	07
එකතුව	238	226	156

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ තවාන් ව්‍යාපෘතියේ විශේෂ අවස්ථා






ආදර්ශ තේ වගා ව්‍යාපෘතියේ විශේෂ අවස්ථා







2.2 තේ අපනයන අංශය

1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනතේ බලතල හා කාර්යන් සහ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පවතින රෙගුලාසි පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශය විසිනි. තේ අපනයන අංශය මගින් තේ අපනයනකරුවන්, තේ ඇසුරුම්කරුවන්, ගබඩාවන්, ආනයනකරුවන් හා තේ ඇසුරුම් වර්ග ලියාපදිංචි කිරීම, තේ ලබා ගැනීම, තේ සඳහා අවම ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණය කිරීම, තේ අපනයනය සඳහා අනුමැතිය ලබා දීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. ඊට අමතරව, 2020 වර්ෂය පුරාවට පහත සඳහන් ප්‍රධාන කර්තව්‍යයන් අඛණ්ඩව සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ තේ අපනයනයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා 2020 දක්වා ඉදිරියට කරගෙන යාමට අපනයන අංශය විසින් අවධානය යොමු කරන ලදී.

1. ඉරාන තේ අපනයනය සඳහා මනා නිෂ්පාදන ක්‍රියාවලිය (GMP) පිළිබඳ සහතිකය ලබා දීම.

2. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශය සතියේ දින 07ම පැය 24 පුරා ක්‍රියාත්මක කිරීම - තේ අපනයනයේ විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා රේගුව මගින් අපනයන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ (EFC) තේ තොග පිළිබඳ ඒකාබද්ධ විමර්ශනයක් සිදු කිරීම.

එයට අමතරව, සියලු අපනයන ගබඩාවල සකස් කරනු ලබන තේවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා, HACCP තත්ත්ව සහතිකය ලබා ගැනීම සියළුම ගබඩාවලට සිය මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් බව ප්‍රකාශයට පත් කරන ලදී. එයට අමතරව, සියලුම අපනයන ගබඩාවල මනා නිෂ්පාදන භාවිතාවන් (GMP) පිළිබඳ ඇගයීම 2018 සිට පවත්වන ලද අතර එය වාර්ෂිකව නැවත නැවත සිදු කරනු ලැබේ. තේ පරීක්ෂකවරුන් හට රාජකාරී බෙදා දීම සඳහා සියලුම ලියාපදිංචි ගබඩාවන් සිතියම් ගත කර කලාපවලට වෙන්කර ඇත. විශිෂ්ට මට්ටමේ සිට දුර්වල මට්ටම දක්වා ශ්‍රේණිගත කිරීමක් ස්ථාපිත කර ඇති අතර, විශිෂ්ට හා හොඳ මට්ටම්වල පවතින ගබඩා පමණක් ලියාපදිංචි කරනු ලැබේ.

2.2.1 ලියාපදිංචි කිරීම්

තේ අපනයන අංශයේ රාජකාරී අතරින් එක් ප්‍රධාන කටයුත්තක් වනුයේ අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගබඩාවන් සහ ආනයනකරුවන් වලංගු ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීම සහ එකී ලියාපදිංචි කිරීම් අලුත් කිරීම ය. ලියාපදිංචි ගබඩාවක් (තේ ගබඩා කිරීම, මිශ්‍ර කිරීම සහ ඇසුරුම් කිරීම සඳහා) සහ තේ රස බැලීමේ පහසුකම සහිත සුදුසුකම් ලත් අවම වශයෙන් රු. මිලියන 1.0ක ප්‍රාග්ධනයක් සහිත (ආයෝජන / ගෙවීම්) රස පරීක්ෂකයෙකු හට තේ අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීමට ඉල්ලුම් කිරීමට හිමිකම තිබේ.

1986 ජනවාරි 28 දින අංක 386/13 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල නියාමනය (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම) ප්‍රකාරව, ගෘහස්ථ පරිභෝජනය සඳහා හෝ අන් ආකාරයක තේ ඇසුරුම්කිරීමේ ව්‍යාපාරයක නියැලී සිටින ඕනෑම අයෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. සෑම ලියාපදිංචියක්ම වසරක කාලයක් වලංගුවන අතර වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතුය.

1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනත යටතේ තේ අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි ඕනෑම ආයතනයක් තේ ආනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීමට සුදුසු වේ.

වගුව 2.2.1: ආනයනකරුවන්, අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, නිෂ්පාදන තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන (2020)

ලියාපදිංචිය	2020.01.01 දිනට	වර්ෂය තුළ (නව ලියාපදිංචි කිරීම් සහ වර්ෂය තුළ ලියාපදිංචි නොකළ සමාගම්)	2020.12.31 දිනට මුළු එකතුව
අපනයනකරුවන්	354	නව ලියාපදිංචි කිරීම් : 33 වර්ෂය තුළ අලුත් නොකළ : 1277	357
ඇසුරුම්කරුවන්	674	අපනයන අසුරුම්කරුවන්ගේ නව ලියාපදිංචි කිරීම් : 33 දේශීය අසුරුම්කරුවන්ගේ නව ලියාපදිංචි කිරීම් : 196 වර්ෂය තුළ අලුත් නොකළ : 1727	803
ගබඩාවන්	168	නව ගබඩා ලියාපදිංචි කිරීම් : 26 වර්ෂය තුළ අලුත් නොකළ : 535	194
ආනයනකරුවන්	113	නව ආනයනකරුවන් ලියාපදිංචි කිරීම් : 4 වර්ෂය තුළ අලුත් නොකළ : 79	113
නිෂ්පාදන තැරැව්කරුවන්	08		08

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

1986 සැප්තැම්බර් 10 දින අංක 410/11 දරණ ගැසට් පත්‍රයෙන් සහ 2003 මාර්තු 20 දින අංක 1280/8 දරණ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 1984 දෙසැම්බර් 05 දින අංක 326/17 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල නියාමනය (තේ ගබඩා කිරීම) අනුව ඕනෑම එක් වතාවකදී කිලෝ ග්‍රෑම් 1000ට වඩා වැඩි තේ ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා භාවිතා කරන ගබඩාවන් සහ තේ ගබඩා කිරීම සඳහා සතුටුදායක බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සලකනු ලබන ගබඩාවන් උක්ත නියාමනවල විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි කළ යුතුය.

ශ්‍රී ලංකා තේ සමග මිශ්‍ර වෙනත් සම්භවයක් සහිත විශේෂිත තේ අඩංගු සිල්ලර බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (ආනයන හා අපනයන) 1981 යටතේ අපනයනය කරනු ලැබේ. එවැනි බහාලුම් /ඇසුරුම් මත "ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලද, ශ්‍රී ලාංකීය හා වෙනත් සම්භවයක් සහිත තේ" හෝ" ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද වෙනත් සම්භවයක් සහිත තේ" යන්න පමණක් සඳහන් කළ යුතු අතර සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතුය.

සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් අපනයනයට අවසර ලබා ගැනීම සඳහා ස්වයංක්‍රිය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා තේ අපනයන අංශයට වෙනත් අවශ්‍ය ලියකියවිලි සමග රේගු භාණ්ඩ ලියවිලි (CUSDECs) බාර දිය යුතුය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අපනයනය කිරීමට සුදානම් තේ තොගය අපනයනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව පවතින්නේ ද යන්න සොයා බලනු ලැබේ. සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන්ගේ ලේඛන කටයුතු සඳහා අඳත් කිරීමේ සහතිකය ලබා ගැනීමේ වැදගත්කම සලකා බැලීමෙන් අනතුරුව, 2020 වර්ෂය සඳහා සහතික නිකුත් කිරීමේ එක්දින සේවාවක් පවත්වන ලදී.

2.2.2 තේ ආනයනයන

තේ කිලෝ ග්‍රෑම් 5,296,751.80ක් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආනයන බලපත්‍ර නිකුත් කර ඇත. කෙසේවෙතත්, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සැබෑ ආනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 4,668,230 කි.

වගුව 2.2.2: තථ්‍ය ආනයන - 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

රට	වර්ගය	ආනයන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	පිරිවැය, රක්ෂණ හා ප්‍රවාහන (CIF)අගය (රු.)	අගය (රු.)
චීනය	හරිත තේ	1,794,705	517.80	929,303,197
	විශේෂ	101,484	556.42	56,467,568
	සුදු තේ	6,353	1,079.39	6,857,388
	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	1,100	1,957.86	2,153,646
අනු එකතුව		1,903,642	522.57	994,781,800
ඉන්දියාව	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	996,477	304.10	303,029,463
	විශේෂ :කළු තේ-	614,458	711.67	437,289,570
	සුදු තේ	50	7,252.00	362,600
	කැෆේන් ඉවත් කළ තේ	150	1,439.90	215,985
අනු එකතුව		1,611,135	459.86	740,897,618
ජර්මනිය	හරිත තේ	60	2,320.68	139,241
	විශේෂ	110	2,755.67	303,124
අනු එකතුව		170	2,602.15	442,365
ජපානය	හරිත තේ	4,100	2,543.62	10,428,860
	විශේෂ	3,240	4,030.30	13,058,180
අනු එකතුව		7,340	3,199.87	23,487,040
කෙන්යාව	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	1,144,661	497.68	569,674,809
	කැෆේන් ඉවත් කළ තේ	700	1,927.73	1,349,411
අනු එකතුව		1,145,361	498.55	571,024,220
නේපාලය	CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ)	186	7,850.41	1,460,176
අනු එකතුව		186	7,850.41	1,460,176
එක්සත් රාජධානිය	විශේෂ	397	1,822.20	723,412
අනු එකතුව		397	1,822.20	723,412
මුළු එකතුව		4,668,230	499.72	2,332,816,631

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.2.3 අවම තත්ව ප්‍රමිතිය පවත්වා ගැනීම

දෙන ලද සියලුම තේ නියැදි සහ තේ කර්මාන්තශාලාවලින් ලබා ගන්නා ලද සියලුම තේ නියැදි, ආනයනයෙන් පසු ලබා ගන්නා ලද තොග හා අපනයනය සඳහා සුදානම් කරන ලද තොග ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන්ගේ කමිටුව විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි. එනම්, අදාළ තේ වර්ගය අවසර ලත් වර්ගයට අයත් වේ ද, ISO 3720 ප්‍රමිතියට අනුකූල වේ ද, කිසිදු අපවිත්‍රතාවයකින් තොර වේ ද යන්න පිළිබඳ සොයා බැලීම සඳහා එකී පරීක්ෂාව සිදු කරන අතර එහිදී අපනයනයට සුදුසු තේ සඳහා පමණක් අවසර දෙනු ලබයි.

වගුව 2.2.3 එක් එක් නියැදිවල ගුණාත්මකබව සම්බන්ධ දෝෂ (2020)

නියැදි වර්ගය	ලබා ගත් නියැදි ගණන	ISO ප්‍රමිතියට පහලින් පවතින අපවිත්‍රතා සහිත බවට හඳුනාගත් ප්‍රමාණය
වෙන්දේසියට පෙර අපනයන අංශය මගින් ලබාගත් නියැදි	6211	3950
වෙන්දේසියට පෙර ඉවත් කරන ලද නියැදි (කමිටුව විසින්)	2270	
වෙන්දේසියට පසු	6119	12

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.2.4 පරිභෝජනයට සුදුසු නොවීම හේතුවෙන් තේවල ස්වභාවික ගුණය වෙනස් කිරීම

පුර්ව වෙන්දේසි, පුර්ව බෙදා හැරීම් සහ විශේෂ පරීක්ෂණ මට්ටම්වලදී මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට හඳුනා ගන්නා ලද තේවල ස්වභාවික ගුණය වෙනස් කිරීම අපනයන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. 2020 වසරේදී ඉහත සියලු මට්ටම් තුළදී හඳුනාගත් තේ කිලෝ ග්‍රෑම් 98,290ක් මෙම අංශය විසින් ස්වභාවික ගුණය වෙනස් කිරීමට භාජනය කරන ලදී.

2.2.5 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන කාර්ය සාධනය

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (TRQ) ශ්‍රී ලංකාව තුළ පවති. කෙසේ වෙතත්, මනාප ගාස්තු අනුපාතයෙහි සැලකිය යුතු උපයෝජනයක් 2020 වර්ෂය තුළ දී වාර්තා වී නොමැත.

වගුව: 2.2.4 මනාප ගාස්තු අනුපාත භාවිත කිරීම (2020)

නිදහස් වෙළඳ ගිවිසුම	වසරකට වෙන් කරන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	මුළු අපනයන (කිලෝ ග්‍රෑම්)
ඉන්දියා - ශ්‍රී ලංකා	15,000,000.00	49,108.24
පකිස්තාන් - ශ්‍රී ලංකා	10,000,000.00	45,510.00

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.2.6 තේ නැවත ලබා ගැනීමට අනුමැතිය

විදේශීය ගැනුම්කරු විසින් යම් තේ තොගයක් ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත්, දේශීය අපනයනකරුට එය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නැවත ලබා ගැනීමට සිදු වේ. අපනයනය / නැවත භාවිත කිරීම සඳහා අවසර ලබා දීමට පෙර මෙම තොගය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නැවත පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

2.3 තේ ප්‍රවර්ධන අංශය

2.3.1 අංශයේ මූලික කාර්යයන්

පහත දැක්වෙන පුළුල් කාණ්ඩ යටතේ වර්ගීකරණය කරන ලද දේශීය හා විදේශීය වෙළඳපොළවල ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවර්ධන අංශයේ වගකීම වේ.

I. ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රචාරණය
II. තේ වර්ගීය ප්‍රවර්ධනය
III. ශ්‍රී ලංකාව සතු සිංහ ලාංඡනය සඳහා සන්නාම ප්‍රවර්ධනය
IV. ජාත්‍යන්තර ආහාර හා පාන වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම
V. තේ පරිභෝජනය කරන සියලුම ප්‍රධාන පෙළේ රටවල උපායමාර්ගික වෙළඳපල පිළිබඳ විස්තර සම්පාදනය කිරීම හා බෙදා හැරීම
VI. තේ කේෂ්ත්‍රය සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහයෝගය දැක්වීම
VII. තරඟකරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණය
VIII. සිංහ ලාංඡන වෙළඳ ලකුණු ලියාපදිංචිය, අධීක්ෂණය සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
IX. භූගෝලීය දර්ශක ලෙස ශ්‍රී ලංකා තේ සහ අනෙකුත් තේ සම්බන්ධ ප්‍රාදේශීය නාමයන් / ලාංඡන ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය
X. ඕසෝන් හිතකාමී හා පිරිසිදු ශ්‍රී ලංකා තේ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
XI. දේශීය තේ ප්‍රවර්ධනය

2.3.2 තේ ප්‍රවර්ධනය විදේශ කාර්යාල සහ වෙළඳපොල ආවරණය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වර්තමානයේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව සහ චීනය තුළ ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුබද්ධ කලාපීය වශයෙන් තේ ප්‍රවර්ධන විදේශීය ඒකක තුනක් පවත්වාගෙන යනු ලබයි. ඩුබායි හි පිහිටි කාර්යාලය මැදපෙරදිග/ ගල්ෆ් / උතුරු අප්‍රිකානු කලාපන්හි තේ ප්‍රවර්ධනය සඳහා කටයුතු කරන අතර මොස්කව්හි කාර්යාලය රුසියානු සමුහාණ්ඩුවේ සහ ස්වාධීන රාජ්‍යයන්ගේ පොදුරාජ්‍ය මණ්ඩල (CIS) වෙළඳපොළවල තේ ප්‍රවර්ධන කටයුතු මෙහෙයවයි. චර්ධනය වන වෙළඳපොළක් ලෙස හඳුනාගෙන ඇති චීනය තුළ ශ්‍රී ලංකා තේවල වෙළඳපල කොටස ප්‍රවර්ධනය හා වැඩි දියුණු කිරීම සඳහා 2015 වසරේදී බීජිං හි නියෝජිත කාර්යාලයක් පිහිටුවන ලදී. අනෙකුත් වෙළඳපලවල ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන කටයුතු කොළඹ තේ ප්‍රවර්ධන අංශය විසින් විදෙස් රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමග සහයෝගයෙන් මෙහෙයවනු ලැබේ.

2.3.3 වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම

ජාතික වෙළඳ නාමයක් සහ සහභාගිවන සමාගම්හි තනි සන්නාමයන් ලෙස ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් වෙළඳපලවල ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවන ශ්‍රී ලංකා තේ අපනයන සමාගම්වලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් පහසුකම් සලසා දුනි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහනාධාරය මගින් බීම් කුලිය සහ කුටිය ඉදිකිරීම සඳහා වන වියදමෙන් 50%ක් ආවරණය කරයි. ඉතිරි පිරිවැය සහ අනෙකුත් වියදම් ප්‍රදර්ශනය සඳහා සහභාගිවන තෝරාගත් සමාගම් විසින් දැරිය යුතුය. 2020 වසර තුළ සහභාගිවීම සඳහා වෙළඳ ප්‍රදර්ශන 25ක් සැලසුම් කර තිබූ අතර වසංගත තත්වය හේතුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් Gulf food 2020 සහ Prodexpo 2020 ලෙස වෙළඳ ප්‍රදර්ශන 02කට පමණක් පහසුකම් සැලසීමට හා සහභාගි වීමට කටයුතු කර ඇති අතර 2020 වසර තුළ පැවැත්වීමට සැලසුම් කළ අනෙකුත් වෙළඳ ප්‍රදර්ශන අවලංගු කිරීම් / කල් දැමීම් පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කරන ලදී.

2.3.4 ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා තේ සඳහා ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන හඳුනාගත් වෙළඳපල 12ක් තුළ ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබේ. එනම්, රුසියාව, යුක්‍රේනය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, චිලි, සෞදි අරාබිය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා ඉරානය යන රටවල ය. මෙම වැඩසටහනෙහි අංග තුනක් සඳහා ආයතන තුනකින් ටෙන්ඩර් කැඳවන ලදී.

i)වැඩසටහනෙහි නිර්මාණකරණය හා අවශ්‍ය නිෂ්පාදන ද්‍රව්‍යයන්

ii)සැලසුම, කාලසටහන හා මිලදී ගැනීම ඇතුලත් මාධ්‍ය අංශයල හා iii) මහජන සම්බන්ධතා වැඩසටහන වශයෙනි.

• මාධ්‍ය සැලසුම් කිරීම, කාලසටහන්ගත කිරීම හා මිලදී ගැනීම

මාධ්‍ය සැලසුම් කිරීම, කාලසටහන්ගත කිරීම හා මිලදී ගැනීම සඳහා උපදේශන සේවා වෙනුවෙන් Dentsu Grants (Pvt) Ltd තෝරා ගන්නා ලද අතර සමාලෝචන කාලසීමාව සඳහා පහත කාරණා සම්පූර්ණ කරන ලදී. ගෝලීය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා Dentsu Grants මගින් ජපානය, ජර්මනිය හා චීනය සඳහා මාධ්‍ය වැඩසටහන් උපාය මාර්ග 3ක් සම්පූර්ණ කරන ලදී.

• නිර්මාණාත්මක සංවර්ධනයන්

විශාල පාරිභෝගික පිරිසක් ඉලක්ක කෙරෙන විශාල ප්‍රමාණයේ ජනසංනිවේදන ක්‍රම භාවිතයෙන් සිදුකෙරෙන වෙළඳ දැන්වීම් (ATL) සහ කුඩා ප්‍රමාණයේ පාරිභෝගික කණ්ඩායම් ඉලක්ක කරගත් වෙළඳ දැන්වීම් (BTL) මෙන්ම ගෝලීය වැඩසටහනෙහි සමාජ මාධ්‍ය සඳහා නිර්මාණාත්මක කටයුතු වෙනුවෙන් Phoenix O&M (Pvt) Ltd ආයතනය තෝරා ගන්නා ලද අතර පහත සඳහන් කටයුතු නිම කරන ලදී. ගෝලීය වැඩසටහනට අදාළ නිර්මාණාත්මක කටයුතු ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද අතර නිර්මාණාත්මක අයිතම භාෂා 07කට ද පරිවර්තනය කරන ලදී (වෙබ් අඩවි / ඩිජිටල් වීඩියෝ 11ක් / අත් පත්‍රිකා, කුඩා පොත් සහ පෝස්ටර්)

• ප්‍රධාන පෙලේ පුද්ගලයන් සහ සෙවුම් යන්ත්‍ර අලෙවිකරණය

රුසියාව සහ යුක්‍රේනය සඳහා ජන මතයක් නිර්මාණය කළ හැකි ජනප්‍රිය ප්‍රධාන පෙලේ නායකයන් යොදා ගන්නා නියෝජිතායතනය සහ සෙවුම් යන්ත්‍ර අලෙවිකරණය තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ටෙන්ඩර් සිදු කරන ලදී.

• ලංකා තේ (Ceylon Tea) ගෝලීය ව්‍යාපාරයේ අනාගත සැලැස්ම

ලොව පුරා පැතිර පවතින කොවිඩ් -19 වසංගත තත්වය හමුවේ, සැලසුම් කළ පරිදි ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන යාමේ ඵලදායිතාවය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අලෙවිකරණ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

චර්තමාන ගෝලීය තත්වය සලකා බැලීමෙන්, මෙම ව්‍යාපාරය දැනට නතර කිරීම වඩා යෝග්‍ය බව ප්‍රවර්ධන අලෙවිකරණ කමිටුව විසින් තීරණය කරණ ලදී. කෙසේ වෙතත්, ප්‍රවර්ධන අලෙවිකරණ කමිටුව විසින් 2020 ඔක්තෝබර් සිට 2021 මාර්තු දක්වා රුසියාව සහ යුක්‍රේනය තුළ, සෙවුම් යන්ත්‍ර අලෙවිකරණ ක්‍රමය හා ජන මතයක් නිර්මාණය කළ හැකි ජනප්‍රිය නායකයන් යොදා ගනිමින් මෙම ව්‍යාපාරය අතත්‍ය (virtual) ප්‍රවර්ධන උපායමාර්ග ඔස්සේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් එහි සාර්ථකත්වය මැන බැලීම උදෙසා සිදු කිරීමට අවසර ලබා දෙන ලදී.

2.3.5 සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2018/2019 වකවානුව සඳහා සන්නාම ප්‍රවර්ධන සහන යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමයට අනුව, සිංහ ලාංඡනය සහිත පිරිසිදු ශ්‍රී ලංකා තේ වෙළඳ නාමයන් තුලින ප්‍රදාන ලබා දීමෙන් (ප්‍රවර්ධන වියදම්වලින් 50%) ප්‍රවර්ධනය කෙරේ. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකාවේ දී ලියාපදිංචි කර ඇති ශ්‍රී ලංකා තේ වෙළඳ නාම පමණක් මෙම ප්‍රවර්ධන වැඩසටහන යටතේ ප්‍රවර්ධන ආධාර ලැබීම සඳහා සුදුසුකම් ලබයි. 2010 ඔක්තෝබර් 27 දින අංක 1677/14 දරන ගැසට් පත්‍රය යටතේ තේ අපනයනකරුවන් විසින් සපයනු ලබන ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්දෙන් මෙම යෝජනා ක්‍රමය සඳහා අරමුදල් ලබා දෙනු ලැබේ. 2018/2019 කාලය සඳහා රුපියල් මිලියන 500ක අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබේ.
සන්නාම ප්‍රවර්ධන යෝජනාක්‍රමය 2018/2019 සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2020 අවසානය තෙක් සේවා දිගු ලබා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ව්‍යාපෘති 15ක් ඇගයීමට ලක් කරන ලද අතර ඒ සඳහා අරමුදල් ලබා දෙන ලදී.

2.3.6 ප්‍රවර්ධන අවස්ථා සහ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා තේ (Ceylon Tea) සඳහා ගෝලීය වශයෙන් සිදු කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

• කළු තේ ප්‍රවර්ධන වැඩසටහන

වසංගත වාතාවරණය තුළ කළු තේ සඳහා ඇති ප්‍රවර්ධන අවස්ථා සැලකිල්ලට ගනිමින්, රටවල් 12 ක (රුසියාව, යුක්‍රේනය, ජපානය, චීනය, ඕස්ට්‍රේලියාව, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, චිලි, සෞදි අරාබිය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉරානය) ඩිජිටල් වීඩියෝ 3 ක් සහ වෙබ් පෝස්ට් ප්‍රචාරණ ව්‍යාපාරය 12ක් යොදා ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලංකා තේ (Ceylon Tea) සඳහා සමාජ/ ඩිජිටල් මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් දියත් කරන ලදී. ඒ අනුව, මෙම සංකල්පය පහත දැක්වෙන සමාජ මාධ්‍ය/ ඩිජිටල් වේදිකා වෙත සෑම සතියකම වෙනස් ආකාරයන්ගෙන් බෙදා හරිනු ලැබේ(FB, Twitter, Intragram, Youtube, LinkedIn සහ Vkontakte (රුසියාව), Baidu, Wechat, Sina Weibo, Xiaohongshu (චීනය) සහ Facenama, Aparat (ඉරානය) වැනි දේශීය වේදිකා.

• ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ලංකා තේ වර්ණයෙන් මුහුණු ආවරණ හඳුන්වා දෙන ලදී.

ගෝලීය සන්නාමයක් ලෙස ලංකා තේ පිළිබඳ දැනුවත්බව ඉහළ නැංවීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් Ceylon Tea සන්නාමය සහිත මුහුණු ආවරණ ලොව පුරා ව්‍යාපාරික ප්‍රජාව අතර නොමිලේ බෙදා හැරීම ආරම්භ කර ඇත. විදේශ සබඳතා අමාත්‍යාංශයේ සහයෝගිතාවය ඇතිව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලොව පුරා පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හැත්තෑපහකට (75) අධික සංඛ්‍යාවක් වෙත Ceylon Tea සන්නාමය සහිත මුහුණු ආවරණ බෙදා හැරීමට කටයුතු යොදා ඇත.

තේ වර්ණයෙන් මුහුණු ආවරණ බෙදා දීම.











• ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තානාපති කාර්යාල සමඟ මාර්ගගත ආකාරයෙන් B2B සහ B2C සැසි පවත්වන ලදී

ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් (මෙල්බර්න්), ජර්මානු ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, තුර්කියේ (යුක්‍රේනය) ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගයෙන් මෙම රැස්වීම් පවත්වන ලදී.



එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජර්මනිය, පකිස්ථානය, රුසියාව, බංග්ලාදේශය, දකුණු අප්‍රිකාව සඳහා නම් කරන ලද තානාපතිවරුන් සඳහා හඳුනාගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම.

• ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තේ සඳහා විශේෂිත සුපිරි වෙළඳසැලක් යුක්‍රේනයේ දී ආරම්භ කරන ලදී.



සිල්පෝ අනු වෙළඳ දාමයේ සහයෝගයෙන් වැඩසටහන දියත් කරන ලදී.

- කොවිඩ් 19 හි බලපෑම අවම කිරීමේ අරමුණෙන් ඇතැම් තානාපති කාර්යාල විසින් පනවා ඇති රෙගුලාසි මත පදනම්ව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තානාපති කාර්යාල හරහා අපනයන ලේඛන නිතිගත කිරීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසන අතරමැදියෙකු වශයෙන් කටයුතු කරන ලදී.

- සමාජ මාධ්‍ය ප්‍රචාරණය - අප්‍රේල් සිට මැයි දක්වා විදේශ රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා වෙබ් බැනර් 6ක් ප්‍රදර්ශනය කිරීම.

ප්‍රවර්ධන ව්‍යාපාරය,වසංගත වකවානුවේ දී කළු තේ සඳහා ඇති ප්‍රවර්ධන අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පෝස්ට් සහ වෙබ් බැනර් යොදා ගනිමින් Ceylon Tea සඳහා සමාජ මාධ්‍ය ප්‍රචාරණයන් සිදු කරන ලදී. ඒ අනුව, කළු තේ යනු සාමාන්‍යයෙන් වෛරස්වලට එරෙහිව සටන් කිරීමට සහ සෞඛ්‍ය සම්පන්නව සිටීමට උපකාරී වන ප්‍රතිශක්ති වර්ධක පානයක් යන අදහස සංකල්පයක් වශයෙන් ඉදිරිපත් කරනු ලබයි. අවශ්‍ය ආකාරයේ භාෂා වෙනස්කම් ද සහිතව ඉහත වෙබ් බැනර් ශ්‍රී ලංකා එතෙර දූත මණ්ඩල වෙත සෑම සතියකම එක් එක් ආකාරයන්ගෙන් නිකුත් කරන ලදී.

- **අනෙකුත් ප්‍රචාරණ වැඩසටහන්**

- ඕස්ට්‍රේලියාව, චීනය, රුසියාව, බෙල්ජියම, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ලෙබනනය සහ එක්සත් රාජධානිය යන රටවලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ පරිභ්‍යාග කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.
- ප්‍රතිශක්ති වර්ධනය පිළිබඳ මාධ්‍ය නිවේදන, විද්‍යුත් වෙන්දේසිය.
- ජාත්‍යන්තර තේ දින සැමරුම් සඳහා අදාළ වෙබ් පෝස්ට්, ඩිජිටල් චිඩියෝ සහ පුවත්පත් ලිපිය නිකුත් කිරීම.
- ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා චීනයේ Shandong තේ සංගමය සහ CCPIT සමග පවත්වන ලද Webinar සාකච්ඡාව.
- චීනයේ 14 වැනි (කිංඩාඕ) ජාත්‍යන්තර තේ සංස්කෘතික ප්‍රදර්ශනයේ දී ලංකා තේ ප්‍රවර්ධනය සහ Purple Sand චිත්‍ර ප්‍රදර්ශනය.
- ෂැංහයි පහසුකාරක සමාගම (අක්බාර් බ්‍රදර්ස් සහභාගි විය) සමග එක්ව සංවිධානය කරන ලද Ceylon tea පාරිභෝගික ක්‍රීඩායම් වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ මාධ්‍ය හා Rizhao Dazongwang TV, Guangbo TV, Xiangcun TV සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.
- ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා ෂැංහයි හි තැන්වන චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය (CIIE) වන XIAMEN තේ ප්‍රදර්ශනය සඳහා චීනයෙ ලංකා තේ නියෝජිතයින් සමග සහභාගි විය.
- "ස්ටුවර්ට්" සජීවී විකාශන තේ ප්‍රවර්ධන වැඩසටහනට සහභාගි විය.
- ජපාන තේ සංගමය සමග තානාපති කාර්යාලයේ තේ සම්මන්ත්‍රණ පැවත්වීම
- K-TEA උත්සවය සහ Myung Won World Tea Expo යනු මූලික වශයෙන් සාම්ප්‍රදායික කොරියානු තේ ඉලක්ක කරගත් කොරියාවෙහි පවත්වන කීර්තිමත් ජාත්‍යන්තර තේ ප්‍රදර්ශනයකි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් වාණිජ නිලධාරියා උත්සවයේ සමාරම්භක අවස්ථාවට සහභාගි විය. ලෝකයේ තේ වර්ග 10ක් ඉදිරිපත් කළ ෂරින් පොන්සන් (ඕස්ට්‍රලියානු තේ ප්‍රමුඛයෝ) විසින් මෙහෙයවන ලද මාර්ගගත සැසිය තුළ ශ්‍රී ලංකාව තේ නිෂ්පාදනය කරන රටවලින් එකක් විය. මෙම සැසිවාරය තුළින් ලෝකයේ පවතින තේ වශයෙන් ශ්‍රී ලංකාව, කෙන්යාව, නේපාලය, ඉන්දියාව, වියට්නාමය සහ රුවන්ඩාව ආදී රටවල තේ හඳුනාගන්නා ලදී.
- මෙල්බර්න් හි ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලය මගින් තේ මණ්ඩලයේ සහ ඩිල්මා සමාගමේ සහාය ඇතිව සිලෝන් ටී ප්‍රවර්ධනය කිරීම සඳහා අතථ්‍ය තේ රස බැලීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.
- 2020 ජනවාරි 8 සිට 10 දක්වා දිල්ලි නුවර පැවති SATTE සංචාරක ප්‍රදර්ශනය තුළ වූ ශ්‍රී ලංකා මණ්ඩපයේදී ලංකා තේ සේවාව සංවිධානය කරන ලදී.

2.3.7 ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය

ඒක ජාතිය ශ්‍රී ලංකා තේ (Ceylon Tea) ප්‍රවර්ධනය යනු වෙනත් සම්භවයන් ඇති තේ සමග තරගකාරීව ශ්‍රී ලංකා තේ (Ceylon Tea) සඳහා ප්‍රචාරණය හා ප්‍රසිද්ධිය ලබා දීමයිග විදේශයන්හි පිහිටුවා තිබෙන තේ ප්‍රචාරණ ඒකක සහ තානාපති සේවාවන්හි ක්‍රියාත්මක වාණිජ්‍ය අංශ ඔස්සේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විදේශීය වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකා තේ සඳහා ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන්, එළිමහන් ප්‍රචාරණයන්, තේ පැන් සංග්‍රහ, තේ සම්බන්ධ වැඩමුළු සහ සම්මන්තණ පැවැත්වීම මෙන්ම වෙනත් පොදු මහජන ක්‍රියාකාරකම් ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරන ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් ප්‍රධාන වේ.

2.3.8 වර්ගීය තේ ප්‍රවර්ධනය

වෙනත් පාන වර්ග සමග තරගකාරීව තේ ප්‍රවර්ධනය කිරීම මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය යටතට ගැනේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම, ඇ.එ.ජ. තේ සංගමය, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර තේ කමිටුව සහ ජපාන තේ සංගමය යනාදියෙහි සාමාජිකයෙකි. මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය කාර්යයන් මෙම ආයතන විසින් ඉටුකරනු ලබයි. පාරිභෝගික දැනුවමිත් කිරීම සහ මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධනය කරනු ලබන තේ සහ සෞඛ්‍ය යන සංකල්පය කෙරෙහි වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබයි තෝරාගත් රටවල ඉහතින් සඳහන් කළ ආකාරයේ වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් තේ සමාගම්වල ප්‍රචාරණ අයවැය සඳහා 2020 වසරේදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය දායක වී ඇත.

2.3.9 භූගෝලීය දර්ශක යටතේ ලංකා තේ, කලාපීය නම් සහ ලාංඡන ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා තේ (Ceylon Tea) නාමය සහ අනෙකුත් කෘෂි දේශගුණික කලාපීය තේ වර්ග හත (නුවර එළිය, උඩ පුස්සැල්ලාව, දිඹුල, ඌව, නුවර, සබරගමුව සහ රුහුණ) භූගෝලීය දර්ශකයන් ලෙස සුරැකීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවශ්‍ය නීති සහ රෙගුලාසි සම්පාදනය කරන ලදී. මෙමගින් විශේෂයෙන්ම කොන්ත්‍රාත් පදනමෙන් කටයුතු කරන විදේශීය ඇසුරුම් කරුවන් විසින් Ceylon Tea නාමය සහ කලාපීය වශයෙන් ඉස්මතු වෙමින් පවතින අනෙකුත් තේ නාම අවභාවිත කිරීම වැලැක්වීමට සහායවීම පමණක් නොව භූගෝලීය දර්ශකයන් යටතේ අලෙවි කෙරෙන ශ්‍රී ලංකා තේ සඳහා අගය සහ නියම මිල එකතු කිරීම ද සිදුකෙරේ.

2.3.10 වෙළඳ සලකුණෙහි සුරක්ෂිතබව

සිංහ ලාංඡනය වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම (712)

'Ceylon Tea' සිංහ ලාංඡන වෙළඳ සලකුණෙහි නෛතික හිමිකරුවා වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල 'Ceylon Tea' සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම / අලුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය මගින් කරනු ලබයි. 2020 වසර වන විට සිංහ ලාංඡනය රටවල් 103ක ලියාපදිංචි කර ඇත. සිංහ ලාංඡනය භාවිත කිරීමේ අධිකාරිය ප්‍රදානය කර ඇත්තේ 100%ක්ම ශ්‍රී ලංකා තේ අඩංගු, ISO 3720 ප්‍රමිතියට අනුකූල, එක් එක් වෙළඳපොළවල අවම ප්‍රමිතියට වඩා උසස් තත්වයේ වූ අගය එකතු කළ තේ නිෂ්පාදන (තේ මළු සහ ඇසුරුම්) සන්නාමයන් සඳහා පමණක් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ පෙර ඇසුරුම් කරන ලද ඒවා ද විය යුතුයි. සමාලෝචන කාල පරිච්ඡේදය තුළ, යුක්රේනය, ස්විට්සර්ලන්තය, ලෙබනන් සහ චීනය තුළ සිංහ ලාංඡනය ලියාපදිංචිය අලුත් කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී. එමෙන්ම, ඇමරිකා එක්සත් ජනපදය, සවුදි අරාබිය සහ චීනය තුළ, ශ්‍රී ලංකා තේ නාමය ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

2.3.11 ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව සහතික සලකුණක් ලෙස ශ්‍රී ලංකාව තුළ, ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කර ඇත. මොන්ට්‍රියල් ගිවිසුම (Montreal Protocol) අනුව නිරෝධායනීය නොවන හා පූර්ව බෙදාහැරීමේ අරමුණු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය නතර කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන ලදී, තේ වගාවන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිත නොකර පරිසර හිතකාමී තාක්ෂණ ක්‍රමවලට අනුගත වෙමින් තේ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය 2002 වසරේදී සාර්ථකව අවසන් කෙරුන අතර මේ සඳහා 2007 වසරේදී ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් ගිවිසුම ක්‍රියාත්මක කරන්නන්ගේ සම්මානය (Montreal Protocol Implementers Award 2017) දිනාගන්නා ලදී. එහෙයින්ල ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කරන ලොව පළමු රට බවට ශ්‍රී ලංකාව පත් වූ අතර තවමත් මෙම සම්මානය ලත් එකම තේ නිෂ්පාදනය කරනු ලබන රට වනුයේ ශ්‍රී ලංකාව යි. 2020 වසර තුළ දී අපනයනකරුවන් නව දෙනෙකු විසින් සන්නාම නාමයන් දහ තුනක් සඳහා ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය භාවිත කිරීම සඳහා අවැසි අවසරය හිමිකර ගන්නා ලදී.

2.3.12 දේශීයව තේ ප්‍රවර්ධනය කිරීම

කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වසර තුළ ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් පමණක් ක්‍රියාත්මක කරන ලදී, එනම්,

- BIA ප්‍රචාරණ ව්‍යාපාරය, ගුවන් තොටුපල මහාමාර්ගයේ සිදු කළ ප්‍රචාරණ වැඩසටහන, දුම්රිය ස්ථානය - වෙළඳ ප්‍රචාරණ වැඩසටහන සහ නොමිලයේ පවත්වන ලද PEO TV යෝජනාව.
- ප්‍රවර්ධන අංශය මගින් දේශීය ප්‍රවර්ධන වැඩසටහන් වශයෙන් සඟරා සඳහා අනුග්‍රහය දැක්වීම හා වෙළඳ දැන්වීම් ලබා දීම.
- 2020 වර්ෂය තුළ ප්‍රවර්ධන අංශය විසින් නිකුත් කරන ලද ද්වි-මාසික ප්‍රවෘත්ති පත්‍රිකාව (06).

2.3.13 තේ අලෙවි මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා තේ මණ්ඩල පරිශ්‍රයේ පිහිටි තේ අලෙවි මධ්‍යස්ථානය පෞද්ගලික අංශයේ තේ සමාගම් විසිඅටක් අතරින් තේ මණ්ඩලයේ ඇසුරුම් සහ තෝරාගත් තේ නිෂ්පාදන සම්බන්ධයෙන් ඉදිරියෙන්ම කටයුතු කරයි. 2020 වර්ෂය තුළ, මධ්‍යස්ථානයේ තේ අලෙවිය හරහා රුපියල් මිලියන 26.93 ක ආදායමක් උපයා ඇති අතර එය පෙර වසරට (2019) සාපේක්ෂව 74.92%කින් විකුණුම් පහල බැසීමක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා තේ මණ්ඩල ඇසුරුම් අලෙවියෙන් රුපියල් මිලියන 9.18ක් උපයා ඇති අතර පුද්ගලික අංශයේ තේ සන්නාම අලෙවියෙහි වටිනාකම රුපියලල් මිලියන 17.75 කි.

තේ අලෙවි මධ්‍යස්ථානය සහ Pick Me බෙදාහැරීමේ සේවාව සමග එක්ව පාරිභෝගික ඇනවුම් ඉටු කිරීමේ අරමුණින් තේ පැකට් බෙදා හැරීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදී. (ප්‍රදේශ වසා දමා තිබූ කාල සීමාව තුළ කොළඹ තදාසන්න ප්‍රදේශවල පමණි)

2.3.14 ප්‍රවර්ධන අපේක්ෂාවන් සඳහා තේ බෙදා හැරීම

"සිලෝන් ටී" ප්‍රවර්ධන කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රුපියල් මිලියන 4.52 ක වටිනාකමෙන් යුත් තේ ත්‍යාග වශයෙන් නොමිලේ නිකුත් කරන ලදී.

I. විදේශීය ශ්‍රී ලංකා දූත මණ්ඩල දෙකකට ත්‍යාග වශයෙන් තේ ලබා දීම.

II. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවල දියර තේ ලබා දීම සහ බෙදා හැරීම.

III. ප්‍රවර්ධන අරමුණෙන් ප්‍රභූවරුන්ට/නිලධාරීන්ට තේ ලබා දීම.

2.4 තේ රස බැලීමේ අංශය



ශ්‍රී ලංකාවේ තේ වල තත්ත්ව සහතික කරන ප්‍රධාන ආයතනයක් වශයෙන් මෙම අංශය කටයුතු කරයි. වෙන්දේසි කිරීමට හා අපනයනයට පෙර තේවල ගුණාත්මක බව පිළිබඳ තක්සේරු කිරීම මෙහි වගකීම වේ. සාදන ලද තේවල පෙනුම සහ රසය Camellia Sinensis පැළැටියේ විවිධ ක්ලෝන, දේශගුණික සාධකවල බලපෑම (වර්ෂාපතනය, හිරුඑළිය පවතින වේලාවන් සහ උෂ්ණත්වය වැනි) හු ලක්ෂණ සහ නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ ප්‍රභේදයන් වැනි හේතු මත විශාල වශයෙන් වෙනස්වීම්වලට ලක්වේ. රස පරීක්ෂා කරන ලද තේ නියැදිවල ගතිලක්ෂණ මත පදනම්ව පුහුණු රස බලන්නන් විසින් ඒවායෙහි මිල සහ තත්ත්වය සහතික කරනු ලබයි. අසතුටුදායක මට්ටමක පවතින නියැදි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය වෙත වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා යවන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රස පරීක්ෂා කිරීමේ කණ්ඩායම රාජ්‍ය සහ පුද්ගලික අංශයේ තේ රස පරීක්ෂා කරන්නන්ගෙන් යුත් විශේෂඥ මණ්ඩලයකින් සමන්විත වේ. ඔවුන් සියලුම පාර්ශව නියෝජනය කරමින්, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය (CTTA), කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමය (CBA), ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (CPA), කුඩා තේ වතුහිමියන්ගේ සංවර්ධන සමාජ පිළිබඳ ශ්‍රී ලංකා සම්මේලනය (SLFTSHDS)සහ ශ්‍රී ලංකා තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය (SLTFOA) වැනි ආයතනයන් සහභාගී වේ. පක්ෂපාති තීරණ ගැනීම වලකනු වස් ස්වාධීන සාමාජික මඩුල්ලකින් ද මෙම කණ්ඩායම සමන්විත වේ.

මෙම අංශයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි ලැයිස්තු ගත කළ හැක.

- තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය සහ ISO 3720 හා ISO 11287 යන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- පුද්ගලික විකුණුම්, සෘජු විකුණුම් හා කොන්ත්‍රාත්තු අධීක්ෂණය හා අනුමත කිරීම.
- සන්නාම සහිත නිෂ්පාදන සහ පරිභෝජන ඇසුරුම් සඳහා සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම පහසුකරණය කිරීම.
- නව අපනයන සමාගම් සඳහා තේ රස බලන්නන් ඇගයීමට ලක් කිරීම.

තේ රස බැලීමේ සංකල්පය හා ක්‍රමවේදය

- සංවේදක පරීක්ෂණවලදී තේ පිළියෙල කිරීම පිළිබඳ ෂධ 3103 ක්‍රමවේදය
- ශ්‍රී ලංකාවේ තේ රස බැලීම සම්බන්ධයෙන් කළු තේ සඳහා ISO 6078 පාරිභාෂිත වචන මාලාව/ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය - අංක 4 - ලංකාවේ තේ නිෂ්පාදනය.

2.4.1 තේ විකුණුම් අවස්ථාවන්හි දී අවම තත්ත්ව ප්‍රමිතිය ISO 3720 සහ ISO 1287 ප්‍රමිතිය පවත්වා ගැනීම.

තේ පිළිබඳ විශේෂඥ මණ්ඩලයක සහභාගිත්වයෙන් ප්‍රධාන වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා යන දිනයන්හි දී සතියකට දෙවරක් සාමාන්‍ය තේ රස බැලීමේ සැසි පවත්වනු ලැබේ. මෙම සැසි අතරවාරයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයනය අංශය මගින් ලබාදෙන සහ තේ රස බැලීමේ අංශයට සෘජුව ලැබෙන පහත තේ නියැදි ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

(අ) පූර්ව වෙන්දේසි තේ

(ආ) විශේෂ විමර්ශන තේ

(ඇ) පූර්ව ආනයන නියැදි

(ඈ) සෘජු විකුණුම්

(ඉ) දෛනික ඇගයීමට ලක්කරන බෙදාහැරීමට පෙර කරනු ලබන අධීක්ෂණය

නියැදි සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය වැඩිදුර නියාමන කටයුතු සඳහා තේ කොමසාරිස් ශාඛාවට සහ තේ අපනයන අංශයට යවනු ලැබේ.

2.4.1.1 පූර්ව වෙන්දේසි තේ

විකිණීමට සතියකට පෙර තැරැව්කරුවන් අටදෙනෙකු ඔවුන්ගේ තේ නියැදි වෙන්දේසියට පෙර ඇගයීම සඳහා එවනු ලැබේ. පළමු පියවර ලෙස තත්ත්වයෙන් පහළ පවතින තේ, කසල තේ, අධිමිල මල් සහිත සහ BOPI නියැදීන් හඳුනාගැනීම සඳහා දෘශ්‍ය ඇගයීම සිදු කරනු ලැබේ. මෙයට සමාන්තරව ඉහල සහ මධ්‍යම, කොළ සහිත සහ නැට් සහිත නියැදීන් අහඹු ලෙස ඇගයීමට ලක් කරනු ලැබේ.

පසුව නියැදීන් කාබනික ඇගයීම සඳහා භාජනය කරන අතර තෝරාගත් නියැදි ඉදිරිපත් කරන්නේද යන්න පිළිබඳව සාමූහිකව තීරණය කිරීමට විශේෂඥ මණ්ඩලය වෙතට යවනු ලැබේ. ඔවුන්ගේ තීරණය අපනයන අංශයේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙතට දන්වා යවනු ලැබේ.

2019 වසර තුළදී නියැදීන් ඇගයීමට ලක් කළ අතර තීරණය අදාළ පාර්ශවයන් වෙතට දන්වන ලදී.

වගුව 2.4.1: 2020 දී පරීක්ෂා කරන ලද සහ සැක සහිත නියැදි විස්තර

විස්තරය	පරීක්ෂාවට ලක් කළ නියැදි සංඛ්‍යාව	සැකයට බදුන් කරන ලද නියැදි සංඛ්‍යාව
දෘශ්‍ය පරීක්ෂණ	215,920	
කාබනික පරීක්ෂණය	22,126	
පූර්ව වෙන්දේසි නියැදි		
සසම්භාවී පදනම (BSL) ඇගයීම	6,211	1,680
පූර්ව වෙන්දේසි නියැදි		
දිය වර්ග මිශ්‍ර වීමෙන් අපවිත්‍ර වී ඇතැයි යන සැකය හේතුවෙන් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම.		604
සිලිකාමය කරුණු		242
දළ තන්තු		1,424

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.4.1.2 බෙදා හැරීමට පෙර තේ

සිංහ ලාංඡනය භාවිතය, ISO 3720 ප්‍රමිතීන් හෝ වෙනත් අපවිත්‍රතාවයක් තේ තොගය බෙදා හැරීමට පෙර කරනු ලබන පරීක්ෂාව යටතේ පරීක්ෂාවට ලක්කරන ලදී. මෙම ඇගයීම් ක්‍රමය යටතේ 2020 වර්ෂය තුලදී නියැදි 6,119ක් පරීක්ෂාවට ලක්කර තිබේ.

2.4.1.3 පූර්ව ආනයන තේ සහ පශ්චාත් ආනයන තේ පිරික්සුම්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශය හරහා ලැබෙන පූර්ව ආනයන නියැදි සමඟ අපනයනය සඳහා එහි වූ යෝග්‍යතාවය ඇගයීමට ලක්කිරීම සඳහා ආකෘතියක්ද අඩංගු කර ඇත. සෑම ඉල්ලුම් පත්‍රයකම අදාළ නියැදිය පිළිබඳ විස්තර ඇතුලත්ය. එනම් එහි සම්භවය, ශ්‍රේණිය සහ අදාළ අනෙකුත් තොරතුරුය.

තේ රස බැලීමේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ චක්‍රලේඛ අංක OR/1/65 සහ එහි සංශෝධනයන්හි මාර්ගෝපදේශ අනුව තේ නියැදි ඇගයීමට ලක් කරනු ලබයි. 2020 වසර සඳහා තේ රස බැලීමේ අංශය විසින් නියැදි 1346ක් ආනයනයට පෙර නියැදි වශයෙන් පරීක්ෂාවට ලක් කරන ලදී.

තේ ආනයන ශාඛාව මගින් ඉදිරිපත් කරනු ලබන ආනයනය කරන ලද තේ නියැදි තේ රස බලා අනුමැතිය ලබා දීම සඳහා තෝරා ගනේ. නියැදි ලැබෙන අවස්ථාවලදී දෙන ලද නියැදියට සාපේක්ෂව මෙම නියැදීන් ඇගයීමට ලක්කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ නියැදි 654ක් පරීක්ෂාවට ලක්කර ඇත.

2.4.2 පුද්ගලික විකුණුම් අනුමත කිරීම සහ මණ්ඩල තක්සේරු සහතිකය

අ) පුද්ගලික විකුණුම් අනුමත කිරීම

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතිය සමඟ විකුණුම් තැරැව්කරුවන් විසින් මණ්ඩලය වෙත ලැබෙන තේ නියැදි තේ රසය පිළිබඳ ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙහිදී නියමිත සේවා ගාස්තු අදාළවන අතර අනුමත කිරීමේ ගාස්තු වශයෙන් එක් තේ වර්ගයක් සඳහා රුපියල් 500ක් (අගය මත එකතු කළ බද්ද (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)) අය කරනු ලැබේ.

වර්තමානයේදී, ඉහත විකුණුම් ක්‍රමය කොළඹ වෙන්දේසි හරහා විකුණනු නොලබන හරිත තේ, කාබනික තේ, විශේෂිත තේ සහ කුඩා පරිමාණයේ ශ්‍රේණී සඳහා පමණක් සීමා කර ඇත. සමස්ථයක් ලෙස 9592ක පුද්ගලික විකුණුම් කොටස් ප්‍රමාණයක් 2020 වර්ෂය සඳහා පරීක්ෂා කර අනුමත කරන ලදී.

ආ) ඉදිරි කොන්ත්‍රාත්තු සහතික කිරීම

ගැණුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව තෝරාගත් ලකුණු කිහිපයක් යම් කාල වකවානුවක් සඳහා අනුමත කිරීම මෙහිදී සිදු කෙරේ. විකුණුම්කරු, ගැණුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩලය විසින් විකිණීමේ කොන්ත්‍රාත්තුව අනුමත කිරීම සිදු කරනු ලැබේ. රු.500ක අනුමත කිරීමේ ගාස්තුවක් අගය මත එකතු කළ බද්ද (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) එකතුව ඉහත සේවාව සඳහා ද එක් එක් තේ වර්ගය වෙනුවෙන් අය කරනු ලැබේ.

2020 දී අනුමත කරන ලද මුළු ඉදිරි කොන්ත්‍රාත් සංඛ්‍යාව 175 කි.

ඇ) සෘජු විකිණීම අනුමත කිරීම

තම නිෂ්පාදන සෘජුවම විදේශීය ගැණුම්කරුවන්ට විකිණීම සඳහා ඉහත යෝජනා ක්‍රමය මගින් නිෂ්පාදකයාට සහ අපනයනකරුවාට අවසර දෙනු ලබයි. හරිත තේ හැර, කාබනික තේ සහ විශේෂ තේ දේශීය ගැණුම්කරුවන්ට අලෙවි කළ හැකිය. බ්‍රහස්පතින්දා දිනයන්හි රැස්වන මණ්ඩලය මගින් සෘජු විකුණුම් අනුමත කරනු ලැබේ. එමෙන්ම, සලකා බලන ලද වර්ෂය සඳහා විකුණුම් තොග 1298ක් අනුමත කරන ලද අතර අනුමත කළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 1.55 කි.

2.4.3 සිංහ ලාංඡනය සඳහා ලියාපදිංචි වීම

ගුණාත්මකබව සහ ආරම්භක රට පිළිබඳ සංකේතයක් වන සිංහ ලාංඡනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වත්කමකි. සන්නාමගත පාරිභෝගික ඇසුරුම්වල සිංහ ලාංඡනය නිරූපණය කිරීමට අපේක්ෂා කරන අපනයනකරුවන් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එහිදී ගමනාන්තය සහ වෙළඳපොළ අනුව සන්නාමගත නිෂ්පාදන ඇගයීමට ලක් කරනු ලැබේ.

වෙළඳ නාම සඳහා සිංහ ලාංඡන සහතිකය වලංගුවන කාලය වසර තුනකි. සිල්ලර ඇසුරුම්වල සිංහ ලාංඡනය භාවිත කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවසරය ලබා දෙනු ලබයි. 2020 වසරේදී තේ ප්‍රවර්ධන අංශයේ අධීක්ෂණය සහිතව තේ රස බැලීමේ අංශය විසින් නව වෙළඳ නාම, අළුත් කිරීම් සහ අමතර ඇසුරුම් සඳහා අයදුම්පත් 477ක් පිළිබඳ කටයුතු කර ඇත.

ගුණාත්මකබව හා කීර්ති නාමය පවත්වා ගැනීම උදෙසා මෙන්ම ප්‍රධාන වශයෙන් සිංහ ලාංඡනය වංචනික ලෙස භාවිත කිරීමේ අවස්ථා හඳුනාගැනීම සඳහා විදේශීය වෙළඳපොළවල සහ දේශීය වෙළඳපොළවල සිංහ ලාංඡනය භාවිතය පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලින් සිදු කරනු ලැබේ. පුර්ව බෙදාහැරීමේ අධීක්ෂණය අතරවාරයේදී, සිංහ ලාංඡනය සහිත බෙදාහැරීමේ බඩු තොග 80%කට අධික ප්‍රමාණයක් අහඹු නියැදි පදනම මත ඇගයීමට ලක් කෙරේ. ඊට අමතරව, විදේශීය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වාණිජ උපදේශකයින් විසින් විදේශීය වෙළඳපොලවල තිබෙන සිංහ ලාංඡනය සහිත ඇසුරුම් ඇගයීම සහ වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. දේශීය වෙළඳපොල තුළ සිංහ ලාංඡනය භාවිත කරන වෙළඳ නාම ද අහඹු ලෙස තෝරා ගැනීමෙන් සිංහ ලාංඡනය භාවිත කිරීමේ කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරේ. ප්‍රධාන වශයෙන්, තේ මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින හා සැලකිය යුතු වෙළඳපල කොටසක් හිමි කීර්තිමත් හා දිගුකාලීන ඇසුරුම්කරුවන්ට සිංහ ලාංඡනය භාවිතා කිරීමට අවසර ලබා දී ඒ අනුව අධීක්ෂණය කරනු ලැබේ.

2.5 රසායනික විද්‍යාගාරය

රසායනික විශ්ලේෂණ ඒකකය, ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය සහ පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය යන ඒකක තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය යටතේ ඒකාබද්ධව ක්‍රියාත්මකවන අතර ජාත්‍යන්තර වශයෙන් ස්ථාපිත පරීක්ෂණ ක්‍රමවේද භාවිත කරනු ලබයි. තවද, නවීන උපකරණවලින් සහ කුසලතා පුර්ණ තාක්ෂණික කාර්ය මණ්ඩලයකින් ද සමන්විත වේ. 2014 වර්ෂයේ සිට, තේ මණ්ඩල විද්‍යාගාරය රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ විෂය පථය තුළ තම පිළිගැනීම අඛණ්ඩව පවත්වාගෙන ඇති අතර පසුව 2020 වසරේ දී ISO/IEC 17025:2017 ප්‍රමිති මට්ටමට එහි ගුණාත්මකභාවය අලුත් කරගෙන තිබේ.

2020 දී ලබා ගත් ජයග්‍රහණ...

- දාළ අපනයනකරුවන් විසින් තේ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලද "ග්ලයිෆොසේට්" (නායිවානය), 2- 6 DIPN (නායිවානය), "ග්ලූටන්"(ජර්මනිය) සහ "MCPA" (ජපානය) පිළිබඳ පාරිභෝගික පැමිණිලි රැසක් විසඳීමට විද්‍යාගාරයේ දායකත්වය ලබා දී තිබේ.
- "මෝල්ටෝ-ඩෙක්ස්ට්‍රින් - Malto-dextrin" (පොලිස්), "ෆෙරස් සල්ෆේට් -Ferrous Sulphate (STF) සහ සීනි (තේ කොමසාරිස්) පිළිබඳ ලැබුණු දේශීය පැමිණිලි රැසක් ජර්මනියේ යුරෝෆින්ස් රසායනාගාරයේ සහාය ඇතිව විසඳීමට රසායනාගාරය දායක වී ඇත.
- තෝරාගන්නා ලද පිළිගත් දේශීය රසායනාගාර සමග LCMS-MS උපකරණ භාවිත කරමින් ජපාන ක්‍රමවේදය යොදා ගනිමින් MCPA පළිබෝධනාශක විශ්ලේෂණය සඳහා සුදුසුකම් ලැබීමේ අන්තර් රසායනාගාර අත්හදා බැලීම් සංවිධානය කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනය, වෙරිටා (Verif) පරීක්ෂණ රසායනාගාරය සහ ඉන්ටර්ටෙක් (Intertek) පරීක්ෂණ රසායනාගාරය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජපානය වෙතට යවනු ලබන තේ තොග නැවිගත කිරීම් සඳහා MCPA පරීක්ෂණ සිදු කිරීමට තේ මණ්ඩලයේ බලයලත් රසායනාගාරයක් ලෙස කාර්මික තාක්ෂණ ආයතනයේ අපද්‍රව්‍ය විශ්ලේෂණ විද්‍යාගාරය තෝරාගෙන තේ කර්මාන්තය තුළ ප්‍රකාශයට පත් කරන ලදී.
- තේ පර්යේෂණ ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය සහ එස්.ජී.එස් (SGS) ලංකා රසායනාගාර ඇතුළු ශ්‍රී ලංකාවේ ආහාර පරීක්ෂක රසායනාගාර අතර, තේ පර්යේෂණ ආයතනය මගින් සකසන ලද පරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරමින් සීනි පරීක්ෂාව සඳහා අන්තර් රසායනාගාර සංසන්දනාත්මක පරීක්ෂණ මෙම රසායනාගාරය විසින් සංවිධානය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්තන දර්ශක අනාවරකය සමග සංයෝග වූ ඉහළ කාර්යසාධනයක් සහිත දුව වර්ණදේහය භාවිත කරමින් තේවල අඩංගු සීනි පරීක්ෂාව සඳහා වලංගු පරියේෂණ ක්‍රමවේදයක් සකස්කර ගැනීමට තේ මණ්ඩලයේ රසායනාගාරයට හැකිවිය.
- රුපියල් 10,000ක පිරිවැයකින් යුතුව තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා තේ මණ්ඩලය විසින් සීනි පරීක්ෂා කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පිළිගත් තේ පරීක්ෂණාගාර දහයක් අතරින් කළු තේ ISO 3720 ප්‍රමිතින් සහ හරිත තේ ISO 11287 ප්‍රමිතින් යටතේ සියලුම ප්‍රමිති සඳහා සුදුසුකම් ලබමින් ප්‍රවීණතා පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබීමට රසායනාගාරයේ රසායනික විශ්ලේෂණ ඒකකය සමත් විය. එය 2020 වසරේ දෙවන කාර්තුව තුළ ලද වැදගත් ජයග්‍රහණය කි.
- ත්‍රිපාර්ශවයන් අතරේ "සිලෝන් තේවල මුලාරම්භය සත්‍යාපනය සඳහා හු රසායනික ප්‍රවේශය" යන තේමාව යටතේ දියත් කරන ලද නියමු ව්‍යාපෘතියෙන් "සිලෝන් තේ" සඳහා පීඅයි-ඇගිලි මුද්‍රණ ස්ථාපනය කිරීම වෙනුවෙන් රසායනාගාරය විශාල කාර්යභාරයක් ඉටු කර ඇත: තේ මණ්ඩලය, පරමාණුක බලශක්ති මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය
- තේ ප්‍රවර්ධන අංශය සමග එක්ව ප්‍රධාන නගරවල සුපිරි වෙළඳසැල්වලින් සාම්පල ලබා ගනිමින් දේශීය වෙළඳපලෙහි තේවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ ව්‍යාපෘතියක් රසායනාගාරය විසින් ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතිය සමාලෝචනය කෙරෙමින් පවතී.
- ක්ෂණික තේ නිපදවන ප්‍රධාන නිෂ්පාදකයින්ගෙන් BMF සාම්පල ලබා ගනිමින්, ISO 3720 ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා තේ රස බැලීමේ ඒකකය සමග එක්ව කැඩුණු මිශ්‍ර රස තේවල (BM Fanning tea) අමු තන්තු මට්ටම ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් රසායනාගාරය මගින් ආරම්භ කරන ලදී.

2.5.1 විශ්ලේෂණ විද්‍යාගාරයේ ක්‍රියාකාරීත්වය



රූපය 2.5 : විශ්ලේෂණ විද්‍යාගාරයේ අධ්‍යක්ෂතුමා සමග රසායනාගාර කාර්ය මණ්ඩලය

පූර්ව වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් හා සැසඳීමේදී, 2020 වර්ෂය තුළ විශ්ලේෂණ විද්‍යාගාරයේ මෙහෙයුම් ඒකක තුන මගින් සිදු කරන ලද පරීක්ෂණවල සාරාංශය පහත දැක්වේ.

වගුව 2.5.1: 2019 වර්ෂයට සාපේක්ෂව විශ්ලේෂණ විද්‍යාගාරයේ මගින් අදාළ කාලය තුළ සිදුකරන ලද පරීක්ෂණවල සාරාංශය පහත දැක්වේ.

පරීක්ෂණයේ නම	පරීක්ෂණ ගණන	
	2019	2020
රසායනික විශ්ලේෂණ ඒකකය		
තේ වල තෙතමනය තීරණය කිරීම	286	280
තේ වල අඩංගු සමස්ථ අළු ප්‍රමාණය තීරණය කිරීම	281	355
තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළු ප්‍රමාණය නිර්ණය කිරීම	280	353
තේ වල අඩංගු ද්‍රාව්‍ය අළුවල ඇති අම්ල ප්‍රමාණය නිර්ණය කිරීම	280	355
තේ වල අඩංගු ජලසාරය තීරණය කිරීම	283	189
තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළුවල ක්ෂාරීයතාව තීරණය කිරීම	273	356
තේ වල ඇති අමු කෙඳි ප්‍රමාණය තීරණය කිරීම	288	420
මූලික විකිරණ නිර්ණය කිරීමේ පරීක්ෂණ	187	150
වෙනත් පරීක්ෂණ (එකතු කරන ලද වර්ණය, පෙල්, මත්පැන්, කැළැල්, රසය, රසායනික හඳුනාගැනීම,	5	-
ශ්‍රේණිය හඳුනා ගැනීමේ පරීක්ෂණ / පෙරන විශ්ලේෂණය	31	27
රසායනික ඒකකයේ පරීක්ෂණ ක්‍රම වලංගු කිරීම, සත්‍යාපනය කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්	21	7
ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය		
සමස්ථ පට්ටක ගණන තීරණය කිරීම	560	171
යීස්ට් සහ පූස් ප්‍රමාණය තීරණය කිරීම	563	579
තේවල ඇති මැරුණු හෝ සජීවී කෘමීන් සහ වෙනත් අපද්‍රව්‍ය / හානිර ද්‍රව්‍ය පිළිබඳ අන්වීක්ෂීය පරීක්ෂණය	37	28
තේවල අඩංගු ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් (GMO) නිර්ණය කිරීම	760	280
මළ කොලිෆෝම් සහ එස්චරිචියා කොලි (E.coli) හඳුනා ගැනීම සහ ගණනය කිරීම	562	544
සම්පූර්ණ කොලිෆෝම් හඳුනා ගැනීම සහ ගණනය කිරීම	564	544
රසායනික ඒකකයේ පරීක්ෂණ ක්‍රම වලංගු කිරීම හා සත්‍යාපනය කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්	28	4
පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය		
ඊතියන්	385	*
මැලතියන්	385	*
සයිපර්මෙට්‍රින්	385	*
β එන්ඩොසල්ෆන්	385	*
බයිෆෙන්ට්‍රින්	385	*
බ්‍රෝමොප්‍රොපිලේට්	385	*
ටෙට්‍රාඩිෆොන්	385	*
එන්ඩෝ සල්ෆන්ස	385	*
HPLC RI අනාවරකය භාවිත කරමින් සීනි පිළිබඳ විශ්ලේෂණය	376	5085
පළිබෝධ නාශක ඒකකයේ පරීක්ෂණ ක්‍රම වලංගු කිරීම හා සත්‍යාපනය කිරීම	-	3
එකතුව	8745	9240

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකයේ අධි තාක්ෂණික මෙවලමෙහි හදිසි තාක්ෂණික බිඳවැටීම හේතුවෙන් 2020 වර්ෂය තුළ සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව අඩු විය.

2.5.2 තේ කර්මාන්තයට පහසුකම් සැලසීම වෙනුවෙන් විශ්ලේෂණ විද්‍යාගාරයේ කාර්යභාරය

සමාලෝචිත වර්ෂය තුළ, විශ්ලේෂණ විද්‍යාගාරය විසින් ලබාගත් මුළු නියැදි 9240 අතරින් අවම ISO 3720 & ISO 11287 ප්‍රමිති මට්ටමට වඩා පහල තේ නියැදි 1411 ක් හඳුනාගෙන ඇත. පරීක්ෂණ අංශ තුනකින් ඉහත කාණ්ඩය යටතේ ප්‍රතික්ෂේප කරන ලද තේ තොග ගණන පහත පරිදි සාරාංශ කොට දැක්වේ.

වගුව 2.5.2 : විශ්ලේෂණ රසායනාගාරයේ කාර්ය සාධනය

විශ්ලේෂණ ඒකකය	අවම තත්ව ප්‍රමිතියට වඩා පහල තේ නියැදි සංඛ්‍යාව
ක්ෂුද්‍රජීව විද්‍යාත්මක	754
රසායනික	348
සීනි/පළිබෝධ නාශක අපද්‍රව්‍ය	309

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.5.2.1 පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

2020 වර්ෂය අවසානයේ දී, තේ කොමසාරිස් අංශයට අනුයුක්ත නියැදි කාර්ය මණ්ඩලය යොදා ගනිමින් තේ කර්මාන්තශාලාවලින් හා තේ වෙන්දේසිවලින් අහඹු ලෙස ලබාගත් තේ සාම්පල භාවිත කරමින් සිදු කළ සීනි විශ්ලේෂණය සඳහා පරීක්ෂණ 5085ක් සිදු කර ඇත. පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය තුළ සිදු කරන ලද සමස්ථ පරීක්ෂණ අතරින්, පහත දක්වා ඇති පරිදි, සීනි සඳහා නියමිත ප්‍රමිතීන්ට සාපේක්ෂව සාම්පල 309ක් බාල තත්ත්වයේ තේ ලෙස හඳුනාගන්නා ලදී.

වගුව 2.5.3 : පළිබෝධනාශක විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

පළිබෝධ නාශක පරීක්ෂණයේ ස්වභාවය	අවම තත්ව ප්‍රමිතියට පහල
ප්‍රමිතිය / උපදෙස් මාලාව	754
ෆ්‍රක්ටෝස	48
ග්ලූකෝස්	94
සුක්‍රෝස්	167

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

එයට අමතරව, කාර්මික නාක්ෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය හා එස්.ජී.එස් ලංකා පුද්ගලික සමාගම හා එක්ව ගෘහස්ථව සංවර්ධනය කරන ලද පරීක්ෂණ ක්‍රමයක් භාවිත කරමින් සීනි සඳහා අන්තර් රසායනාගාර සැසඳීම් දෙකකට (ග්ලූකෝස්, ෆ්‍රක්ටෝස් සහ සුක්‍රෝස් සම්බන්ධයෙන්) පළිබෝධනාශක රසායනාගාරය සහභාගි වී ඇත. අනෙක් අන්තර් රසායනාගාර සංසන්දනය යුරෝෆින්ස් ජීඑම්බීඑච් විද්‍යාගාරය - Eurofins GmbH' lab - (ජර්මනිය) සහ එස්.ජී. එස් ලංකා පුද්ගලික සමාගමේ විද්‍යාගාරය සමඟ 2020 වසරේ දී සිදු කරන ලදී.

2.5.2.2 ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

අභ්‍යන්තර අධීක්ෂණ සේවාව මගින් ලැබුණු සමස්ථ තේ නියැදි 1866 අතරින් තේ නියැදි 754ක් ප්‍රමිතියට වඩා අඩු මට්ටමේ හෝ පරිභෝජනයට සුදුසු නොවන බව හඳුනාගන්නා ලදී. තේ මණ්ඩලයේ නියාමන ක්‍රියාමාර්ග අනුව යමින් තේ කොමසාරිස්වරයා විසින් එම නියැදිවලට අයත් තොගවල තත්වය වෙනස් කිරීමට හා පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

වගුව 2.5.4 : ක්ෂුද්‍රජීවී ඒකකයේ කාර්ය සාධනය

ක්ෂුද්‍ර විද්‍යා පරීක්ෂණයේ ස්වභාවය	අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල
සමස්ථ පට්ටක ගණන	118
යීස්ට් සහ පුස් ප්‍රමාණය	372
කොලිෆෝම්	247
එස්චරීචියා කොලි	17

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.5.2.3 රසායනික විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

තේ කොමසාරිස් විසින් රසායනාගාරයට ඉදිරිපත් කරන ලද සාම්පල අතරින්, තේ සඳහා පැවතිය යුතු අවම ගුණාත්මක ප්‍රමිතීන් පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව, සැක සහිත වීම සහ අසතුටුදායක තත්වයේ පැවතීම හේතුවෙන් විනාශ කරන ලද තේ සම්පලවලට අදාළ පරීක්ෂණ පරාමිතීන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වගුව 2.5.5 : රසායනික විශ්ලේෂණ ඒකකයේ කාර්ය කාර්ය සාධනය

රසායනික පරීක්ෂණයේ ස්වභාවය	අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල
අමු කෙඳි ප්‍රමාණය	256
ක්ෂාරියතා ප්‍රමාණය	20
ජල සාරය	1
සිලිකාමය කරුණු – ද්‍රාව්‍ය නොවන අම්ල	4
සමස්ථ අළු ප්‍රමාණය	3
ජලයේ ද්‍රාව්‍ය අළු	1
තෙතමනය	63

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.5.2.4 තත්ව පරීක්ෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

තේ කොමසාරිස් හෝ නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) විසින් ඉල්ලීම් කළ ආකාරයට, තත්ව කළමනාකරණ නිලධාරී විසින් 2020 වසරේ දී නිල වශයෙන් එක් එක් ප්‍රදේශවලින් ලබා ගත් නියැදි / නැවත නියැදිගත කිරීම් 78 ක් සඳහා තේ අපනයන අංශයට සම්බන්ධ වී සහාය ලබා දී ඇත. පරීක්ෂණාගාරවලින් සිදු කරන සියළුම පරීක්ෂණවල ප්‍රතිඵලවල නිරවද්‍යතාවය රඳා පවතිනුයේ ඒ සඳහා යොදා ගනු ලබන තේ සාම්පලය සහ එමගින් නිරූපිත නිරවද්‍යතාවය මත බැවින්, රසායනාගාර මගින් ක්‍රියාත්මක කරනු ලබන එකී සුවිශේෂ පරීක්ෂණ සඳහා විද්‍යාත්මක නියැදිකරණයක් තේ මණ්ඩලය විසින් සකස් කර තිබේ.

2.5.3 රසායනාගාරයේ සහ එය වැඩිදියුණු කිරීමේ වැඩසටහනෙහි තත්වය

- 2017 ප්‍රමිති යටතේ ප්‍රතිනතය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය නැවත ඇගයීමට භාජනය කර ප්‍රතිනතය ලබා ඇත. රසායනික හා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක පරීක්ෂණ සඳහා ප්‍රතිනතය කිරීම පැරණි ISO 17025: 2005 ප්‍රමිතියේ සිට නව ISO/ IEC 17025:2017 වෙනස් කර ගැනීමට සුදුසුකම් ලැබීය. එම තත්වය විශ්ලේෂණ විද්‍යාගාරය ලද විශිෂ්ට ජයග්‍රහණයකි.

- රසායනාගාර ප්‍රතිනත තත්ත්වය පවත්වා ගැනීම සඳහා, රසායනික, පළිබෝධනාශක සහ ක්ෂුද්‍රජීව විද්‍යාත්මක පරීක්ෂණාගාර සඳහා භාවිතා කරන යාවත්කාලීන ක්‍රමාංකනය කළ විද්‍යාත්මක උපකරණ භාවිත කරමින් පරීක්ෂණ ප්‍රතිඵලවල නිවැරදි බව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වන අතර, 2020 වසරේ පළමු කාර්තුවේදී උපකරණ ක්‍රමාංකනය ලබා ගැනීමට පියවර ගන්නා ලදී.

- විවිධ රසායනික ද්‍රව්‍ය 500 කට අධික ප්‍රමාණයක් පවතී, දෛනිකව සිදුකරන පරීක්ෂණ සඳහා භාවිත කිරීමට විශ්ලේෂණ පසුව, ඒ සඳහා ඊ-ඉන්වෙන්ටරි පාලන පද්ධතිය හඳුන්වා දෙන ලදී.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රසායනාගාරය සඳහා තත්ව, රසායනික, පළිබෝධනාශක හා ක්ෂුද්‍රජීව විද්‍යා යන ක්ෂේත්‍රවලට අදාළව සහකාර අධ්‍යක්ෂක තනතුරු හතරක් ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අවසර ලබා දී ඇත.

2.6 පාලන අංශය

සියළුම මානව සම්පත් කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම, නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීමල තොරතුරු තාක්ෂිණ සේවා ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, තේ මණ්ඩලයේ සැලසුම්, අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සම්බන්ධීකරණය කිරීමල සංඛ්‍යාත්මක තොරතුරු බෙදා හැරීම, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුස්තකාලය කළමනාකරණය කිරීම හා පවත්වාගැනීම, ප්‍රසම්පාදන කටයුතු මෙන්ම මණ්ඩලයේ ආරක්ෂක හා ප්‍රවාහන කටයුතු යන කාරණා පාලන අංශයයේ වගකීම් වේ.

2.6.1 කාර්යමණ්ඩලය

වගුව 2.6.1; ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ චත්මන් කාර්ය මණ්ඩලය

වර්ගය	සාමාජික සංඛ්‍යාව		එකතුව
	පිරිමි	ගැහැනු	
ජේෂ්ඨ මට්ටම	4	2	6(2.2%)
තෘතියික මට්ටම	35	19	54(20.1%)
ද්විතියික මට්ටම	54	90	144(53.8%)
ප්‍රාථමික මට්ටම	59	5	64(23.9%)
එකතුව	152(56.7%)	116(43.3%)	268(100%)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය



2.6.2 පුහුණු වැඩසටහන

චත්මන් වර්ෂය සඳහා සැලසුම් කරන ලද විදේශ පුහුණු වැඩසටහන් සහ දේශීය කණ්ඩායම් ගොඩනැගීමේ ක්‍රියාකාරකම් ගෝලීය වශයෙන් පවතින වසංගත තත්ත්වය හේතුවෙන් සංවිධානය කිරීමට නොහැකි විය. නමුත් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සාමාජිකයින් කිහිප දෙනෙකු සහභාගී වූ අතර ඒවායින් බොහොමයක් මාර්ගගත ආකාරයෙන් පවත්වන ලදී.

වගුව 2.6.2; දේශීය කාණ්ඩය අනුව දේශීය පුහුණු වැඩසටහන්

වර්ගය	පුහුණු කළ සේවක සංඛ්‍යාව
ජේෂ්ඨ මට්ටම	02
තෘතියික මට්ටම	08
ද්විතියික මට්ටම	14
ප්‍රාථමික මට්ටම	03
එකතුව	27

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2.7 අභ්‍යන්තර විගණන ඒකකය

අභ්‍යන්තර විගණන ඒකකයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා රජය, තේ කම්හල් හිමියන්, තේ වෙළෙන්දන්, තේ වතු හිමියන්, ශ්‍රී ලංකාවේ තේ අංශයේ කටයුතු කරන කම්කරුවන් සහ මහජනතාව වැනි ප්‍රධාන පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා එහි මූල්‍ය, පරිපාලන සහ මානව සම්පත් ඵලදායී ලෙස සහ කාර්යක්ෂමව වෙන් කිරීම සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සක්‍රීය කිරීමයි. අභ්‍යන්තර විගණන ඒකකය මගින් අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලීන්හි සඵලතාවය ඇගයීමට සහ වැඩිදියුණු කිරීමට ක්‍රමානුකූල විනයානුකූල ප්‍රවේශයක් ගෙන ඒමෙන් තේ මණ්ඩලයට සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා උපකාර කරයි.

වසංගත තත්ත්වය හේතුවෙන් විගණන කමිටුව සමාලෝචිත වර්ෂය තුළ එක් වරක් රැස් වූ අතර අවශ්‍යතා පදනම මත සිදු කරන ලද ආරාධනයෙන් අදාළ අංශ / කාර්යාල ප්‍රධානීන් කමිටු රැස්වීම්වලට සහභාගි විය. යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා සටහන් හා පසු විපරම් සහිත ව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

2.8 තොරතුරු තාක්ෂණ ඒකකය

2020 වසරේ දී තොරතුරු තාක්ෂණ අංශය විසින් තේ පද්ධතිය සංවර්ධනය කිරීම, විකුණුම් අවස්ථා ක්‍රමයක් (POS) සකස් කිරීම සහ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ආපදා ප්‍රකෘතිකරණ විසඳුම යෙදවීම වැනි බොහෝ ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී.

2.8.1. තේ අගය දාම පද්ධතිය

මණ්ඩලයේ කළමනාකාරිත්වයට අගය දාමය පිළිබඳ වඩාත් නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ලබා ගත හැකි අතර එමගින් මණ්ඩලයේ නිවැරදි දිශානතිය තීරණය කිරීමට ඔවුන්ට හැකි වේ. කොවිඩ් 19 හේතුවෙන් ව්‍යාපෘතිය නතර වී තිබුණ ද, අවශ්‍යතා එක්රැස් කිරීමේ සැසි බොහොමයක් මාර්ගගත ක්‍රමයට සිදු කර ඇත. ව්‍යාපෘතිය අවශ්‍යතා විශ්ලේෂණය නිම කර 2022 වන විට අවසන් කිරීමට සැලසුම් කිරීමේ අවසාන අදියරේ පවතී.

2.8.2 . ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම - www.srilankateaboard.lk

තේ කර්මාන්තයේ අතීත උරුමය සහ තේ මණ්ඩලය මගින් ලබා දෙන සේවාවන් පිළිබඳව දැන ගැනීම සඳහා, සෙවුම් යන්ත්‍ර ප්‍රශස්තිකරණය,භාවිතයට පහසුබව, ප්‍රතිචාර දැක්වීම, ජංගම යෙදුම් භාවිතයෙන් වෙබ් අඩවිය නැරඹිය හැකි බවල හොඳ හැඩතල ගැන්වීම, ඵලදායී සංචාලනය සහ වෙබ් අඩවියට ඉක්මණින් යම් යම් දේවල් එකතු කිරීමේ හැකියාව ආදී නව අංගයන්ගෙන් නිල වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු සිදු වෙමින් පවතී. වසංගත තත්වය හේතුවෙන් ව්‍යාපෘතිය නතර වී තිබුන අතර වර්තමානයේ දී එය සංවර්ධනය කෙරෙමින් පවතී. 2021 වර්ෂ අවසානයේ දී ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු නිම කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය සැලසුම් කරමින් සිටී.

2.8.3. 2020 වසරේ ජයග්‍රහණ

එල්.කේ ඩොමේන් රෙජිස්ට්‍රි ආයතනය මගින් සංවිධානය කරන ලද 2020 රාජ්‍ය අංශයේ හොඳම වෙබ් අඩවියට හිමි ලෝකඩ සම්මානය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දිනා ගෙන ඇත. නිල වෙබ් අඩවිය සඳහා වූ තරගයකදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙවැනි සම්මානයක් දිනාගත් පළමු අවස්ථාව මෙය වන බැවින් එය ඓතිහාසික අවස්ථාවක් විය. එල්.කේ ඩොමේන් රෙජිස්ට්‍රි ආයතනය විසින BestWeb.lk තරගාවලිය 2009 වසරේ සිට වාර්ෂිකව පවත්වනු ලබන අතර මෙය එම තරගය පවත්වනු ලබන දසවන වතාව යි. වර්තමානයේ, ආයතනයකට එහි ඉදිරි දොර ලෙස ආකර්ෂණය හා ඵලදායී වෙබ් අඩවියක් අවශ්‍ය වේ. BestWeb.lk යනු ශ්‍රී ලංකාවේ පවතින වෙබ් අඩවි වර්ධනය කිරීමට සහ ප්‍රවලිත කිරීමට සුවිශේෂී අවස්ථාවක් සපයන වෙබ් පාදක තරගයකි.



3.0 කර්මාන්ත පැතිකඩ

වඩාත් අභියෝගාත්මක වසර ලෙස 2020 වසර සිලෝන් තේ ඉතිහාසයට එක් වුවාට සැකයක් නැත. පෙර නොවූ විරූ පරිදි කොවිඩ් 19 වසංගතය පිළිබඳ අභියෝගයත් සමගින් වසර උදාවිය. මෙම වසංගත තත්ත්වය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දැඩි ලෙස බලපෑ අතර තේ ක්ෂේත්‍රය ද මෙකී වසංගත තත්වයට ගොදුරු විය. වසංගතය අවම කිරීම සඳහා රජය විසින් වසර පුරාවට වරින් වර සංචරණ සීමා සහ ඇඳිරි නීතිය පනවන ලදී. එය ශ්‍රී ලංකා ආර්ථිකයට ඍණාත්මක ලෙස බලපා ඇතත්, බොහෝ දුර්වලතා සාර්ථකව කළමනාකරණය කර ගැනීමට තේ කර්මාන්තය සමත් විය. 2020 වර්ෂය තුළ වාර්තා වූ වාර්ෂික තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් මිලියන 278.9 ක් වූ අතර, පසුගිය වසරේ එම කාලපරිච්ඡේදය තුළ කිලෝ ග්‍රෑම් මිලියන 300.12ක් වාර්තා වූ අතර එය කිලෝ ග්‍රෑම් මිලියන 21.3 ක (7%) අඩුවීම කි. 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල වකවානුව තුළ වගා කළ උඩරට සමස්ථ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 62 ක් වූ අතර එය 2019 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වකවානුවේ අගය වූ කිලෝ ග්‍රෑම් මිලියන 63ට සාපේක්ෂව 1%ක අඩුවීමක් පෙන්නුම් කරයි. මධ්‍යම ප්‍රදේශයේ කි.ග්‍රෑම් මිලියන 46.7ක නිෂ්පාදන ප්‍රතිශතය වූ 1%ක ප්‍රමාණය 2019 වසරේ දී වූ කිලෝ ග්‍රෑම් මිලියන 47.17 හා සසඳන විට කිලෝ ග්‍රෑම් මිලියන 0.4 ක අඩුවීමක් පෙන්නුම් කරයි. පහත රට තේ වගාවේ සමස්ත නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 170 ක් වූ අතර පෙර වර්ෂයේ කිලෝ ග්‍රෑම් මිලියන 190 හා සසඳන විට 11%ක අඩුවීමක් වාර්තා කරයි.

2020 වර්ෂය තුළ සාම්ප්‍රදායික තේ යනු කි.ග්‍රෑ. මිලියන 253ක ප්‍රමාණයක් වාර්තා කළ ප්‍රධාන තේ වර්ගයයි. එය 2019 වර්ෂයේ තුළ කි.ග්‍රෑ. මිලියන 274ක් වූ අතර එම වසරට සාපේක්ෂව 2020 වසරේ දී එය 1.2%ක අඩුවීමකි. එසේම, 2020 වර්ෂය සඳහා සමුච්චිත සී.ටී.සී නිෂ්පාදනය 2%ක වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර සමාලෝචිත වර්ෂයේ දී එය කි.ග්‍රෑ. මිලියන 24ක් විය. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ හරිත තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 2ක් වූ අතර එය 23%ක පහල බැසීමක් වූ අතර 2019 වසරේ දී එය කි.ග්‍රෑ. මිලියන 2.6ක් විය.

ලෝකයේ බොහෝ සේ වෙනස් කළ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වසර සෑම අංශයකටම යහපත් නොවිය. අනපේක්ෂිත ආකාරයෙන් වසංගතය මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති කළ අතර එය ආර්ථිකයට ද මරු පහරක් විය. කෙසේ වෙතත්, තේ සඳහා වූ අඳුරු යුගය හා දුර්භාග්‍යය නොතකා සිලෝන් තේ ඇතැම් අංශ තුළින් මනා කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. වසංගත තත්වය තුළ සිලෝන් තේ සම්බන්ධයෙන් අත්කර ගන්නා ලද ප්‍රධාන ජයග්‍රහණවලින් එකක් වුයේ ලෝක ප්‍රසිද්ධ පොදු වෙන්දේසි කිරීමේ ක්‍රමය එක රැයකින් අතහැර ඩිජිටල් වේදිකාවක් බවට පත් කිරීමයි. සජීවී තේ වෙන්දේසිය වසර 125 කට වැඩි කාලයක සිට පැවති අතර එය තවදුරටත් සිලෝන් තේ අලෙවි ක්‍රමය තුළ නොමැත.

ලොව පුරා තේ කර්මාන්තයේ නියැලී සිටින මිලියන 80 කට අධික පිරිසකට මෙම භයානක වසංගතය වසර මුළුල්ලේම බලපාන ලදී. තේ වගාකරුවන්, නිෂ්පාදකයින් සහ ජීවනෝපාය සපයන්නන් සියල්ලම පාහේ මෙම වසංගතය තුළ දැඩි ලෙස පීඩාවට පත් වූ කණ්ඩායම් වේ. කොවිඩ් 19 පැතිරීම වලක්වා ගැනීම සඳහා බොහොමයක් රටවල් වසා දැමීම ආරම්භ කළ අතර අත්‍යවශ්‍ය සේවා සහ කර්මාන්ත ක්‍රියාත්මක වෙමින් තිබියදී 2020 මාර්තු මැද වන විට මුළු රටම වසා දැමීමට ශ්‍රී ලංකාව විසින් ද තීරණය කරන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේ අදාල කාලවකවානුව හා සැසඳීමේ දී 2020 වසරේ පළමු කාර්තුව තුළ 27%ක ප්‍රමාණයකින් නිෂ්පාදන පහත වැටීමක් වාර්තා වූ අතර එය දෙවන සහ තෙවන කාර්තුව තුළ ද අඩු නිෂ්පාදනයක් දක්නට හැකි විය. එසේ වුවද, සමාලෝචන වසරේ සිව්වන කාර්තුව තුළ තේ කිලෝ ග්‍රෑම් මිලියන 77.4ක් නිෂ්පාදනය කරන ලද අතර එය 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදනය කරන ලද කිලෝ ග්‍රෑම් මිලියන 67.1 හා සසඳන විට 15% ක වර්ධනයකි.

නිෂේධනාත්මක සාධක සහ අනෙකුත් ගෝලීය වෙළෙඳපොළ ප්‍රවණතා හමුවේ සමුච්චිත කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල පෙර වසර තුළ කිලෝවක් සඳහා වූ ඇමෙරිකානු ඩොලර් 3.07 ට සාපේක්ෂව කිලෝවකට ඇමෙරිකානු ඩොලර් 3.39ක් දක්වා ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 වසරේ රුපියල් 628.21ක් වූ කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක මිල රුපියල් 545.02 දක්වා තරමක පහත බැසීමක් පෙන්නුම් කරන ලදී.

වසර තුළ ශ්‍රී ලංකාවෙන් තේ මෙට්‍රික් ටොන් 265,569ක් අපනයනය කර ඇති අතර එමගින් රුපියල් බිලියන 230ක (ඇමරිකානු ඩොලර් බිලියන 1.2ක) ආදායමක් උපයා ඇත (ප්‍රති අපනයන සහිතව). FOB මිලෙහි සාමාන්‍ය අගය රුපියල් 866.70ක් (ඇ.ඩො 4.67) විය. සමාලෝචන වර්ෂය තුළ මුළු අපනයන පරිමාව (ප්‍රති අපනයන සමඟ) මෙට්‍රික් ටොන් 27,087 ක පහත බැසීමක් වාර්තා කළ අතර අපනයන ඉපැයීම් 10%කින් අඩු විය.

3.1 තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ තේ වගා කරන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 202,540කි.(2016 තේ ඉඩම් ලියාපදිංචි දත්ත, යාවත්කාලීන වෙනස්වීය හැක). කළමනාකරණ නිර්ණායක අනුව මෙම තේ වතු පෞද්ගලික අංශය (60%) සහ රාජ්‍ය අංශය(40%) යනුවෙන් වර්ග කළ හැකිය. මෙරට තේ වගාව ව්‍යාප්තව ඇත්තේ දිස්ත්‍රික්ක කිහිපයක් තුළය. එනම්, ප්‍රධාන වශයෙන් තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්වයන් හේතුකොටගෙන තෙත් කලාපයේ ය.

3.2 තේ නිෂ්පාදනය

2020 වසර තුළ ශ්‍රී ලංකාවේ ජාතික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 300.1ක සිට කිලෝග්‍රෑම් මිලියන 278.8ක් දක්වා පහත බසින ලදී., කෙසේ වෙතත්, එය 2019 වසර ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 21ක හිඟයකි (7%ක අඩුවීමකි)

ශ්‍රී ලංකාව භූමියේ විවිධ මුහුදු මට්ටම්වල සිට තේ වගාකරන අතර වැඩි වශයෙන් පහත රට තේ නිපදවනු ලබයි. මුහුදු මට්ටමේ සිට මීටර් 600 දක්වා පරාසයක් තුළ වූ උස් භූමි මට්ටම්වල මෙම තේ ප්‍රධාන වශයෙන් වගාකරන අතර තද රසයකින් හා වර්ණයකින් යුක්ත වේ. උඩරට තේ මීටර් 1,200 වැඩි උන්නතාංශයකින් යුත් භූමිවල වගාකරන අතර සාමාන්‍යයෙන් ඒවා මනා රසයකින් හා සුවඳකින් යුත් උසස්ම තත්වයේ තේ ලෙස සලකනු ලැබේ.

ආදායම් මට්ටම් ඉහළ යාම සහ වැඩි ඉල්ලුම හේතු කොටගෙන පහත රට තේ නිෂ්පාදනයේ මෑත කාලීනව වැඩිවීමක් සිදුවී ඇත. ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (61%) වඩා වැඩි ප්‍රමාණයකට පහත රට තේ නිෂ්පාදනය දායක වී ඇති අතර උඩ රට සහ මැද රට තේ නිෂ්පාදනයන් පිළිවෙලින් 22%කින් සහ 17%ක දායකත්වයක් සපයා ඇත.

වගුව 3.1 උන්නතාංශය අනුව තේ නිෂ්පාදනය

උන්නතාංශය	ප්‍රමාණය කි.ග්‍රෑ.
ඉහල	62,242,494
මධ්‍යම	46,732,256
පහල	169,877,015
එකතුව	278,851,765

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ප්‍රස්ථාරය 3.1 උන්නතාංශය අනුව සමස්ථ තේ නිෂ්පාදනය (%)



මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

3.2.1 මාසික තේ නිෂ්පාදනය

වසර පුරාම සෑම මාසයකම පහතරට තේ නිෂ්පාදනය මගින් ජාතික තේ නිෂ්පාදනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලැබුණි. මෙම වසරේදී ඉහළම මාසික තේ නිෂ්පාදනය දෙසැම්බර් හා මැයි මාසය තුළදී වාර්තා වූ අතර අවම නිෂ්පාදනයක් වාර්තා වුයේ මාර්තු මාසයේ දී ය. එය කිලෝ ග්‍රෑම් මිලියන 34ක් විය. එසේම, සමාලෝචන වර්ෂය තුළ වාර්තා වූ ඉහලම මාසික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 29ක ප්‍රමාණයක් වූ අතර අවම නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 14කි. අවාසනාවන්ත ලෙස වසර ආරම්භ වුයේ කොවිඩ් 19 වසංගතය පැතිර යාමත් සමග වන අතර මාර්තු මාසය මැද භාගයේදී රට මාස කිහිපයකට වසා දමන ලදී. මේ තත්වය යටතේ රජය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව සකස්වීමට යම් කාලයක් ගත වූ හෙයින් මාර්තු මාසයේ තේ නිෂ්පාදනය නැවත වතාවක් පහත වැටුණි. කෙසේ වෙතත්, වසරේ ඉතිරි මාසවල දී සාමාන්‍ය තත්වයට පත් වීමට හැකි වූ අතර ඉහත සියලු හේතු නිසාවෙන් සමස්ථ තේ නිෂ්පාදනය 7% කින් අඩු විය.

ප්‍රස්තාරය 3.2: භූමියේ උස අනුව මාසික තේ නිෂ්පාදනය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

3.2.2 දිස්ත්‍රික්ක අනුව කෘෂි දේශගුණික විශ්ලේෂණය

පිළිවෙළින් කිලෝ ග්‍රෑම් මිලියන 48ක සහ කිලෝ ග්‍රෑම් මිලියන 37ක ප්‍රමාණයකින් නිෂ්පාදන දායකත්වයක් සපයමින් කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදන ලැයිස්තුවේ ඉහළම තැන රැඳී සිටීමට රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක දෙක තවදුරටත් සමත් විය. 2019 වසරට සාපේක්ෂව, ඌව කෘෂි කලාපය තුළ වර්ධනයක් පෙන්නුම් කළ අතර අනෙකුත් උප දිස්ත්‍රික්ක තුළ නිෂ්පාදනයේ අඩුවීමක් පෙන්නුම් කරන ලදී. සමස්ත පහතරට තේ වගාව සමාලෝචිත වර්ෂය තුළ දී කිලෝ ග්‍රෑම් මිලියන 156.7ක් වූ අතර එය වසරේ දී එය කිලෝ ග්‍රෑම් මිලියන 176.9ක් විය.

වගුව 3.2 : කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක	2020 (කි.ග්‍රෑ)	* 2019 (කි.ග්‍රෑ)	වෙනස(කි.ග්‍රෑ)	%
නුවරඑළිය	2,858,604	3,224,893	(366,289)	(11)
ඛටහිර				
රම්බොඩ	1,832,914	1,835,212	(2,298)	(0)
පුඩුලු ඔය	3,564,815	3,757,804	(192,989)	(5)
ආගරපතන	4,536,186	5,502,557	(966,370)	(18)
නානුඔය/ ලිඳුල/ තලවකැලේ	8,062,390	9,014,602	(952,213)	(11)
පතන / කොටගල	4,475,252	3,820,764	654,489	17
හැටන් / දික්ඔය	7,844,983	7,353,296	491,688	7
ඩොගවන්තලාව	5,612,580	5,729,970	(117,391)	(2)
අප් කොට් / මස්කෙළිය	5,049,048	5,792,133	(743,085)	(13)
ඛටහිර එකතුව	40,978,167	42,806,337	(1,828,171)	(4)
මධ්‍යම				
වටවල/ ගිනිගත්හේන/ නෝටන් බ්‍රිජ්	2,163,883	1,602,682	561,201	35
පුස්සැල්ලාව/ හේවාහැට	6,005,389	6,136,278	(130,890)	(2)
කොත්මලේ	876,354	821,148	55,207	7
ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ	17,718,123	18,609,887	(891,764)	(5)
නිලඹේ/ හන්තාන/ ගලහ	1,447,513	1,582,180	(134,667)	(9)
කඩුගන්නාව	4,642,927	5,851,934	(1,209,008)	(21)
මඩුල්කැලේ / නකල්ස් / රන්ගල	3,383,210	3,698,221	(315,011)	(9)
හුන්නස්ගිරිය / මාතලේ / යක්දෙස්ස	1,386,413	1,034,738	351,674	34
බලංගොඩ / රක්වාන	8,027,660	7,764,480	263,181	3
මධ්‍යම එකතුව	45,651,470	47,101,548	(1,450,077)	(3)
උඩපුස්සැල්ලාව				
උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය	3,944,295	3,493,639	450,656	13
මතුරට	935,085	1,851,921	(916,836)	(50)
උඩපුස්සැල්ලාව එකතුව	4,879,380	5,345,560	(466,180)	(9)
ඌව				
කොස්ලන්ද/ හල්දුමුල්ල	817,742	716,941	100,801	14
හපුතලේ	3,598,688	2,950,758	647,930	22
බණ්ඩාරවෙල/ පුනාගල	2,520,658	2,691,370	(170,713)	(6)
මල්වත්ත/ වැලිමඩ	2,858,823	3,085,071	(226,248)	(7)
දෙමෝදර/ හාලිඇල/ බදුල්ල	9,543,215	8,605,150	938,064	11
ඇල්ල/නමුනුකුළ	1,737,631	1,461,490	276,141	19
පස්සර/ ලුණුගල	3,011,099	2,601,666	409,433	16
මඩුල්සිම	3,657,828	2,607,817	1,050,011	40
ඌව එකතුව	27,745,683	24,720,262	3,025,421	12
පහතරට				
දෙනියාය	12,942,346	14,338,749	(1,396,402)	(10)
ගාල්ල	37,496,469	43,786,962	(6,290,493)	(14)
කළුතර	18,444,550	22,485,555	(4,041,005)	(18)
කෑගල්ල	6,439,832	7,037,251	(597,419)	(8)
කැලණි මිටියාවත	7,310,799	7,874,180	(563,381)	(7)
මහනුවර/ මාතලේ/ කුරුණෑගල	3,829,102	4,115,010	(285,908)	(7)
මාතර	11,941,807	15,016,653	(3,074,845)	(20)
මොරවක	5,620,667	6,062,701	(442,034)	(7)
රත්නපුර	47,734,905	51,055,836	(3,320,931)	(7)
බලන්ගොඩ	4,977,985	5,149,175	(171,191)	(3)
පහතරට එකතුව	156,738,462	176,922,070	(20,183,608)	(11)
එකතුව	278,851,765	300,120,670	(21,268,904)	(7)

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)* ප්‍රතිශෝධනය කර ඇත.

3.2.3 දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

සමාලෝචිත වසර තුළදී ඉහළම උඩරට තේ නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ද ඉහළම පහත රට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය. මෙම දිස්ත්‍රික්ක දෙකම ජාතික තේ නිෂ්පාදනයට 16% කින් සහ 22% කින් පිළිවෙලින් දායක විය. එමෙන්ම, සියලු උන්නතාංශ කලාප තුන අතරින් රත්නපුර දිස්ත්‍රික්කය ඉහලම නිෂ්පාදනය වාර්තා කළ අතර අඩුම නිෂ්පාදනය හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.

වගුව 3.3: දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ)

දිස්ත්‍රික්කය	ඉහල	මධ්‍යම	පහල	එකතුව
	ප්‍රමාණය (කිලෝ)	ප්‍රමාණය (කිලෝ)	ප්‍රමාණය (කිලෝ)	ප්‍රමාණය (කිලෝ)
බදුල්ල	16,761,796	11,360,549	-	28,122,345
කොළඹ	-	-	1,049,512	1,049,512
ගාල්ල	-	-	37,256,583	37,256,583
හම්බන්තොට	-	-	125,973	125,973
කළුතර	-	-	17,466,761	17,466,761
මහනුවර	733,818	19,789,096	10,486,181	31,009,095
කෑගල්ල	-	244,929	9,282,363	9,527,292
මාතලේ	-	1,681,986	315,197	1,997,183
මාතර	-	67,827	30,976,390	31,044,216
මොණරාගල	-	-	-	-
නුවරඑළිය	44,590,574	11,393,365	945,188	56,929,126
රත්නපුර	156,307	2,194,505	61,972,868	64,323,680
එකතුව	62,242,494	46,732,256	169,877,015	278,851,765

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

3.2.4 අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්තශාලාවක සමස්ත තේ නිෂ්පාදනය ඔවුන්ගේම වතුවලින් හෝ අනෙකුත් වතුවලින් එකතුකර ගත් දළු මෙන්ම සැපයුම්කරුවන් වෙතින් මිලදී ගත් තේ දළුවලින් සමන්විත වේ. පහත සඳහන් වගුව මගින් 2020 වසරේ සමස්ත තේ නිෂ්පාදනය සඳහා දායක වූ දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදයන් නිරූපනය කෙරේ. දළු කිලෝ ග්‍රෑම් 4.65කින් නිමි තේ කිලෝ ග්‍රෑම් 1ක් නිම කරන්නේය යන පදනම මත සමස්ථ අමු තේ දළු නිෂ්පාදනය ගණනය කරනු ලැබේ.

වගුව 3.4: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ)

දිස්ත්‍රික්කය	ඉහල	මධ්‍යම	පහල	එකතුව
	ප්‍රමාණය (කිලෝ)	ප්‍රමාණය (කිලෝ)	ප්‍රමාණය (කිලෝ)	ප්‍රමාණය (කිලෝ)
බදුල්ල	77,942,350	52,826,552	-	130,768,902
කොළඹ	-	-	4,880,231	4,880,231
ගාල්ල	-	-	173,243,109	173,243,109
හම්බන්තොට	-	-	585,774	585,774
කළුතර	-	-	81,220,440	81,220,440
මහනුවර	3,412,254	92,019,297	48,760,742	144,192,293
කෑගල්ල	-	1,138,920	43,162,988	44,301,908
මාතලේ	-	7,821,234	1,465,666	9,286,900
මාතර	-	315,393	144,040,212	144,355,605
මොණරාගල	-	-	-	-
නුවරඑළිය	207,346,168	52,979,147	4,395,122	264,720,437
රත්නපුර	726,828	10,204,446	288,173,837	299,105,111
එකතුව	289,427,599	217,304,990	789,928,121	1,296,660,709

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

3.2.5 සැකසුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

3.2.5.1 කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2020 වසර තුළදී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය සහ සී.ටී.සී. තේ නිෂ්පාදනය පිළිවෙලින් 8% කින් සහ 2%කින් පහත වැටීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වසර තුළදී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 21 කින් (7%) පහතවැටී ඇත. හරිත තේ නිෂ්පාදනය පෙර වර්ෂය හා සැසඳීමේදී 23%ක වැටීමක් පෙන්නුම් කරයි.

3.2.5.2 ක්ෂණික තේ සහ පෙව තේ නිෂ්පාදනය

2019 වසර හා සැසඳීමේ දී 2020 වසර තුළදී ක්ෂණික තේ හා පෙව තේ නිෂ්පාදනය මෙට්‍රො.1,289 කින් පහල යාමක් පෙන්නුම් කරන අතර පෙව තේ නිෂ්පාදනය තුළ මෙට්‍රො 21ක පහත වැටීමක් පෙන්නුම් කරයි. විශේෂයෙන්, ක්ෂණික තේවලින් 99%ක්ම වාර්තා වන්නේ ඉහල උන්නතාංශයක් සහිත භූමි ප්‍රදේශවල පිහිටි කර්මාන්තශාලා තුළිනි.

3.2.6 නිමි තේ නිෂ්පාදන වියදම

ඵලදායිතාවය සහ නිෂ්පාදන වියදම එකිනෙකට සම්බන්ධ කාරණාවන අතර නිෂ්පාදන වියදම ඉහළයාම වැවිලිකරණ අංශය තුළ බොහෝවිට දැකිය හැකි කණගාටුදායක කරුණක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදනයේ දී ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍යවන අතර ශ්‍රම ඵලදායිතාව හා නිෂ්පාදන වියදම අතර දැඩි සම්බන්දතාවයක් පවතී. තේ නිපදවන ප්‍රධාන පෙලේ රටවල් අතර ශ්‍රී ලංකාව තුළ ඉහළ නිෂ්පාදන වියදමක් දැකිය හැක. ගෝලිය සන්දර්භය තුළ සිලෝන් තේ සඳහා වන තරගකාරීත්වය කෙරෙහි මෙම තත්වය බලපා ඇත.

නිමි තේ කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම පසුගිය දශකය තුළ සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. ශ්‍රම පිරිවැය සහ යෙදවුම් මිල ඉහළ යාම විශේෂයෙන් නිෂ්පාදන වියදම සඳහා බලපා තිබුණි. 2019/2020 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව තේ කිලෝ ග්‍රෑමයක් සඳහා වාර්ෂික නිෂ්පාදන වියදම රැපියල් 492.48 වූ අතර එය 2028/19 හා සැසඳීමේදි 1.8% ක වර්ධනයකි.

සටහන: පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් නිෂ්පාදන පිරිවැය පිළිබඳ ප්‍රශ්නාවලි සඳහා තොරතුරු රැස් කිරීමට නොහැකි විය. එමනිසා, 2019/2020 වසර සඳහා නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු ගත ප්‍රමාණයක් වශයෙන් දක්වා ඇත.

ප්‍රස්තාරය 3.3: නිමි තේ කිලෝවක සමස්ත පිරිවැය



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

3.3 තේ අලෙවිය

2020 වර්ෂය තුළ දේශීය තේ අලෙවි මිල ගණන් හොඳ මට්ටමකින් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට නොහැකි විය. 2020 වසරේ දී තේ කිලෝ ග්‍රෑමයක ජාතික සාමාන්‍ය මිල වූ රු.628.21ක ප්‍රමාණය 2019 වසර තුළ මිල වූ රු.545.02 සමග සැසඳීමේ දී රු.83ක වර්ධනය කි. 2020 වර්ෂය තුළ කිලෝ ග්‍රෑමයක මාසික තේ මිල රු.580 සිට රු. 700 දක්වා පරාසයක පැවතුනි. පසුගිය වසර හා සැසඳීමේ දී සියලු උන්නතාංශ මට්ටම්වල තේ පැහැදිලි වර්ධනයක් වාර්තා කර ඇත. සියලු උන්නතාංශ අතරින් පහත රට තේ මගින් රු.666ක් වූ කිලෝ ග්‍රෑමයක මිල වාර්තා කරන ලදී.

වාර්ෂික විකුණුම් ප්‍රමාණයවන තේ කිලෝ ග්‍රෑම් මිලියන 268.2ක් 2020 වසරේ දී විකුණන ලද අතර 2019 වසරේ දී එය තේ කිලෝ ග්‍රෑම් මිලියන 301.9ක් විය. එනම්, රාජ්‍ය, පෞද්ගලික සහ සෘජු විකුණුම් ද ඇතුළුව සමාලෝචන වර්ෂය සඳහා එය මිලියන 34ක (11%) පහත බැසීම කි.

3.3.1 අලෙවි ක්‍රම

කර්මාන්තශාලාවල නිපදවන තේ අලෙවි කරන ප්‍රධාන මාදිලිය වන්නේ ප්‍රසිද්ධ වෙන්දේසියයි. 2020 වසරේදි තේ කිලෝ ග්‍රෑම් මිලියන 261.7ක ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ දී අලෙවි කරන ලදී. පෞද්ගලික විකුණුම් කිලෝ ග්‍රෑම් මිලියන 5ක් වූ අතර ඉතිරි කිලෝ ග්‍රෑම් මිලියන 1.5ක ප්‍රමාණය සෘජු විකුණුම් හරහා අලෙවි කරන ලදී.

3.3.2 කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වාණිජ මණ්ඩලය මගින් පවත්වන කොළඹ තේ වෙන්දේසිය 2020 වසර තුළ දී වෙන්දේසි 51ක් පවත්වන ලදී. ප්‍රසිද්ධ වෙන්දේසියේදී කිලෝ ග්‍රෑම් මිලියන 32ක (11%) ක අඩු වීමක් වාර්තා විය. එම වසර තුළදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 85ක වැඩි වීමක් කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය මිල තුළ දැකිය හැකි විය.

3.3.3 භූමි උන්නතාංශය අනුව අලෙවිය

පසුගිය වසර හා සැසඳීමේදිල සියලු උන්නතාංශ කලාප තුනෙහිම තේ වල ඒකක මිල ඉහල ගොස් ඇත. කෙසේ වෙතත්, ප්‍රමාණයේ සෘණාත්මක වර්ධනයක් ඇත.

වගුව 3.5: භූමි උන්නතාංශය අනුව තේ අලෙවිය

උන්නතාංශය	ප්‍රමාණය(මි.කි.ග්‍රෑම්)			
	2019	2020	වෙනස	%
උඩරට	59.97	56.46	(3.51)	(5.85)
මැදරට	52.14	47.56	(4.58)	(8.78)
පහත රට	189.81	164.21	(25.60)	(13.49)
මුළු විකුණුම්	301.92	268.24	(33.68)	(11.16)
	ඒකක මිල (රු./කි.ග්‍රෑම්)			
උඩරට	509.4	580.90	71.50	14.04
මැදරට	470.96	554.28	83.32	17.69
පහත රට	576.62	665.88	89.26	15.48
මුළු විකුණුම් මිල	545.02	628.21	83.19	15.26

මූලාශ්‍රය: අලෙවි වාර්තාව - උන්නතාංශය අනුව සියලු විකුණුම් - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

3.4 තේ අපනයනය

සමාලෝචන වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 265.6ක් වූ සමස්ත තේ අපනයනය (ප්‍රති අපනයනය ඇතුළුව) කිලෝ ග්‍රෑම් 27 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර 2019 වර්ෂය සඳහා එය කිලෝ ග්‍රෑම් මිලියන 292.7ක් විය. සමාලෝචිත වර්ෂයේදී රුපියල් බිලියන 230.2ක් වූ ඉපයීම් රුපියල් බිලියන 10ක පාඩුවක් පෙන්නුම් කළ අතර 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉපයීම වූයේ රුපියල් බිලියන 240.6කි. 2020 වසර තුළ දී සාමාන්‍ය වාර්ෂික FOB ඒකක මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 866.70ක් වූ අතර සාපේක්ෂව එය පසුගිය වසරේ කිලෝග්‍රෑමයකට රුපියල් 822.25ක් ලෙස වාර්තා විය. එනම්, රු.44ක වැඩි වීමකි.ලෝක තේ වෙළෙඳපොළ තුළ තේ අපනයනය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව විකුණුම් ප්‍රමාණය අතින් තුන්වන ස්ථානයේ පසුවන අතර තේ මගින් ආදායම් ලබන රටවල් අතරින් ද තුන්වන ස්ථානය හිමිකරගෙන සිටී. ගෝලීය තේ වෙළඳපොල තුළ ගුණාත්මක තේ සපයනු ලබන රටක් වශයෙන් ඉදිරියට යාමට ශ්‍රී ලංකාව සතු හැකියාව එමගින් පෙන්නුම් කෙරේ.

තරගකරුවන් තුළ දැකිය හැකි දැඩි තරගකාරිත්වය රටෙහි තරගකාරී තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇති අතර මෙම තත්වය ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන වියදම අධික වීම සහ තේ අස්වැන්න පහළ මට්ටමක පැවතීම යන කරුණු හේතුවෙන් වඩාත් උග්‍ර වී ඇත. ඊට අමතරව ගෝලීය තේ පරිභෝජකයන්ගේ වෙනස්වන රුචිකත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තවදුරටත් CTC තේවලින් බැහැරව සම්ප්‍රදායික තේ මත ම රැඳීසිටීමෙන් තම වෙළෙඳපොළ කොටස අහිමි වී යාමට ඉඩ තිබේ.

ප්‍රස්තාරය 3.4: මාසික තේ අපනයන ප්‍රමාණයන් සහ FOB මිල ගණන්



මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.4.1 වාර්ෂික තේ අපනයන -2020

ප්‍රස්තාරය 3.6: සමස්ත මාසික තේ අපනයනය 2020 - ප්‍රමාණය සහ ඒකක අගය

	ප්‍රමාණය (කි.ග්‍රෑම්)	වටිනාකම (රු)	FOB (රු./කි.ග්‍රෑම්)
අපනයනය			
කළු තේ			
මුළු	18,327,423	27,369,531,704	1,493.36
තොග	116,960,915	88,079,515,543	753.07
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	1,017,975	752,398,948	739.11
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	18,296,831	14,471,722,027	790.94
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	69,872,720	62,208,072,325	890.31
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	27,301,825	17,741,677,418	649.83
සමස්ථ කළු තේ	251,777,689	210,622,917,965	836.54
හරිත තේ			
මළු	752,051	2,244,893,392	2,985.03
තොග	358,143	425,770,040	1,188.83
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	3,395	5,857,434	1,725.16
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	5,674	12,359,438	2,178.26
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	847,413	1,379,710,035	1,628.14
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	20,307	39,335,283	1,937.01
සමස්ථ හරිත තේ	1,986,984	4,107,925,622	2,067.42
ක්ෂණික තේ			
මළු	-	-	-
ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි)	2,810,033	4,065,717,121	1,446.86
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	500	775,924	1,551.85
සමස්ථ ක්ෂණික තේ	2,810,533	4,066,493,045	1,446.88
ප්‍රති අපනයනය	8,994,167	11,372,582,174	1,264.44
කළු තේ			
මළු	3,845,312	4,471,520,029	1,162.85
තොග	1,289,680	875,459,151	678.82
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	80	662,173	8,244.19
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	46,181	125,766,527	2,723.36
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	1,586,820	1,500,140,903	945.38
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	54,099	73,082,603	1,350.90
සමස්ථ කළු තේ	6,822,172	7,046,631,386	1,032.90
හරිත තේ			
මළු	1,058,091	3,020,833,943	2,854.99
තොග	224,204	173,995,261	776.06
ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ)	3,784	4,798,516	1,268.19
ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ)	53	27,651	518.78
ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ)	818,251	1,044,103,045	1,276.02
ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ)	35,006	41,754,316	1,192.78
සමස්ථ හරිත තේ	2,139,389	4,285,512,732	2,003.15
ක්ෂණික තේ			
මළු	158	308,556	1,952.89
ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි)	32,448	40,129,500	1,236.74
සමස්ථ ක්ෂණික තේ	32,606	40,438,056	1,240.21
මුළු එකතුව	265,569,374	230,169,918,806	866.70
පානය සඳහා සැකසූ තේ	1,809	4,292,047	2,371.97

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.4.2 වර්ග අනුව තේ අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් සලකා බැලීමේදී, තේ දළුවල සම්භවය හා ගුණාත්මකභාවය අනුව තේ සඳහා ඇති රුචිකත්වය සැලකිය යුතු අන්දමෙන් වෙනස් වේ. නිදසුනක් ලෙස, මැද පෙරදිග සහ පොදුරාජ්‍ය මණ්ඩලයට අයත් ස්වාධීන රටවල් (CIS) තුළ මුලික වශයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන පහත රට, සාම්ප්‍රදායික, තද රසයක් සහිත තේ සඳහා ඉල්ලුමක් පවතී. 2020 වසරේදී, ප්‍රති අපනයනයන් ද සහිතව සමස්ත කළු තේ, හරිත තේ සහ ක්ෂණික තේ අපනයනය ප්‍රමාණාත්මකව හා වටිනාකම අතින් පහත බැසීමක් පෙන්නුම් කරයි. සාමාන්‍යයෙන් කළු තේ අපනයන ප්‍රතිශතය ආසන්න වශයෙන් සෑම වසරකම 97%ක් වන අතර හරිත තේ ප්‍රතිශතය 2%ක් පමණ හා ක්ෂණික තේ අපනයනය 1%ක් වශයෙන් පවතී.

කිලෝ ග්‍රෑම් මිලියන 27ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 9%ක පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. අපනයන සහ ප්‍රති අපනයන වෙන් වෙන් වශයෙන් ප්‍රමාණයෙන් හා වටිනාකමෙන් පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. තවද, අපනයන සහ ප්‍රති අපනයන ප්‍රමාණයෙන් පිළිවෙලින් 9%ක හා 8%ක පහත වැටීමක් වාර්තා කළ අතර වටිනාකම ද පිළිවෙලින් 3%කින් හා 11%කින් පහත බැසීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 1,346ක් වූ සමුච්චිත අපනයන ආදායමට සාපේක්ෂව 2020 වසරේදී එය ඇමරිකානු ඩොලර් මිලියන 1,240ක් වූ අතර එය 8%ක පහත වැටීමකි.

3.4.3 අගය එකතු කළ තේ අපනයන

තේ සඳහා වූ ගෝලීය රුචිකත්වය අගය එකතු කළ තේ කරා සිඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින අතර ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෙළඳපොළ තත්වය ආරක්ෂා කර ගැනීම උදෙසා එකී වෙනස්කම්වලට ශ්‍රී ලංකාව අනුගත විය යුතුය. අගය එකතු කළ තේ එනම් කි. ග්‍රෑම් 03 වඩා අඩු ඇසුරුම්, තේ මුළු සහ ක්ෂණික තේ අපනයනය 2020 වසරේ සමස්ත තේ අපනයනයෙන් 38%ක් විය. එමගින් උපයාගත් ආදායම රුපියල් බිලියන 108 ක් වූ අතර එය සමස්ත අපනයන ආදායමෙන් 47%ක් විය.

වගුව 3.7: වාර්ෂික අගය එකතු කළ තේ අපනයනය – 2020

අපනයන වර්ගය		ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වටිනාකම (රු.)	FOB (රු./ කි.ග්‍රෑ.)
අපනයනය	කළු තේ	89,218,119	90,330,002,977	1,012.46
	හරිත තේ	1,602,860	3,630,460,861	2,264.99
	ක්ෂණික තේ	2,810,533	4,066,493,045	1,446.88
උප එකතුව		**93,631,512**	**98,026,956,883**	**1,046.94**
ප්‍රති අපනයනය	කළු තේ	5,432,212	5,972,323,105	1,099.43
	හරිත තේ	1,880,125	4,069,735,504	2,164.61
	ක්ෂණික තේ	32,606	40,438,056	1,240.21
උප එකතුව		7,344,943	10,082,496,665	1,372.71
එකතුව		**100,976,455**	**108,109,453,548**	**1,070.64**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

තොග තේ සහ අගය එකතු කළ තේ සඳහා FOB මිල පහත සටහනින් දැක්වේ. අගය එකතු කළ තේ සඳහා FOB මිල තොග තේ මිලට වඩා වැඩිය. එබැවින් තොග තේ වලට වඩා අගය එකතු කළ තේ අපනයනය සඳහා වන ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දේ. සමාලෝචන වර්ෂය තුළ අගය එකතු කළ තේ හා තොග තේ යන දෙවර්ගයම සඳහා FOB මිලෙහි ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කිලෝග්‍රෑම් 3ක් දක්වා අපනයන කාණ්ඩ අගය එකතු කළ තේ වශයෙන් සලකා ඇත.

ප්‍රස්තාරය 3.5: අගය එකතු කළ තේ අපනයනය සහ තොග තේ අපනයනය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.4.4 ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

අතීතයේ දී, එක්සත් රාජධානිය, පකිස්ථානය හා රුසියාව තුළ ශ්‍රී ලංකා තේ සඳහා ශක්තිමත් වෙළඳපොලක් පැවතුන නමුත් වත්මනේ දී ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 25 අතර එකී රටවල් නොපවතී. කෙසේ වෙතත්, සමස්ත ශ්‍රී ලංකා තේ අපනයනයෙන් 14.6 %ක් තුර්කිය විසින් ආනයනය කරමින් 2020 වසරේ දී ශ්‍රී ලංකා තේ ආනයනය කරන ප්‍රධාන රටවල් අතර පළමු ස්ථානයේ රැඳී සිටීමට සමත් වී ඇති අතර 2019 වසරට සාපේක්ෂව එය 0.5%ක පහත බැසීමක් පෙන්නුම් කර ඇත. 2017 දී ශ්‍රී ලංකා තේ වැඩිපුරම අපනයනය කරන රට තුර්කිය වූ අතර සමස්ත තේ අපනයනයෙන් 13.09%ක් එමගින් ආනයනය කර තිබුණි. 2018 දී ඉරාකය විසින් 2017 දී තුර්කියට හිමිවූ මට්ටම අභිබවා පළමු ස්ථානයට පැමිණ තිබේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා තේ කිලෝ ග්‍රෑම් මිලියන 39ක ප්‍රමාණයක් ආනයනය කරමින් 2019 වසරේ දී තුර්කිය පළමු ස්ථානයට පත් වූ අතර 2020 වසරේ දී පවා නැවත වතාවක් තුර්කිය ශ්‍රී ලංකා තේ ආනයනය අතින් පළමු ස්ථානයට පත් විය.

2013 වසර දක්වා ලංකා තේ අපනයනය කරන ප්‍රධාන රටවල් අතර පළමු ස්ථානය හිමිකර ගැනීමට රුසියාව සමත් විය. නමුත් තුර්කිය තුළ වූ ශ්‍රී ලංකා තේ සඳහා ඉල්ලුම සහ රුසියාවේ දේශපාලන සහ ආර්ථික අස්ථාවරත්වය යනාදී කරුණු නිසාවෙන් 2014 වසරේදී රුසියාව, ශ්‍රී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය අනුව දෙවන ස්ථානයට පත්විය. 2015 වසරේදී නැවතත් රුසියාව පළමු ස්ථානයට පත් වූ අතර 2016 වසරේදී ද එම ස්ථානය රැකගැනීමට සමත්විය. 2017 සිට 2020 දක්වා ශ්‍රී ලංකා තේ ආනයනය කරන රටවල් අතර තුන්වන ස්ථානය බවට රුසියාව පත් වූ අතර ඉරාකය නැවත වතාවක් රුසියාව අභිබවා දෙවන ස්ථානය බවට පත් විය.

2020 වසරේ දී 13%ක අපනයන කොටසක් සහිතව දෙවන අපනයන රට බවට ඉරාකය පත් වූ අතර එය 2019ට සාපේක්ෂව අපනයන ප්‍රමාණයේ 13%ක අඩුවීමක් පෙන්නුම් කරයි. ඉරානය සඳහා FOB මිලෙහි සාමාන්‍ය අගය 2020 වසරේ දී ඉහළම රටවල් දහය අතරින් ඉහළ මිලක් පෙන්නුම් කළ අතර එය කිලෝ ග්‍රෑමයකට රුපියල් 915ක් විය. ප්‍රධාන රටවල් දහය අතරින් රුසියාව, චීනය හා චිලී යන රටවල් විසින් ශ්‍රී ලංකා තේ ආනයන ප්‍රමාණයක් වැඩි කර ඇති අතර තුර්කිය, ඉරාකය, ඉරානය, අසර්බයිජානය, සිරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා ලිබියාව විසින් 2019 වසරට සාපේක්ෂව 2020 වසර තුළ අඩු ප්‍රමාණයක් ආනයනය කර ඇත. කෙසේ වෙතත්, ඉහළම අපනයන රටවල් දහය (10) තුළ 2019 වසරට සාපේක්ෂව 8%ක අඩුවීමක් වාර්තා විය.

වගුව 3.8: ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල්

රට	2020				2019				
	ස්ථානය	ප්‍රමාණය කි.ග්‍රෑ.	රු./කි.ග්‍රෑම්	අපනයන කොටස (%)	ස්ථානය	ප්‍රමාණය කි.ග්‍රෑ.	රු./කි.ග්‍රෑම්	අපනයන කොටස (%)	වර්ධනය (%)
තුර්කිය	1	38,866,312	796.55	14.64	1	39,087,245	739	13.36	(0.57)
ඉරාකය	2	33,377,320	575.54	12.57	2	38,408,064	520	13.12	(13.10)
රුසියාව	3	29,608,373	825.16	11.15	3	29,068,027	821	9.93	1.86
ඉරානය	4	15,127,067	914.63	5.70	4	22,263,830	811	7.61	(32.06)
චීනය	5	14,123,418	754.71	5.32	6	11,870,397	756	4.06	18.98
අසර්බයිජානය	6	10,303,102	909.69	3.88	7	11,721,185	808	4.01	(12.10)
සිරියාව	7	9,536,804	879.75	3.59	8	10,985,901	888	3.75	(13.19)
චිලි	8	9,419,055	714.04	3.55	12	7,231,265	631	2.47	30.25
එ.අ.එ.රාජ්‍යය	9	8,670,346	804.95	3.26	9	9,901,241	723	3.38	(12.43)
ලිබියාව	10	7,806,247	692.20	2.94	5	12,329,315	661	4.21	(36.69)
ප්‍රධාන රටවල් 10 හි එකතුව		176,838,044	768.87	66.59		192,866,470	720	65.90	(8.31)
මුළු එකතුව		265,569,374	866.70	100.00		292,657,282	822	100.00	(9.26)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ රුසියාවට පෙවෙනි තැන හිමිවී ඇත. එක්සත් අරාබි එමීර් රාජ්‍යය 3.26%ක අපනයන ප්‍රමාණයකින් දායක වෙමින් නමවෙනි ස්ථානයේ රැඳී සිටීමට සමත්වී ඇත. කලාපයක් වශයෙන් මැද පෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ප්‍රදේශය වේ. ඉහල තෙල් මිල හේතුවෙන් ඉල්ලුම විශාල වශයෙන් වැඩි වෙමින් පවතී. පළමු රටවල් දහය සඳහා ශ්‍රී ලංකාවෙන් 66% ක ප්‍රමාණයක් තේ අපනයනය කර ඇත. කෙසේ වෙතත්, ඉරානය සහ අසර්බයිජානය යන රටවල් විසින් සාමාන්‍ය FOB ඒකක මිල සම්බන්ධයෙන් සැලකිය යුතු ඉහළ FOB මිල ගණන් පවත්වා ගන්නා ලදී. එපමණක් නොව, සමස්ත අපනයන ආදායම 2019 ට සාපේක්ෂව 2020 දී පහත බැසීමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 230ක් ඉක්මවිය. කෙසේවෙතත්, අනෙකුත් කලාපවල තේ මළු භාවිත කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා තොග තේ අපනයනය මැද පෙරදිග දෙසට යොමු වී ඇත.

වගුව 3.9: ඇසුරුම් ක්‍රමය අනුව ප්‍රධාන රටවල් 20 සඳහා තේ අපනයන ප්‍රමාණයන් හා ශ්‍රේණිගත කිරීම

රට	ප්‍රමාණය කි.ග්‍රෑ							හිමි ස්ථානය						
	මළු	තොග	ඇසුරුම් (>කි.ග්‍රෑ 3)	ඇසුරුම් (1-3 කි.ග්‍රෑ)	ඇසුරුම් (3 -5 කි.ග්‍රෑ)	ඇසුරුම් (4ග්‍රෑ -1 කි.ග්‍රෑ)	ඇසුරුම් (5 කි.ග්‍රෑ-10 කි.ග්‍රෑ)	මළු	තොග	ඇසුරුම් (>කි.ග්‍රෑ 3)	ඇසුරුම් (1-3 කි.ග්‍රෑ)	ඇසුරුම් (3 -5 කි.ග්‍රෑ)	ඇසුරුම් (4ග්‍රෑ -1 කි.ග්‍රෑ)	ඇසුරුම් (5%-10 කි.ග්‍රෑ)
තුර්කිය	96,149	3,652,657	-	176,775	1,657,550	14,337,911	13,456,279	16	11	11	3	3	1	1
ඇ.එ.ජ.	12,995	9,168,337	-	25,136	9,225	399,303	5,512,070	19	5	11	7	14	15	2
චිලි	285,997	9,729,081	469	308,402	11,528,894	13,784,316	3,229,153	11	3	8	1	1	2	3
ජෝර්දානය	293,252	11,696,795	352,702	56,256	9,388	130,738	1,584,287	10	2	1	5	13	18	4
රුසියාව	285,320	5,678,863	9	4,834	39,993	1,541,597	1,119,730	12	7	10	8	8	11	5
ජපානය	716,911	4,557,582	11,595	-	48,500	47,951	228,986	8	8	5	12	7	20	6
චීනය	72,167	3,902,383	20,178	-	190,894	100,613	217,799	17	10	4	12	4	19	7
නායිවානය	697,199	562,572	-	94,500	4,442,145	3,528,054	212,335	9	17	11	4	2	5	8
එ.අ. රාජ්‍ය	218,246	3,295,285	-	-	1,300	945,883	96,020	13	12	11	12	15	12	9
සිරියාව	161,601	4,091,124	124,925	26	10	2,013,173	40,289	14	9	2	11	16	9	10
ඉරානය	1,934,798	306,760	-	-	-	2,410,082	28,440	2	19	11	12	17	7	11
සෞදි අරාබිය	860,987	24,016,245	-	747	11,615	4,701,816	16,964	7	1	11	10	11	4	12
ජර්මනිය	1,029,829	2,610,337	27,218	926	14,336	2,016,318	8,380	5	14	3	9	10	8	13
ඉරාකය	1,258,461	1,140,004	-	-	-	572,526	7,310	4	16	11	12	17	14	14
ලිබියාව	1,004,751	324,147	2,291	-	-	1,559,563	5,400	6	18	6	12	17	10	15
යුක්‍රේනය	99,764	3,178,073	-	213,860	59,526	208,205	3,289	15	13	11	2	6	17	16
හොංකොං	1,970,449	1,745,200	120	35,290	141,655	2,910,012	1,501	1	15	9	6	5	6	17
පෝලන්තය	12,994	9,673,819	-	-	28,580	587,470	240	20	4	11	12	9	13	18
අසර්බයිජානය	28,188	-	-	-	-	7,778,059	-	18	20	11	12	17	3	19
නෙදර්ලන්තය (ඕලන්දය)	1,632,425	7,548,443	1,085	-	10,800	226,302	-	3	6	7	12	12	16	19

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.4.4.1 කළු තේ අපනයනය

සමස්ත තේ අපනයනයෙන් 97%(කි.ග්‍රෑ. මි.259)ක ප්‍රමාණයක් කළු තේ අපනයනය කර ඇති අතර සමස්ත තේ අපනයන ආදායමෙන් 95% (රුපියල් බිලියන 218) ක් සඳහා දායකත්වය සපයා ඇත. ශ්‍රී ලංකාව කළු තේ අපනයනය කරන රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් 86%ක් ප්‍රමාණාත්මකව හා 83%ක් වටිනාකමෙන් දායක වී තිබේ. ශ්‍රී ලංකාවෙන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් රුසියාව 2013 දක්වාම ප්‍රමුඛ ස්ථානයේ රැඳුන අතර 2014 දී ශ්‍රී ලංකාවෙන් කළු තේ වැඩියෙන්ම ආනයනය කළ රට බවට තුර්කිය පත් විය. 2015 වසරේදි රුසියාව නැවතත් ශ්‍රී ලාංකීය කළු තේ කි.ග්‍රෑ. මි.35.74 ආනයනය කරමින් (11.9%) ප්‍රමුඛ ස්ථානයට පත්විය. කෙසේවෙතත්, 2016 වසරේදි ඉරානය ශ්‍රී ලාංකීය කළු තේ කි.ග්‍රෑම් මි.33.90ක් (12%) ආනයනය කරමින් පළමුතැනට පත්විය. 2017 වසරේදී තුර්කිය ප්‍රමාණාත්මකව 13.41%ක කොටසකට දායකත්වයක් සපයමින් ශ්‍රී ලංකාවේ කළු තේ ආනයනය කරන රටවල් අතරින් පළමු ස්ථානයට පත් විය. 2019 වසර තුළ දී, කි.ග්‍රෑම් මිලියන 39.05ක අපනයනයක් සහිතව කළු තේ අපනයන ලයිස්තුවේ ඉහලට පැමිණීමට තුර්කිය සමත් වී ඇත. නැවතත් තුර්කිය විසින් ශ්‍රී ලාංකීය කළු තේ කි.ග්‍රෑම් මි.38.8ක් ආනයනය කරමින් සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා කළු තේ අපනයනකරුවන්ගේ ලයිස්තුවේ පළමු ස්ථානයට පැමිණ තිබේ.

වගුව 3.10: කළු තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 20 සහ වෙළඳපොළ කොටස් (ප්‍රති අපනයනය සමග)

රට	ප්‍රමාණය (කි.ග්‍රෑම් මිලියන)	වටිනාකම (රු. බිලි)	FOB (රු / කි.ග්‍රෑම්)	ප්‍රමාණයේ කොටස (%)	වටිනාකමේ කොටස (%)	ප්‍රමාණයේ වර්ධනය (%)
තුර්කිය	38.83	30.91	796.02	15.01	14.20	(0.58)
ඉරාකය	33.36	19.18	574.87	12.90	8.81	(13.08)
රුසියාව	29.03	23.51	809.90	11.23	10.80	2.60
ඉරානය	15.12	13.83	914.45	5.85	6.35	(32.05)
චීනය	13.72	10.16	740.62	5.31	4.67	19.74
අසර්බයිජානය	10.29	9.35	908.58	3.98	4.30	(12.17)
සිරියාව	9.53	8.39	879.65	3.69	3.85	(13.20)
චිලි	9.36	6.60	705.07	3.62	3.03	30.71
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	8.50	6.81	800.39	3.29	3.13	(9.82)
ලිබියාව	7.58	5.26	694.36	2.93	2.42	(38.05)
සෞදි අරාබිය	6.59	8.27	1,254.79	2.55	3.80	(1.59)
ජර්මනිය	6.24	5.80	930.00	2.41	2.67	(12.07)
ජපානය	5.60	5.59	999.18	2.16	2.57	(25.67)
ඇමරිකා එක්සත් ජනපදය	5.20	4.68	901.27	2.01	2.15	(18.87)
ජෝර්දානය	4.66	4.67	1,002.22	1.80	2.15	(9.54)
නයිවානය	4.39	3.48	792.00	1.70	1.60	(9.18)
යුක්‍රේනය	4.14	3.88	935.71	1.60	1.78	(9.10)
හොංකොං	3.76	2.79	741.69	1.45	1.28	0.51
පෝලන්තය	2.84	3.46	1,215.53	1.10	1.59	(14.75)
නෙදර්ලන්තය (ඕලන්දය)	2.60	3.14	1,207.15	1.01	1.44	(14.65)
ප්‍රධාන රටවල් 20හි එකතුව	221.34	179.75	812.08	85.59	82.58	(9.04)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාව මගින් කළු තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 05 විසින් තම පරිමාව 5% – 15%අතර පරාසයක පවත්වා ගනී.

3.4.4.2 හරිත තේ අපනයනය

2020 වසරේ දී සමස්ත තේ අපනයනයෙන් 2% (රුපියල් බිලියන 4.1) ක් සහ ආදායමෙන් 4%ක් (රුපියල් බිලියන 8.4ක්) සඳහා හරිත තේ මගින් දායක වී තිබේ. ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් ප්‍රමාණය අනුව 82% ක් හා වටිනාකම අනුව 79%ක් සඳහා දායක වේ. ශ්‍රී ලාංකීය හරිත තේ ආනයනය කරන ප්‍රධාන රටවල් අතුරින් රුසියාව සැලකියයුතු ප්‍රමාණයක් එනම් කි.ග්‍රෑම් මිලියන 0.6ක් සහ එක්සත් රාජධානියල ඕස්ට්‍රේලියාව හා නෙදර්ලන්තය ඉහල FOB මිලක් 2020 වසරේ දී වාර්තා කර ඇත. අනෙක් අතට, ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන පෙළේ සියලු රටවල් 20 ම පාහේ ඉහල FOB මිලක් වාර්තා කරන ලද අතර ලිබියාව තුළ පහල මිල ගණන් වාර්තා විය. කෙසේ වෙතත්, 2019 වසර හා සැසඳීමේ දී ශ්‍රී ලංකා හරිත තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 20 හි අපනයන ප්‍රමාණ වර්ධනයේ පහත බැසීමක් පෙන්නුම් කරන ලදී.

වගුව 3.11: 2020 වර්ෂයේදී හරිත තේ අපනයනය කරන ප්‍රධාන රටවල් විස්සෙහි තොරතුරු -

රට	ප්‍රමාණය (කි.ග්‍රෑ)	වටිනාකම (රු.මිලි)	FOB (රු. / කි.ග්‍රෑ)	ප්‍රමාණයේ කොටස (%)	වටිනාකමේ කොටස (%)	ප්‍රමාණයේ වර්ධනය (%) (2019 ට සාපේක්ෂව
රුසියාව	579,853	921,349,174	1,588.94	14.05	10.98	(25.31)
ඇමරිකා එක්සත් ජනපදය	483,073	1,247,504,246	2,582.44	11.71	14.86	(15.70)
යුක්‍රේනය	414,345	563,234,866	1,359.34	10.04	6.71	4.77
නෙදර්ලන්තය (ඕලන්දය)	289,978	842,111,613	2,904.05	7.03	10.03	(0.57)
ලිබියාව	231,184	143,656,990	621.40	5.60	1.71	125.74
සෞදි අරාබිය	213,010	421,575,591	1,979.13	5.16	5.02	41.00
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	167,137	173,343,056	1,037.13	4.05	2.07	(64.44)
පෝලන්තය	134,477	293,727,646	2,184.22	3.26	3.50	(13.73)
නයිජීරියාව	104,091	236,408,947	2,271.17	2.52	2.82	18.14
ප්‍රංශය	101,327	275,279,620	2,716.76	2.46	3.28	(6.32)
තායිවානය	91,056	108,360,147	1,190.04	2.21	1.29	(11.07)
ඕස්ට්‍රේලියාව	88,462	273,246,885	3,088.87	2.14	3.26	(23.36)
එක්සත් රාජධානිය	84,877	398,103,513	4,690.37	2.06	4.74	(24.99)
ජර්මනිය	68,564	111,219,517	1,622.13	1.66	1.33	(21.21)
චිලි	59,711	125,430,995	2,100.65	1.45	1.49	(15.42)
බෙලාරුස්	57,106	85,009,165	1,488.61	1.38	1.01	(14.28)
කැනඩාව	56,897	133,648,368	2,348.94	1.38	1.59	53.08
චීනය	51,137	111,242,507	2,175.38	1.24	1.33	(22.90)
උස්බෙකිස්ථානය	46,475	60,999,467	1,312.53	1.13	0.73	(32.91)
නවසීලන්තය	42,098	115,438,284	2,742.12	1.02	1.38	(6.90)
ප්‍රධාන රටවල් 20හි එකතුව	3,364,858	6,640,890,597	1,973.60	81.55	79.12	(13.40)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.4.4.3 ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ අපනයනය කරනු ලබන ප්‍රමුඛ රටක් ලෙස ශ්‍රී ලංකා ක්ෂණික තේ වෙළඳපොල තුළ අයර්ලන්තය ක්ෂණික තේ කිලෝ ග්‍රෑම් මිලියන 2.2 (78%)ක ප්‍රමාණයක් ආනයනය කරමින් මහත් කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකාවේ ක්ෂණික තේ අපනයනය කරනු ලබන රැළඟ ප්‍රමුඛ රටවල් වන්නේ පිළිවෙලින් චීනය, ජර්මනිය, පාකිස්තානය හා ඇමරිකා එක්සත් ජනපදය යි. සමාලෝචන වර්ෂය තුළ අපනයනය කළ සමස්ත ක්ෂණික තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 2.8ක් වන අතර වටිනාකම රුපියල් බිලියන 4.1ක් වේ.

3.4.4.4 ආර්.ටී.ඩී (පානය සඳහා පිළියෙල කළ) තේ අපනයනය

2020 වර්ෂය තුළදී, පානය සඳහා පිළියෙළ කළ සමස්ථ තේ ලීටර් 1,809ක් අපනයනයෙන් රුපියල් මිලියන 41ක අපනයන ආදායමක් ලබා ගත හැකි විය. ශ්‍රී ලංකාවෙන් ලීටර් 1,054ක් ආනයනය කරමින් මාලදිවයින විසින් පානය සඳහා පිළියෙළ කළ තේ (RID) වෙළඳපොලේ වැදගත් භූමිකාවක් ඉටු කරන ලද අතර එමගින් රටට රුපියල් මිලියන 3.5ක අදායමක් ලැබිණි ඕස්ට්‍රේලියාව සහ ඉන්දියාව යනු ලංකාවේ පානය සඳහා පිළියෙළ කළ තේ අපනයන වෙළඳපොලේ සිටින අනෙකුත් ප්‍රධාන රටවල් ය. කෙසේ වෙතත්, පසුගිය වසර දෙක තුළ, ශ්‍රී ලංකා පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොළ තුළ ක්‍රමික පහත වැටීමක් පවතින බව නිරීක්ෂණය විය.

3.5 ගෝලීය තේ කර්මාන්තයේ පසුබිම

තේ යනු ජලයට පමණක් දෙවෙනිවන ලෝකයේ නිතරම පරිභෝජනය කරන උණුසුම් පානවලින් එකකි. ස්වාභාවික පානයක් ලෙස එය ලෝකයේ සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර සහ සෑම වයස් කාණ්ඩයකම පාහේ ජනප්‍රියය. ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන අතර, විශේෂයෙන් තේ මගින් ජාතික ආර්ථිකය හා සමාජ සංවර්ධනය සඳහා එහි ඇත ඉතිහාසයේ පටන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් වෙළඳ හාණ්ඩ පදනම් කරගත් නිෂ්පාදන මගින් සපයන අතර මෙම අංශයද රටේ විශාලතම සේවා යෝජකයන් අයත් වේ.

තේ නිෂ්පාදනය කරනු ලබන රටවල් අතර ප්‍රධාන නිෂ්පාදකයින් වන්නේ චීනය, ඉන්දියාව, කෙන්යාව, තුර්කිය හා ශ්‍රී ලංකාව යි. සමාලෝචිත වසර තුළ සිවිවන ස්ථානයේ රැඳී සිටීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූ අතර තුර්කිය ශ්‍රී ලංකාව අභිබවා සිවිවන ස්ථානයට පැමිණ තිබේ. එමෙන්ම, වියට්නාමය ප්‍රධාන නිෂ්පාදන රටවල් ලයිස්තුවේ පස්වන ස්ථානයට පත්විය. මෙම රටවල් පහ ලෝක නිෂ්පාදනයෙන් 85%ක් සහ ගෝලීය අපනයනයෙන් 80%ක් සඳහා දායක වේ. ලෝක තේ වගාව ඉහළ නැංවීම සඳහා චීනය ප්‍රමුඛ ලෙස වැදගත් වූ අතර අප්‍රිකානු මහාද්වීපය විශේෂයෙන් කෙන්යාව ද විශාල අස්වැන්නක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ පසුබිම සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ කාර්ය සාධනය අනෙකුත් තේ නිෂ්පාදන සාමාජිකයින්ට සාපේක්ෂව අපනයන, නිෂ්පාදනය, වෙන්දේසි මිල සහ ආදායම් කාර්ය සාධනය (අපනයන) පිළිබඳ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සැලකිල්ලට ගැනීමේ දී මධ්‍යස්ථ මට්ටමක පවති.

3.5.1 ගෝලීය තේ වගාව

2020 වසර අවසානයේදී ලෝකයේ තේ වගාව සහිත මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 4.8 ඉක්මවනු ඇතැයි ගණන් බලා තිබේ.

3.12: වැඩිම තේ වගා බිම් පිළිබඳ විස්තර

රට	2015(හෙක්)	2016(හෙක්)	2017(හෙක්)	2018(හෙක්)	2019(හෙක්)	2020(හෙක්)
චීනය	2,810,000	2,920,000	3,059,000	2,985,800	3,065,500	3,165,130
ඉන්දියාව	566,660	577,480	590,000	636,560	636,560	636,560
ශ්‍රී ලංකාව*	188,000	202,839	202,540	202,540	202,540	202,540
කෙන්යාව	209,426	218,538	232,742	234,300	269,430	269,430
වියට්නාමය	125,000	134,000	134,000	130,000	130,000	130,000
ඉන්දුනීසියාව	119,361	118,100	116,500	115,300	114,300	113,500
මියන්මාරය	79,000	80,000	80,000	81,000	81,400	81,400
තුර්කිය	77,500	77,000	77,000	83,000	83,000	83,000
බංගලිදේශය	53,500	59,000	59,000	59,300	61,000	65,429
ජපානය	39,300	43,100	42,400	41,600	40,600	39,100

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2021

* වගා කර ඇති බවට ලියාපදිංචි ඇස්තමේන්තුගත ප්‍රදේශ

ජාත්‍යාන්තර තේ කමිටුවට අනුවල වැඩිම තේ වගා ව්‍යාප්තියක් දකින්නට ලැබෙන්නේ චීනයෙන් (62.08%) වන අතර වාර්ෂිකව ඔවුන් තම තේ වගාව සිඝ්‍රයෙන් ව්‍යාප්ත කරමින් සිටි. කෙන්යාව ද 2015 සිට 2020 දක්වා කාලය තුළ වැඩි බිම් ප්‍රමාණයක තේ වගා කරන ලදී. තේ වගා කරනු ලබන ප්‍රමුඛ රටවල් 10 ලොව සමස්ත තේ වගා ව්‍යාප්ත.යෙන් 94%ක ප්‍රමාණයකට හිමිකම් කියයි..

3.5.2 ගෝලීය තේ පරිභෝජනය

2018-2020 තෙවසරක කාල වකවානුව තුළ වාර්ෂික තේ පරිභෝජනය සහ ත්‍රෛවාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය අනුව වාර්ෂික තේ පරිභෝජනය ඉහළින්ම පවතින්නේ චීනයේය. එය කි.ග්‍රෑ. මිලියන 2,289ක් ලෙස වාර්තාවී ඇත. ඒක පුද්ගල තේ පරිභෝජනය පහළ අගයක් ගන්නා නමුත් මෙය කිලෝ ග්‍රෑම් 1.64ක් ලෙස වාර්තා විය. වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ.මිලියන 263.27ක් වශයෙන් පවතින තුර්කිය ඉහළම ඒක පුද්ගල තේ පරිභෝජනය වන කි.ග්‍රෑ. 3.2ක ප්‍රමාණය වාර්තා කරන ලදී. ලිබියාව ද කිලෝග්‍රෑම් 2.64ක් ලෙසට ඉහළ මට්ටමේ ඒක පුද්ගල පරිභෝජනයක් පෙන්නුම් කරයි.

වගුව 3.13: රටවල් අනුව තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන

රට	2016-18		2017-19		2018-20	
	එකතුව	ඒක පුද්ගල	එකතුව	ඒක පුද්ගල	එකතුව	ඒක පුද්ගල
ලිබියාව	17.07	2.80	17.83	3.02	15.33	2.64
ඇෆ්ගනිස්ථානය	38.77	1.37	30.77	1.02	27.87	0.91
තුර්කිය	251.00	3.09	252.30	3.04	263.27	3.2
එක්සත් රාජධානිය	107.81	1.62	106.77	1.59	107.6	1.61
මොරොක්කෝව	70.95	2.04	73.05	2.07	74.23	2.09
අයර්ලන්ත ජනරජය	8.66	1.79	9.76	2.00	10.38	2.1
නායිවානය	36.14	1.29	36.67	1.31	36.55	1.3
කටාර්	4.00	1.45	4.19	1.51	4.28	1.53
ශ්‍රී ලංකාව	28.96	1.35	29.16	1.35	29.53	1.36
හොංකොං	11.26	1.52	11.85	1.59	12.37	1.65
චිලි	20.66	1.11	20.25	1.09	21.45	1.12
සිරියාව	11.10	0.65	10.70	0.60	9.85	0.64
ඊජිප්තුව	93.02	0.96	99.86	1.00	98.85	1
ඉරාකය	42.30	1.12	43.50	1.13	43.23	1.11
ඉරානය	76.83	0.94	81.87	1.00	78.23	0.94
චීනය	2,050.33	1.48	2,152.67	1.55	2289	1.64
ඉන්දියාව	1,036.00	0.82	1,083.33	0.84	1091	0.83
පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS)	248.90	0.85	245.33	0.83	239.23	0.82
පාකිස්ථානය	180.18	0.85	190.81	0.89	216.34	1.01
ඇ.එ.ජ.	125.61	0.39	120.96	0.37	114.09	0.35
ජපානය	103.87	0.82	104.21	0.82	100.05	0.79
ඉන්දුනීසියාව	94.00	0.36	94.33	0.35	95.33	0.36
බංගලිදේශය	82.33	0.51	82.83	0.50	85.17	0.51
පෝලන්තය	36.59	0.96	37.37	0.98	38.78	1.02
ජර්මනිය	29.69	0.36	28.07	0.34	24.93	0.3

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2021

එකතුව: කිලෝ ග්‍රෑම් මිලියන / ඒක පුද්ගල: කිලෝ ග්‍රෑම්

3.5.3 ගෝලීය තේ නිෂ්පාදනය

2020 වසරේ දී ගෝලීය තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් බිලියන 6ක් වූ අතර 2019 වසර හා සැසඳීමේදී එය 2%ක පහත බැසීමකි. 2020 වසර තුළ දී, චීනය, ඉන්දියාව, කෙන්යාව, තුර්කිය, ශ්‍රී ලංකාව, වියට්නාමය සහ ඉන්දුනීසියාව මගින් ගෝලීය තේ නිෂ්පාදනයෙන් 90% ක් පමණ නිෂ්පාදනය කර ඇත. ඉන්දියාව සහ චීනය තවමත් විශාලතම තේ නිෂ්පාදකයින් වන නමුත් මෙම රටවල් දෙකෙහි තේ පරිභෝජනය සැලකියයුතු අන්දමින් ඉහල මට්ටමක පවතින හෙයින් ලොව විශාලතම තේ අපනයනකරු බවට කෙන්යාව පත්ව ඇත.

2020 වසර තුළ දී සිලෝන් තේ නිෂ්පාදනයේ පහත බැසීමක් සහිතව ශ්‍රී ලංකාව ගෝලීය නිෂ්පාදක ලයිස්තුව තුළ ලෝකයේ පස් වන විශාලතම තේ නිෂ්පාදකයා බවට පත්විය. ශ්‍රී ලංකාව අභිබවා තුර්කිය සිවිවන ස්ථානයට පැමිණ තිබේ. සමාලෝචිත වසර තුළ සිලෝන් තේ නිෂ්පාදනයේ පහත බැසීමට බලපෑ හේතු ගණනාවක් පවතී. කෙසේ වෙතත්, 2020 වසර තුළ ගෝලීය තේ නිෂ්පාදනයෙන් 4.63%ක කොටසක් සඳහා ශ්‍රී ලංකාව දායක වී තිබේ.

ලෝක තේ නිෂ්පාදනයෙන් 45.5%ක කොටසකට හිමිකම් කියමින් කි.ග්‍රෑ. මිලියන 2,740ක් නිපදවමින් චීනය ඉහළ ම ස්ථානයේ රැඳී සිටින අතර ලෝක තේ නිෂ්පාදනයෙන් 21%ක කොටසකට හිමිකම් කියමින් ඉන්දියාව 2020 වසරේ දී කි.ග්‍රෑ. මිලියන 1,256ක වාර්ෂික නිෂ්පාදනයක් වාර්තා කරමින් දෙවැනි ස්ථානයෙහි පසුවෙයි. කිලෝ ග්‍රෑම් මිලියන 570ක් නිෂ්පාදනය කරමින් හා 9%ක කොටසක් හිමිකර ගනිමින් කෙන්යාව තුන්වන ස්ථානයට පත්ව ඇත. ලෝක තේ නිෂ්පාදනයේ සිවිවන දායකයා වශයෙන් තුර්කිය 2020 වසරේ දී 4.66%ක කොටසකට හිමිකම් කියමින් තේ කිලෝ ග්‍රෑම් මිලියන 280ක් නිෂ්පාදනය කර ඇත.

ප්‍රස්තාරය 3.6. ලෝක තේ නිෂ්පාදන සංඛ්‍යාදත්ත



මූලාශ්‍රය: ශ්‍රී ලංකා වරාය

3.5.4 ගෝලීය තේ අලෙවිය

2020 වසරේ දී කොළඹ තේ වෙන්දේසිය මගින් කි.ග්‍රෑ. 01 ක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො. 3.39ක් වශයෙන් කි.ග්‍රෑ. මිලියන 268ක් වෙන්දේසි කර ඇත. කෙසේ නමුත්ල මුම්බාසා වෙන්දේසියේ ද කි.ග්‍රෑ. මිලියන 500කට වැඩි ප්‍රමාණයක් හා කල්කටා වෙන්දේසියේ දී කි.ග්‍රෑ. මිලියන 128ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත. ලෝකයේ ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථාන සැලකිමේ දී, පසුගිය වසර කිහිපය තුළ කොළඹ වෙන්දේසිය මගින් ඉහල සාමාන්‍ය මිලක් පවත්වා ගෙන ගිය බව පැහැදිලිව පෙනෙන කරුණකි.

වගුව 3.14: ප්‍රධාන තේ වෙන්දේසි සංඛ්‍යාලේඛන (ප්‍රමාණය - කි.ග්‍රෑ.මිලියන / සාමාන්‍ය ඒකක මිල ඇ.ඩො./කි.ග්‍රෑ)

වෙන්දේසි මධ්‍යස්ථානය	2018		2019		2020	
	ප්‍රමාණය	මිල	ප්‍රමාණය	මිල	ප්‍රමාණය	මිල
චිතගොං	79	3.12	85	2.31	82.99	2.05
කොචින්	48	1.81	42	1.66	41.52	1.92
කොළඹ	288	3.60	298	3.07	268.24	3.39
ගුවාහාත	177	2.13	150	2.09	162.52	2.69
ජකර්තා	-	-	-	-	-	-
කල්කටා	159	2.46	168	2.43	132.60	2.91
ලිම්බෙ	9	1.84	9	1.46	5.98	1.44
මොම්බාසා	458	2.43	454	2.04	516.80	1.93

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වෙබ් අඩවිය

2020 වසර තුළ කිලෝ ග්‍රෑමයකට ඇමරිකානු ඩොලර් 3ක් ඉක්මවූ එකම වෙන්දේසි මධ්‍යස්ථානය මෙය විය. සමාලෝචන කාල වකවානුව තුළදී චිතගොං, කල්කටා සහ ගුවහටි වෙන්දේසිවල තේ කි.ග්‍රෑ. 01 ක් සඳහා ඇ.ඩො. 2ක් ඉක්මවිය. කල්කටා දෙවැනි ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළ අතර ගුවහටි තුන්වෙනි තැනට පත්විය.

3.5.5 ගෝලීය තේ අපනයනය

ප්‍රස්තාරය 3.7: ප්‍රධාන තේ අපනයනකරුවන්



මූලාශ්‍රය: අතිරේකය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2021

සැ.යු. ශ්‍රී ලංකාවට අදාළ සංඛ්‍යා ප්‍රති අපනයනයන් ඇතුළත් නොකර දක්වා තිබේ.

පසුගිය වසර හා සැසඳීමේදි 2020 වසර තුළ ගෝලීය තේ අපනයනය කි.ග්‍රෑ. මිලියන 80 (4%) කින් අඩු වුණි. 2019 වසර හා සැසඳීමේදි චීනය හා ඉන්දියාව සිය අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් 5% සහ 17%ක ප්‍රමාණයෙන් සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. 2019 වර්ෂයට සාපේක්ෂව කෙන්යාව විසින් 5%ක වර්ධනයක් සහිතව අපනයන ප්‍රමාණයන්ගේ වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. විශාලතම තේ අපනයන කරුවන් තිදෙනා වන කෙන්යාව, චීනය සහ ශ්‍රී ලංකාව ගෝලීය තේ අපනයනයෙන් 62% කට වඩා වැඩි කොටසකට හිමිකම් කියා ඇත.

2020 වසරේ ප්‍රමුඛ පෙළේ තේ අපනයනකරුවන් සහ ඔවුන්ගේ අපනයන ආදායම් පහත දැක්වේ. එයට අනුව, තේ අපනයන මගින් වැඩිම ආදායමක් උපයාගන ලැබුයේ චීනය විසිනි. කෙන්යාව තෙවන විශාලම තේ අපනයන අදායම් උපයන්නා බවට පත් විය. දෙවැනි තැනට වැඩිම අපනයන ආදායම් ලබන රට වශයෙන් ශ්‍රී ලංකාවට තම ශ්‍රී ලංකා තේ අපනයනය මගින් ඇ.ඩො. බිලියන 1.2ක කර්මාන්ත තත්වයක් පවත්වා ගැනීමට හැකිවිය.

ප්‍රස්තාරය 3.8: ඉහළම අපනයන ආදායම්



මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන – 2021

3.6. සිලෝන් තේ වෙළඳපොල

3.6.1.රුසියාව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය කලාපය

රුසියාව

මූලික ආර්ථික දර්ශක

ජනගහනය	මිලියන 146.2
දළ දේශීය නිෂ්පාදනය	ඇ.ඩො ට්‍රිලියන1.47
දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය	-3.0%
ඒක පුද්ගල ආදායම	ඇ.ඩො 10068.5
උද්දමන අනුපාතය	4.9% (වාර්ෂික)
විනිමය අනුපාතය	ඇ.ඩෙ1 = රු.ඩො 73.88
තේ වෙළඳ පොළ ප්‍රමාණය	මෙට්‍රික් ටොන් 140,000 - 180,000

චගුව 3.6.1. 2020 වසර සඳහා රටවල් අනුව රුසියාවට කරන ලද තේ ආනයනය

රට	ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	වටිනාකම (ඇ.ඩො මිලියන)	වෙළඳපොල කොටස	වෙළඳපොල කොටසේ වටිනාකම
ශ්‍රී ලංකාව	31,780	124	21	30
ඉන්දියාව	32,488	92	21	22
කෙන්යාව	23,755	53	16	13
චීනය	21,381	39	14	9
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	4,514	22.89	3	6
වියට්නාමය	15,471	24.85	10	6
ඉන්දුනීසියාව	7,649	13.58	5	3
කසකස්තානය	3,186	14	2	3
ජර්මනිය	490	6	0.3	1.5
සිම්බාබ්වේ	1540	2.8	1.02	0.7
ඉරානය	0	0	0	0
අසර්බයිජානය	294	1.5	0.2	0.4
ටැන්සානියාව	1765	3.33	1.2	0.8
ආර්ජන්ටිනාව	2,885	4	1.9	0.97
වෙනත්	4,426	11.05	2.9	2.7
එකතුව	151,624	412		

ප්‍රමාණය මෙට්‍රික් ටොන් සහ වටිනාකම ඇ.ඩො. මිලියන

මූලාශ්‍රය: රුසියානු වරාය තොරතුරු නියෝජිතායතනය

යුක්‌රේනය

ජනගහනය	මිලියන 41
දළ දේශීය නිෂ්පාදනය	ඇ.ඩො බිලියන 154.8 (2020)
දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය	ඇ.ඩො 3756 (2020)
ඒක පුද්ගල ආදායම	-4.2 %
උද්දමන අනුපාතය	3.1 %
විනිමය අනුපාතය	ඇ.ඩො 1= Hryvnia 28.26
තේ වෙළඳ පොළ ප්‍රමාණය	මෙට්‍රික් ටොන් 17,000- 26,000

2020 වසරේ දී යුක්‌රේනයේ තේ පරිභෝජනය කෙරෙහි කොවිඩ් 19 වසංගතයේ පැහැදිළි සෘණාත්මක බලපෑම් ඇති නොවුණි. කෝපි මෙන්ම, පුරුද්දක් වශයෙන් යුක්‌රේනය තුළ තේ පරිභෝජනය දක්‌නට ලැබේ. විශේෂයෙන් නිවස මුලිකව මෙම පරිභෝජනය සිදු වේ.

වගුව 3.6.2 යුක්‌රේනයට තේ ආනයනය කිරීම

රට	2018		2019		2020	
	(මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස %	(මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස %	(මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස %
ඉන්දියාව	3,954	24.07	3,306	20.6	3,183	18.46
ශ්‍රී ලංකාව	3,559	21.66	4,121	25.8	4,428	25.68
එක්‌සත් අරාබි එමීර් රාජ්‍යය	2,312	14.07	1,859	11.6	1,361	7.89
චීනය	2,138	13.01	2,004	12.6	2,087	12.1
කෙන්යාව	1,726	10.51	1,748	10.9	2,484	14.4
වියට්නාමය	1,388	8.45	1,676	10.5	1,750	10.1
ඉන්දුනීසියාව	666	4.05	543	3.4	657	3.8
අසර්බයිජානය	173	1.05	210	1.3	264	1.5
ආර්ජන්ටිනාව	163	0.99	54	0.3	140	0.8
ඉරානය	104	0.63	12	0.1	12	0.1
පෝලන්තය	75	0.46	94	0.6	208	1.2
ජෝජියාව	56	0.34	98	0.6	80	0.5
වෙනත්	116	0.71	276	1.7	592	3.4
එකතුව	16,430		16,001		17,246	

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්‌ටුව - වෙළඳ සිතියම

අසර්බයිජානය

ජනගහනය	මිලියන 10 (2020).
දළ දේශීය නිෂ්පාදනය	ඇ.ඩො බිලියන 41.67 (2020)
දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය	ඇ.ඩො 14,499
ඒක පුද්ගල ආදායම	-4.3%.
උද්දමන අනුපාතය	2.8%
විනිමය අනුපාතය	ඇ.ඩො 1 = අසර්බයිජාන් මනට් (අසර්බයිජාන් මනට්) 0.6
තේ වෙළඳ පොළ ප්‍රමාණය	මෙට්‍රික් ටොන් 7,000 - 15,000

වගුව 3.6.3. රටවල් අනුව අසර්බයිජානයට කරන ලද තේ ආනයනය

රට	2019		2020	
	(මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස %	(මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස %
ශ්‍රී ලංකාව	12,115	85.8	11,302	80.8
ඉන්දියාව	581	4.1	534	3.8
රුසියාව	820	5.8	1022	7.3
කෙන්යාව	158	1.1	218	1.2
ඉරානය	26	0.2	59	0.4
චීනය	196	1.5	166	1.2
වියට්නාමය	110	0.7	614	4.4
තුර්කිය	20	0.2	27	0.2
ජර්මනිය	3	0.1	7	0.1
වෙනත්	78	0.5	35	0.3
එකතුව	14,107		13,984	

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුව - වෙළඳ සිතියම

(2019 වසරට සාපේක්ෂව 2020 වසර තුළ සමස්ථ තේ ආනයනය තරමක පහල මට්ටමක පැවතිනි :-0.87%)

වගුව 3.6.4. අසර්බයිජානයේ සමස්ථ වාර්ෂික තේ ආනයනය

වර්ෂය	2016	2017	2018	2019	2020
මෙට්‍රික් ටොන්	12,609	13,585	12,958	14,096	13,885
වටිනාකම ඇ.ඩො (මිලියන)	45	54	50	55	56

මූලාශ්‍රය: අසර්බයිජානයේ රාජ්‍ය රේගු කම්ටුව

කිර්ගිස්ථානය

ජනගහනය	මිලියන 6.6 (2020).
දළ දේශීය නිෂ්පාදනය	ඇ.ඩො බිලියන 7.74 (2020)
දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය	ඇ.ඩො 1,173
ඒක පුද්ගල ආදායම	-8.6%.
උද්දමන අනුපාතය	9.7%.
විනිමය අනුපාතය	ඇ.ඩො 1 =කිර්ගිස්ථාන් ටෙංගේ (කිර්ගිස්ථාන් සොම්) 82
තේ වෙළඳ පොළ ප්‍රමාණය	මෙට්‍රික් ටොන් 3,000 - 12,000

වගුව 3.6.5. කිර්ගිස්ථානයේ සමස්ථ තේ ආනයනය

රට	2018 (මෙට්‍රික් ටොන්)	2019 (මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස 2019	2020(මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස 2020
රුසියාව	1,324	1,209	25	4,563	38
ශ්‍රී ලංකාව	958	992	20.7	1,028	8.6
කසකස්තානය	543	399	8.3	4,606	38
චීනය	790	705	14.6	888	7.4
ඉරානය	390	89	1.9	85,2	0.7
කෙන්යාව	536	510	10.7	459	3.8
පකිස්ථානය	228	353	7.4	421	3.5
වියට්නාමය	169	171	3.5	58,6	0.5
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	71	35	0.7	0	0
තුර්කිය	28	7	0.2	7,8	0.1
ඉන්දුනීසියාව	33	48	0.9	24	0.2
ඉන්දියාව	161	289	6	146,4	1.2
වෙනත්	36	1	0.1	22,7	0.2
එකතුව	5,267	4,807		11,989	

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කමිටුව - වෙළඳ සිතියම

කිර්ගිස්ථානය 2020 වසරේදී තේ මෙට්‍රික් ටොන් 11,989ක් ආනයනය කර ඇති අතර එය 2019 වසරට සාපේක්ෂව සමස්ත තේ අපනයනයේ විශාල වර්ධනයක් පෙන්නුම් කරයි.

රුසියාව සහ කසකස්තානය කිර්ගිස්ථානට තේ අපනයනය කරන ප්‍රමුඛ රටවල් වෙන අතර 2020 දී 76% ක වෙළඳපල කොටසකට හිමිකම් කියනු ලබයි. ශ්‍රී ලංකාව අනෙකුත් තේ අපනයනය කරන රටවල් අතර 3 වන ස්ථානයට පත්ව ඇති අතර එය 8.6%ක වෙළඳපල කොටසක් වන අතර පෙර වසරට වඩා 12% අඩු වීමකි.

මොල්ඩෝවා

ජනගහනය	මිලියන 4.04
දළ දේශීය නිෂ්පාදනය	ඇ.ඩො බිලියන 11.24
දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය	ඇ.ඩො 4,268
ඒක පුද්ගල ආදායම	-4.3%.
උද්දමන අනුපාතය	0.39%
විනිමය අනුපාතය	ඇ.ඩො 1= මොල්ඩෝවන් ලෙයි 18.94
තේ වෙළඳ පොළ ප්‍රමාණය	මෙට්‍රික් ටොන් 700 –1,000

වගුව 3.6.6. 2020 වසර සඳහා මොල්දෝවා වෙත කරන ලද තේ ආනයනයන්හි එකතුව

රට	2020	
	ප්‍රමාණය (මෙ.ටොන්)	වෙළඳපොළ කොටස
රුසියාව	638	69%
පෝලන්තය	61	7%
යුක්‍රේනය	127	14%
ශ්‍රී ලංකාව	46	5%
වියට්නාමය	0.1	0.01%
චීනය	12	1.3%
ඉන්දියාව	1	0.1%
වෙනත්	45	4.8%
එකතුව	930	

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුව - වෙළඳ සිතියම

වගුව 3.6.7. මොල්දෝවා වෙත කරන ලද තේ ආනයනයන්හි එකතුව

වර්ෂය	2019	2020
ප්‍රමාණය (මෙ.ටොන්)	948	930
වටිනාකම - ඇමරිකානු ඩොලර් (මිලියන)	7.8	7

මූලාශ්‍රය : ජාතික සංඛ්‍යාලේඛන කාර්යාංශය, මොල්දෝවා රාජ්‍යය

2020 වසර තුළ දී මොල්දෝවා වෙතට කරන ලද තේ ආනයනය සුළු වශයෙන් පහත වැටී ඇත (-1.9%).

ආමේනියාව

ජනගහනය	මිලියන 2.97
දළ දේශීය නිෂ්පාදනය	ඇ.ඩො බිලියන 40.79
දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය	ඇ.ඩො 4.315
ඒක පුද්ගල ආදායම	-4.5%.
උද්දමන අනුපාතය	3.7%.
විනිමය අනුපාතය	ඇ.ඩො 1= (ආමේනියානු ඩ්‍රම්) 508
තේ වෙළඳ පොළ ප්‍රමාණය	මෙට්‍රික් ටොන් 3,000 – 5,000

වගුව 3.6.8. 2020 වසර සඳහා ආමේනියාව වෙත කරන ලද තේ ආනයනයන්හි එකතුව

රට	2020 (මෙට්‍රික් ටොන්)	වෙළඳපොළ කොටස
ශ්‍රී ලංකාව	83	16.5%
චීනය	2,78	0.6%
ඉන්දියාව	6,8	1.3%
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	22,5	4.5%
ජෝජියාව	113	22%
රුසියාව	265	52.6%
යුක්‍රේනය	1,65	0.3%
වෙනත්	9,27	1.8%
එකතුව (මෙ.ටොන්)	504	

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුව - වෙළඳ සිතියම

රුසියානු සමූහාණ්ඩුව, ශ්‍රී ලංකාව සහ ජෝර්ජියාව ආර්මේනියාවට තේ අපනයනය කරන ප්‍රධාන රටවල් වේ.

3.6.2. මැද පෙරදිග සහ උතුරු අප්‍රිකානු (MENA) කලාපය

මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ රටවල 2020 වසර තුළ දී ඇති වූ සියලු අවිනිශ්චිතතා සහ අර්බුද හමුවේ වුවද, ශ්‍රී ලංකාවෙන් ලෝකයට ලබා දුන් මුළු තේ වලින් 51%කට ආසන්න ප්‍රමාණයක් මෙම කලාපයේ රටවල් මගින් ලබාගෙන ඇත. වටිනාකම සම්බන්ධයෙන් වුවද, එමගින් 47.45%ක දායකත්වයක් ලබා දී ඇති අතර එය ප්‍රශස්ථ කාර්ය සාධනයකි. ප්‍රතිඅපනයන දත්ත සැලකිල්ලට නොගන්නා විට, ඉරානය, ඉරාකය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිරියාව, ලිබියාව, කුවේට්, ජෝර්දානය, සෞදි අරාබිය, ලෙබනනය, ඊජිප්තුව, බහරේනය, කටාර් සහ ඕමාන් යන රටවල තේ වෙළඳපොළවල් සියල්ල එකතුව 2020 වසර තුළ දී සියලු රටවලට ආනයනය කරන ලද තේ මෙට්‍රික් ටොන් 256,575ක ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 130,359ක සිලෝන් ප්‍රමාණයක් ආනයනය කර ඇත. ප්‍රමාණාත්මක වශයෙන් එය හරියටම 50.81%ක කොටසක් සහ වටිනාකම අතින් ගත් කල 47.45%ක කොටසක් පෙන්නුම් කරයි. මේ අනුව, සිලෝන් තේවල පැවැත්ම සහතික කරනු වස් මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපය එහි අනිවාර්ය දායකත්වය නැවත වරක් ප්‍රත්‍යක්ෂ කර ඇත.

වගුව 3.6.9. ශ්‍රී ලංකාවෙන් මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු (MENA) කලාපයට තේ අපනයනය කිරීම

රට	2020 (මෙට්‍රික් ටොන්)	වටිනාකම (රු. බිලි)	2019 (මෙට්‍රික් ටොන්)	වටිනාකම (රු. බිලි)
තුර්කිය	38,818	30.9	39,033	28.8
ඉරාකය	33,215	19.0	38,363	19.9
ඉරානය	14,730	13.5	21,920	17.8
ලිබියාව	7,617	5.3	12,255	8.1
සිරියාව	9,444	8.3	10,904	9.6
එ.අ.එ. රාජ්‍යය	8,343	6.7	9,281	6.6
කුවේටය	1,789	2.1	2,212	2.4
ජෝර්දානය	4,566	4.6	5,071	4.6
සවුදි අරාබිය	6,577	8.5	6,490	7.2
ලෙබනනය	2,519	2.5	2,775	2.8
ඊජිප්තුව	2,450	1.9	2,080	1.5
බහරේනය	71	0.1	68	0.1
කටාර්	164	0.2	229	0.3
ඕමානය	55	0.1	118	0.1
අනු එකතුව	130,359	103.8	150,799	109.8
සමස්ථ ශ්‍රී ලංකා අපනයන /වටිනාකම	256,575	218.8	282,832	227.9
ශ්‍රී ලංකාවේ මුළු තේ අපනයනයෙන් එහි කලාපයට අයත් කොටස	50.81%	47.45%	53.32%	48.17%

මූලාශ්‍රය: ශ්‍රී ලංකා වරාය

* තේ ප්‍රති අපනයන පිළිබඳ දත්ත ඇතුලත් නොවේ

ඉරානය

2020 වසරේ දී මෙට්‍රික් ටොන් 21,920 ට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 14,730ක මිල දී ගැනීම් සිදු කළ ඉරානය ටොන් 7,190 ක (48.82%) අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර, කලාපයේ 3 වැනි විශාලතම ආනයනකරු වේ. වසර 2019 හා සැසඳීමේ දී රුපියල් බිලියන 17.8ක ප්‍රමාණයකට සාපේක්ෂව රුපියල් බිලියන 13.5ක වටිනාකමක් වාර්තා කරන ලදී.

ඉරානය සමග ව්‍යාපාර කිරීම සඳහා දිගු කාලීන ණය බොහෝ දුරට අනිවාර්ය වී ඇති අතර එය පහසු කටයුත්තක් නොවේ. තවද, ඉරාන රියාල් ඩොලරයට සාපේක්ෂව ඉතා පහළ මට්ටමකට වැටී ඇති අතර, ගැනුම්කරු - විකුණුම් හවුල්කාරිත්වය ඔස්සේ වර්ධනය වෙමින් ආන්තික ලෙස ශක්තිමත් වී ඇත. යලිත් වරක් පැහැදිලිවම කැපී පෙනෙන ප්‍රවණතාවක් වන්නේ, සිලෝන් තේ වෙනුවට ක්‍රමිකව ඉරාන වෙළෙඳපොළට ඉන්දියානු තේ ප්‍රවිෂ්ට වීමයි. එක්සත් ජනපදය සමග ඇති වූ අර්බුදය උත්සන්න වීමේ ප්‍රතිඵලයක් ලෙස විධිමත් තේ ආනයනය පහත වැටීමක් පෙන්නුම් කළද, විවිධ දේශසීමා හරහා අවිධිමත් ආනයනයන් සිදුවෙමින් පවතින බව සඳහන් කළ යුතුය. පහත බැසීම නොතකා, තවමත් ලංකා තේ සඳහා සිව්වන විශාලතම අපනයන ගමනාන්තය වන්නේ ඉරානය යි.

වගුව 3.6.10. ලංකා තේ ඉරානයට අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	117,286	28,314,802	5,165,981	0	33,598,069	22,236,709,479	661.84
2017	17,986	26,007,579	1,013,855	0	27,039,419	24,039,926,740	889.07
2018	13,276	23,097,323	436,062	0	23,546,661	20,590,941,715	874.47
2019	12,338	21,677,016	230,829	0	21,920,182	17,806,625,539	812.34
2020	7,477	14,526,607	195,432	0	14,729,516	13,525,584,933	918.26

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

ඉරාකය

2020 වසරේ අවසානය වන විට තේ මෙට්‍රික් ටොන් 33,215ක බෙදා හැරීමක් වාර්තා කළ අතර එය 2019 වසරේ එම කාල සීමාව වන විට මෙට්‍රික් ටොන් 38,363ක ප්‍රමාණයක් විය. එනම්, ටොන් 5,148 (15.50)%ක පහත වැටීමක් පෙන්නුම් කිරීමකි. 2020 සඳහා සිලෝන් තේ වල සාමාන්‍ය FOB මිල කිලෝවකට රුපියල් 573.26 ක් විය.

වගුව 3.6.11. ඉරාකයට ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	223,749	14,764,436	17,421,767	0	32,409,951	15,001,396,845	462.86
2017	210,310	14,967,496	19,763,572	0	34,941,379	20,972,963,985	600.23
2018	172,515	19,431,850	18,745,871	400	38,350,636	22,277,418,660	580.89
2019	130,617	20,854,174	17,378,275	0	38,363,065	19,918,484,354	519.21
2020	89,526	18,766,486	14,358,598	0	33,214,609	19,040,645,195	573.26

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

තුර්කිය

තේ සඳහා තුර්කියේ පැවති කේන්ද්‍රීය බව සමාලෝචිත වර්ෂය තුළ, තරමක් අඩු විය. නමුත්, 2020 වසරේ දී ලංකා තේ ගෙන්වන ප්‍රමුඛතම ආනයනකරුවා වන්නේ තුර්කියයි. තුර්කිය 2019 වසරේ මෙට්‍රික් ටොන් 39,033ක් ද, 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 38,818ක් ද ආනයනය කර ඇත. එනම්, පසුගිය වසර (2019) හා සසඳන විට 0.55% අඩු වීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 215ක ප්‍රමාණයකින් පහත වැටී ඇත.

වගුව 3.6.12. තුර්කියට ශ්‍රී ලංකා තේ අපනයනය

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	292,625	17,264,112	9,503,305	0	27,060,042	14,429,009,882	533.22
2017	270,098	21,229,348	16,309,545	0	37,808,990	27,853,256,653	736.68
2018	258,814	19,680,761	15,505,874	0	35,445,448	26,417,738,189	745.31
2019	301,022	21,229,333	17,503,152	25	39,033,532	28,823,235,601	738.42
2020	254,373	24,481,003	14,083,057	0	38,818,433	30,898,768,804	795.98

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

එක්සත් අරාබි එමීර් රාජ්‍යය

ඉරානය සමඟ වෙළඳාම් කිරීමේ දී ඇති වූ දුෂ්කරතාවන් හි බලපෑමෙන් විශේෂයෙන් ප්‍රතිඅපනයන වෙළඳාම මන්දගාමී වීම හේතුවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ භූමිකාව ද මන්දගාමී විය. පවතින සංඛ්‍යාලේඛනවලට අනුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය විසින් 2019 දී තේ මෙට්‍රික් ටොන් 9281 ට සාපේක්ෂව 2020 දී මෙට්‍රික් ටොන් 8343 ක් ආනයනය කර ඇති අතර ඒ අනුව ලංකා තේ ප්‍රමාණය ටොන් 938 කින් (11.24%) පහත බැස ඇත. කෙසේ වෙතත්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය ශ්‍රී ලංකාවෙන් තේ ගෙන්වන 9 වැනි විශාලතම තේ ආනයනකරුවා වශයෙන් කටයුතු කරයි.

වගුව 3.6.13. එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	481,615	12,562,582	4,785,241	23	17,829,461	10,323,566,291	579.02
2017	362,123	9,030,327	5,833,977	0	15,226,428	11,092,211,983	728.48
2018	501,115	7,889,034	2,302,348	6,750	10,699,247	7,516,999,044	702.57
2019	380,558	6,599,333	2,301,178	0	9,281,069	6,617,572,032	713.02
2020	245,274	6,655,543	1,442,137	9	8,342,963	6,692,138,587	802.13

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

සිරියාව හා ලිබියාව

සිරියාව සහ ලිබියාව යන දෙරට ම බරපතල අභ්‍යන්තර අර්බුද වලින් පීඩා විඳියි. මෙම රටවල දෙකම ලංකා තේ සඳහා මනා වෙලඳපොලවල් වේ. කෙසේ වෙතත්, ලිබියාව සහ සිරියාව යන දෙරටෙහි ම ශ්‍රී ලංකාවෙන් සිදු කරන තේ ආනයන ප්‍රමාණයෙහි අඩු වීමක් දක්නට ලැබේ. 2020 වසරේ දී, ලිබියාව තේ මෙට්‍රික් ටොන් 7617ක් ආනයනය කර ඇති අතර එය 2019 වසරේ දී මෙට්‍රික් ටොන් 12,255ක් විය. එනම්, ටොන් 4,638ක (60.88%) පහත බැසීම කි. එමන්ම, සිරියාව වසර 2020 දී මෙට්‍රික් ටොන් 9,444ක් ආනයනය කර ඇති අතර එය 2019 දී මෙට්‍රික් ටොන් 10,904ක් වූ ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 1,460 ක අඩුවීමක් පෙන්නුම් කරයි.

වගුව 3.6.14. සිරියාව වෙත ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම

වසර	බැග්	තොග	ඇසුරුම්	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	905,645	6,690,410	4,366,940	11,962,994	7,796,201,433	651.69
2017	624,297	4,769,427	1,882,092	7,275,816	6,109,479,313	839.7
2018	1,123,349	6,123,790	2,661,536	9,908,675	8,969,898,096	905.26
2019	894,087	6,214,845	3,795,275	10,904,207	9,675,137,557	887.28
2020	679,393	5,142,052	3,622,554	9,443,999	8,340,258,208	883.13

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

වගුව 3.6.15. ලිබියාව වෙත ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම

වසර	බැග්	තොග	ඇසුරුම්	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	15,692	0	12,600,994	12,616,686	6,605,615,230	523.56
2017	47,930	41,000	10,744,150	10,833,080	7,294,199,620	673.33
2018	4,932	10	13,395,388	13,400,330	8,893,932,081	663.71
2019	35,082	113,800	12,106,550	12,255,432	8,084,360,106	659.66
2020	20,448	0	7,596,959	7,617,407	5,295,239,996	695.15

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

කුවේට්

2020 වසරේ දී, කුවේටයේ තේ ආනයනය මෙට්‍රික් ටොන් 2,212 සිට මෙට්‍රික් ටොන් 1,789 දක්වා සැලකිය යුතු අන්දමෙන් පහත වැටී ඇත. මූලික වශයෙන් ඉරානය සහ ඉරාකය සමඟ ඇති දැඩි දේශසීමා පාලනය හේතුවෙන් මෙට්‍රික් ටොන් 423 (23.66%)ක පහත වැටීමක් දක්නට ලැබේ. ජෝර්දානය සහ කුවේට් යන රටවල් දෙකම තම ආනයන දේශීය අවශ්‍යතාවයට අනුව සිදු කරනු ලබයි. සීමා කර ඇත.

වගුව 3.6,16. කුවේටයට ලංකා තේ අපනයනය කිරීම

වසර	බැග්	තොග	ඇසුරුම්	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	496,097	1,032,645	1,957,519	3,486,261	2,230,760,655	639.87
2017	538,663	134,864	1,688,203	2,361,730	2,164,033,210	916.29
2018	532,597	52,820	1,578,670	2,164,087	2,109,399,598	974.73
2019	628,582	47,563	1,536,416	2,212,561	2,427,680,050	1,097.23
2020	582,711	41,945	1,164,174	1,788,830	2,069,373,951	1,156.83

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

ජෝර්දානය

ජෝර්දනයේ විසින් මිලදී ගනු ලැබූ තේ ප්‍රමාණය 2019 වසරේ දී මෙට්‍රික් ටොන් 5071ක් වූ අතර එය 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 4566ක් විය. එනම්, මෙට්‍රික් ටොන් 505ක පහත බැසීම කි.

වගුව 3.6.17. ජෝර්දානයට ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	2,185,904	15,500	1,675,937	0	3,877,341	3,106,022,244	801.07
2017	2,118,569	307,051	2,153,873	0	4,579,493	4,214,303,810	920.26
2018	2,160,601	173,871	2,251,642	0	4,586,114	4,244,647,565	925.54
2019	2,208,886	143,148	2,719,474	0	5,071,507	4,627,822,607	912.51
2020	1,822,087	335,200	2,408,908	0	4,566,195	4,602,366,542	1,007.92

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

ලෙබනනය

ලෙබනනය තුළ, 2012 දී කිලෝ ග්‍රෑම් මිලියන 2.1ක් වූ ලංකා තේ අපනයනය 2013 දී කිලෝ ග්‍රෑම් මිලියන 2.8 දක්වා වර්ධනය වී, 2014 දී කිලෝ ග්‍රෑම් මිලියන 3.4 දක්වා තවදුරටත් වර්ධනය වුව ද, 2015 දී එය කිලෝ ග්‍රෑම් මිලියන 2.4 දක්වා අඩු වී 2017 දී කිලෝ ග්‍රෑම් මිලියන 4.08 දක්වා වර්ධනය විය. පොදු දේශසීමාව හරහා සිරියාවට ඇතැම් තේ ප්‍රමාණයන් ප්‍රවාහනය කළ හැකිය. 2020 වසරේ ලෙබනනය වෙත ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ තේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2519 ක් වූ අතර එහි වටිනාකම රුපියල් මිලියන 2529 කි. 2019 වසරේ දී තේ අපනයන සංඛ්‍යාලේඛන හා සසඳන විට, ලෙබනනයට ශ්‍රී ලංකාවෙන් කරන ලද තේ අපනයනය පරිමාව සහ වටිනාකම අතින් පිළිවෙලින් 10.15% සහ 9.65% දක්වා පහත වැටීමක් වාර්තා වී ඇත.

වගුව 3.6.18. ලෙබනනයට ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු..)	FOB (රු./කිලෝ.)
2016	128,889	100,458	3,217,857	3,447,204	2,478,113,748	718.88
2017	263,514	107,443	3,718,151	4,089,108	3,702,850,128	905.54
2018	140,104	99,817	3,289,044	3,528,966	3,372,181,839	955.57
2019	102,967	86,591	2,585,616	2,775,175	2,802,235,077	1,009.75
2020	170,734	197,479	2,151,012	2,519,226	2,529,907,793	1,004.24

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

ඊජිප්තුව

සාමාන්‍යයෙන් අප්‍රිකානු (විශේෂයෙන් කෙන්යානු) CTC තේ බහුලව භාවිත වන ඉහළ මිල ගණන් සහිත ඊජිප්තු තේ වෙළඳපොල විසින් 2012 දී ශ්‍රී ලංකා තේ කිලෝ ග්‍රෑම් මිලියන 3.6 ක්, 2013 සහ 2014 දී පිළිවෙලින් ශ්‍රී ලංකා තේ කිලෝ ග්‍රෑම් මිලියන 2.0 ක් සහ 2.8 ක් මිලදී ගෙන ඇති අතර එය 2016 දී කිලෝ ග්‍රෑම් මිලියන 3.0 දක්වා ඉහල යාමක් මෙන්ම 2017 දී කිලෝ ග්‍රෑම් මිලියන 1.3 දක්වා පහත වැටීමක් දක්නට ලැබුණි. මොම්බාසා වෙන්දේසියේ මිල ඉතා ශක්තිමත් වන විට, ඊජිප්තුව සාමාන්‍යයෙන් ඔවුන්ගේ හිඟය පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව දෙස යොමු වේ. කෙසේ වෙතත්, ඊජිප්තුව 2019 දී මෙට්‍රික් ටොන 2212ක් ද 2020 දී මෙට්‍රික් ටොන් 2450ක් ද ආනයනය කර ඇත. ලිබියාවට ප්‍රතිඅපනයනය කිරීම සඳහා ද ඊජිප්තුව විසින් ලංකා තේ ආනයනය කරන ලදී.

වගුව 3.6.19. ඊජිප්තුවට ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	61,781	1,652,588	1,333,675	0	3,048,044	1,571,398,241	515.54
2017	53,296	523,960	780,309	720	1,358,285	982,480,785	723.32
2018	66,004	1,165,070	779,558	1,440	2,012,073	1,554,709,265	772.69
2019	628,582	47,563	1,536,416	0	2,212,561	2,427,680,050	1,097.23
2020	53,425	1,615,431	780,364	1,215	2,450,435	1,948,442,179	795.14

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.6.3. ඇත පෙරදිග කලාපය

ජපානය

ලංකා තේ සඳහා පවතින ඉහළම ප්‍රධාන වෙළෙඳපොළ 10 අතර සෑම විටකම ජපානය රැඳී ඇත. ප්‍රධාන වශයෙන්, ශ්‍රී ලංකාව විසින් කළු තේ ජපානයට අපනයනය කරනු ලබන අතර කළු තේ වෙළඳපොල තුළ ආධිපත්‍යය දරයි. ජපානය සෑම විටම සිලෝන් තේ සඳහා ප්‍රධාන අලෙවිසැලක් ලෙස කටයුතු කරයි.විශේෂයෙන්, ඌව සෘතුමය කාලපරිච්ඡේදය තුළ සහ දිඹුල සමයේදී පවා ජපානය කොළඹ වෙන්දේසියේ ප්‍රියතම ආධාරකරුවෙකි. සාම්ප්‍රදායිකව, ශ්‍රී ලංකාව විසින් ජපානයට චාර්ෂිකව තේ කිලෝ ග්‍රෑම් මිලියන 5 සිට 11 දක්වා ප්‍රමාණයක් යවන ලදී. ජපානය ලෝකයේ වඩාත්ම නවීන තේ වෙළඳපොළ ලෙස ස්ථාපිත වී ඇත. නිෂ්පාදනවල ගුණාත්මකභාවය, නිෂ්පාදනවල පිරිසිදුකම සහ ආරක්ෂාව, ඇසුරුම්කරණ නව්‍යතාවයන්, තාක්ෂණික ප්‍රගතිය, සැපයුම් දාමයේ සොයාගැනීමේ හැකියාව සහ විනිවිදභාවය, සොබාදහම සහ පරිසර හිතකාමීත්වය, සමාජ වගකීම සහ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය යන අංශ තුළින් ජපානය ගෝලීය තේ වෙළඳපොලේ ඉහළම ස්ථානයට පත්ව ඇත.

2020 වසරේ දී ජපානයට ශ්‍රී ලංකාවෙන් කරන ලද තේ අපනයනය මෙට්‍රික් ටොන් 5,502 ක් වූ අතර එහි වටිනාකම රුපියල් මිලියන 5,355 කි. 2019 වසරේ තේ අපනයන සංඛ්‍යාලේඛන හා සසඳන විට, ජපානයට ශ්‍රී ලංකාවෙන් කරන ලද තේ අපනයනය පරිමාව අනුව 25.48% ක් ද අගය අනුව 21.81%ක් ද වශයෙන් පහත බැස ඇත.

වගුව 3.6.20. ජපානයට ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	594,921	6,924,875	145,529	55	7,665,379	5,432,535,848	708.71
2017	599,495	7,169,454	51,145	30	7,820,125	6,734,310,116	861.15
2018	664,433	6,620,019	47,484	1,680	7,333,616	6,801,799,958	927.48
2019	650,716	6,688,973	40,523	4,320	7,384,532	6,850,058,309	927.62
2020	672,402	4,774,765	43,947	11,595	5,502,710	5,355,817,413	973.31

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

චීනය

කොවිඩ්19 වසංගතය හේතුවෙන් වසර තුළ රටෙහි දුෂ්කරතාවයන් මතු වුව ද, ප්‍රධාන ආර්ථික ඉලක්ක සමගින් අපේක්ෂිත ඉලක්කවලට වැඩියෙන් ප්‍රතිඵල අත්කර ගනිමින්, 2020 වර්ෂයේදී චීනයේ ආර්ථිකය සියයට 2.3කින් වර්ධනය විය. දේශීය කර්මාන්ත ආරක්ෂා කරමින් ආර්ථික ව්‍යුහයේ නිරන්තර දියුණුව රටේ ආර්ථිකයේ ඉහල වර්ධනයට බලපෑ ප්‍රධාන සාධකයක් විය.

ආර්ථික විශ්ලේෂකයින් අපේක්ෂා කරනුයේ ඉදිරි වසරවල අනෙකුත් ප්‍රවණතා අතර නැගී එන මැද මට්ටමේ ආදායම්ලාභී කණ්ඩායමක්, වේගවත් නාගරීකරණය සහ තාක්ෂණික දියුණුව මගින් රටේ පරිභෝජනය හැඩගැසෙනු ඇති බවයි. 2020 වර්ෂයේ අග භාගයේදී රටෙහි සිටින මිලියන 400ක් වන යෞවනයන් ඇතුළු චීන පාරිභෝගිකයින් එදිනෙදා කටයුතු සියල්ලම පාහේ නැවත ආරම්භ කළ හෙයින්, වසංගත වකවානුව ආරම්භයේදී චීනය ද මුලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී.

විශාල නගරයන් හි තවමත් ඉහල පරිභෝජනයක් දක්නට ලැබුන ද, පහළ මට්ටමේ නගර සහ ග්‍රාමීය ප්‍රදේශ තේ පරිභෝජනය වේගයෙන් වර්ධනය විය. Morgan Stanley ගේ වාර්තාවක් මගින් පැවසූ ආකාරයට 2020 සිට 2030 වන විට චීනයේ කුඩා නගරවල පරිභෝජනය තුන් ගුණයකින් වැඩි වීමට ඉඩ ඇත.

චීනය යනු රට පුරා තේ හල් 400,000ක් සහිත ලොව විශාලතම තේ වෙළඳපොළයි. චීනය විසින් වසරකට තේ කිලෝ ග්‍රෑම් මිලියන 365ක් අපනයනය කරන ලද අතර තේ කිලෝ ග්‍රෑම් මිලියන 42ක් ආනයනය කරන ලදී. ශ්‍රී ලංකා රේගු සංඛ්‍යාලේඛනවලට අනුව, 2020 වසර තුළ ශ්‍රී ලංකාවෙන් චීනය වෙත කරන ලද සෘජු අපනයනය තේ කිලෝ ග්‍රෑම් මිලියන 13.88ක් වන අතර එහි වටිනාකම ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 56.36 කි. එය 2019 වසරේ එම කාලය තුළ දී 19.93% ක ප්‍රමාණාත්මක වැඩිවීමක් පිළිබිඹු කරන අතර වටිනාකම අතින් ගත් කල 15.72% ක හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 7.65ක වර්ධනය කි. කොවිඩ් 19 වසංගතයේ බලපෑමෙන් ඇති වූ HORECA අංශයේ අක්‍රමවත්බව හේතුවෙන් 2020 වර්ෂය තුළ ලංකා තේ අපනයන වර්ධන වේගය අඩු විය. ඉහලම වර්ධනය වාර්තා වී ඇත්තේ තොග තේ අපනයනයෙනි. විශේෂයෙන්ම, වැඩි වටිනාකමක් එකතු කරමින්, චීනයේ පානයට සුදානම් කළ තේ වෙළඳපොළ සඳහා 2020 වසර තුළ ක්ෂණික තේ කිලෝග්‍රෑම් 352,402ක් අපනයනය කර ඇත.

වගුව 3.6.21. චීනයට ලංකා තේ අපනයනය කිරීම

වසර	බැග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	213,625	6,941,115	307,897	0	7,462,636	4,511,365,346	604.53
2017	277,719	8,900,374	279,961	14,260	9,472,315	7,162,246,132	756.12
2018	250,655	8,545,027	285,307	76,980	9,157,969	7,049,346,676	769.75
2019	222,041	10,756,974	250,267	345,780	11,575,062	8,708,146,997	752.32
2020	271,039	13,072,966	186,108	352,402	13,882,514	10,457,244,261	753.27

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

තේ සඳහා අදාළ බදු අනුපාත:. CIF වටිනාකම සඳහා අගය එකතු කළ බද්ද 10% + බදු 7.5 = 17.5%

බදු නොවන බාධක: රස ගන්වන ලද තේ සඳහා චීන රේගුව මගින 2019 මාර්තු සිට චාරණ පනවන ලදී. පළතුරු කොටස්, මල් කොටස් හා වෙනත් ශාකමය කොටස් තේ සමග එකතු කිරීම තහනම් ය.

ඕස්ට්‍රේලියාව

දශක කිහිපයකට පෙර, මූලික වශයෙන් ඕස්ට්‍රේලියාව ලිහිල් තේ වෙළඳපොලක් වූ අතර එම වකවානුවෙ හි නියත සැපයුම්කරුවෙකු වශයෙන් "සිලෝන් තේ" වෙළඳපොල තුළ ප්‍රධාන විය. කෙසේ වෙතත්, බහුජාතික සමාගම්, සෙමින් නමුත් ක්‍රමානුකූලව හඳුන්වා දුන් තේ බැග් වර්තමානය වන විට දළ වශයෙන් 80%ක සිල්ලර වෙළඳපල කොටසක් සහිතව වඩාත් ජනප්‍රිය වර්ගය බවට පත්ව ඇත.

දශක කිහිපයකට පෙර, ලංකා තේ වෙළඳපොලේ ප්‍රමුඛයා වූ වකවානුවෙ හි, ඕස්ට්‍රේලියාව විසින් වසරකට තේ කිලෝ ග්‍රෑම් මිලියන 30කට ආසන්න ප්‍රමාණයක් ආනයනය කරන ලදී. කෙසේ වෙතත්, අනෙකුත් තරගකාරී පාන වර්ග පුළුල් ලෙස පැතිරීමත් සමග මෙන්ම පාරිභෝගික වෙළඳපොල තුළ තේ බැග් භාවිත වීමත් සමග මුළු ආනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 12 සිට 13 දක්වා පහත වැටී ඇත.

ඉන්දුනීසියාව සහ පැපුවා නිව්ගිනියාව සමස්ත 1990 ගණන්වල ඕස්ට්‍රේලියාවට තොග තේ සපයන ප්‍රමුඛයන් දෙදෙනෙකු වූ අතර වත්මනේ දී එම තත්වය පිරිහෙමින් පවතී. ශ්‍රී ලංකාව තේ බැග් සහ ලිහිල් තේ ඇසුරුම් සම්බන්ධයෙන් ප්‍රධාන බෙදාහරින්නා ලෙස දිගටම පැවතුනි.ටාටා ගෝලීය පාන සමාගමේ (ටැට්ලේ) සන්නාමය සහ යුනිලිවර් හි ලිප්ටන් (Lipton) සන්නාමය හේතුවෙන් ඉන්දියාව 2004 වසරේ සිට ඕස්ට්‍රේලියාවට විශාලතම තේ අපනයනකරුවා බවට පත් විය.

වගුව 3.6.22. ඕස්ට්‍රේලියාවට තේ ආනයනය කිරීම

රට	2016	2017	2018	2019
ඉන්දියාව	2,600	2,400	2,200	2,400
ශ්‍රී ලංකාව	2,100	2,400	2,300	2,300
ඉන්දුනීසියාව	1,700	1,700	1,300	2,100
චීනය	1,900	2,000	2,100	400
හොන්කොන්	250	300	340	360
කෙන්යාව	40	-	-	10
එක්සත් රාජධානිය	280	300	300	200
පැපුවා නිව්ගිනියා	1,000	950	1,000	1,100
වෙනත් රටවල්	930	1,070	1,060	950
එකතුව	10,800	11,120	10,600	9,820
ප්‍රති අපනයන	200	220	200	220
ශුද්ධ ලාභය	10,600	10,900	10,400	9,600

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුවල පුවත් සඟරාව

වගුව 3.6.23. ඕස්ට්‍රේලියාවට ලංකා තේ ආනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	1,595,376	326,788	445,094	3,964	2,371,221	3,126,062,748	1,318.33
2017	1,855,089	280,807	532,920	0	2,668,815	3,987,876,596	1,494.25
2018	1,413,069	303,820	398,164	0	2,115,053	3,417,964,634	1,616.02
2019	1,948,481	271,261	585,481	30	2,805,252	4,637,692,074	1,653.22
2020	972,836	282,645	356,943	60	1,612,484	2,585,156,997	1,603.21

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී ශ්‍රී ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණයෙහි වැඩිවීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්,කොවිඩ් 19 වසංගත අර්බුදය හේතුවෙන් 2020 දී ශ්‍රී ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට කරන ලද තේ අපනයනයෙහි පහත වැටීමක් දක්නට හැකිය.

දකුණු කොරියාව

කොරියාවේ බහුල වශයෙන් කෝපි පරිභෝජනය කරන අතර වේගයෙන් පරිභෝජනය වර්ධනය වෙමින් පවතී. පාරිභෝගිකයන් සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වන හෙයින් තේ පරිභෝජනය ද වඩාත් ජනප්‍රිය වෙමින් පවතී.

කොවිඩ් 19 හි බලපෑම සහ සමාජ දුරස්ථභාවයන් අනුගමනය කිරීම හේතුවෙන් ආහාර සේවා අලෙවිසැල් වෙත පැමිණීම යම් ආකාරයකට සීමා වූ අතර ඒ හේතුවෙන් 2020 වසරේ දී කොරියාවේ සිල්ලර තේ අලෙවිය ඉහළ යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස අවසාන වශයෙන් තොග අලෙවි ප්‍රමාණයෙහි පහත වැටීමක් දක්නට ලැබුණි. නිවසේ සිට වැඩ කිරීමට හෝ අධ්‍යයන කටයුතු කිරීමට රජය විසින් පුද්ගලයන් දිරිමත් කරන ලද බැවින්, නිවසේ වැඩි කාලයක් ගත කිරීමට සිදු වීමෙන් තේ පානය කිරීමේ අවස්ථා වැඩි වූ අතර, සියලුම තේ වර්ග සඳහා ඉල්ලුම ඉහළ ගියේය.

වසංගත තත්වය ඇතිවීම සහ ගෘහස්ත තේ පරිභෝජනය කෙරෙහි වැඩි වශයෙන් යොමුවීම ඇසුරුම් ආකෘති කෙරෙහි ද බලපා ඇත. පාසල් වසා තැබීම නිසාවෙන් දීර්ඝ කාලයක් නිවසේ ගත කිරීම සහ බොහෝ ආයතන නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් 2020 වසරේ දී ගෘහස්ථ තේ පරිභෝජනය ඉහළ යාමත් සමග පවුලේ පරිභෝජනය සඳහා සකස් කළ විශාල ප්‍රමාණයේ ඇසුරුම් ආකෘතිවල කැපී පෙනෙන නැගීමක් ඇති වී තිබේ.

වගුව 3.6.24. දකුණු කොරියාවේ මුළු තේ ආනයනය (HS කේතය (0902), (වටිනාකම ඇ.ඩො 1,000 සහ බර කිලෝ ග්‍රෑම්වලින්)

වසර	වටිනාකම	බර	බර වෙනස්වීම	බර වෙනස්වීම % වශයෙන්
2016	10,466	825,047	18,351	2%
2017	16,004	1,187,599	362,552	44%
2018	20,851	1,514,054	326,455	27%
2019	20,039	1,509,824	-4,230	0%
2020	21,220	1,373,514	-136,310	-9%

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුව

දකුණු කොරියානු පාරිභෝගිකයින් සාමාන්‍යයෙන් තාක්ෂණික දැනුමෙන් යුක්තය. ඔවුන්ගේ සාප්පු සවාරි යාම හා මිලදී ගැනීමේ ආකාරය කෙරෙහි මෙය දැඩි බලපෑමක් ඇති කරයි. දකුණු කොරියාවේ තරුණ ජනගහනයෙන් බොහොමයක් දෙනා ලබා ගත හැකි නිෂ්පාදන පිළිබඳ තොරතුරු සෙවීමට සහ එකි නිෂ්පාදන අදහස් දැක්වීම තුළින් ඒ පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට සමාජ මාධ්‍ය සහ වෙනත් අදාළ මාර්ගගත වේදිකා භාවිත කරයි. Embrain Trend Monitor වැනි පුද්ගලික සමාගම් විසින් මෑතකදී කරන ලද සමීක්ෂණවලට අනුව, දකුණු කොරියානු පාරිභෝගිකයින්ගෙන් 79% ක් මිලදී ගැනීම් කිරීමට පෙර පරිශීලක සමාලෝචන පරීක්ෂා කරන අතර 74%ක ප්‍රමාණයක් විසින් සඳහන් කරන ලද්දේ ඔවුන් ඇගයීම් හෝ සමාලෝචන ලියා ඇති බවයි. තාක්ෂණික දැනුමෙන් හෙබි මෙම පාරිභෝගිකයින් නිෂ්පාදනවල වටිනාකම විනිශ්චය කිරීමට පමණක් නොව, හොඳම නිෂ්පාදන හොඳම මිලට සොයා ගැනීම සඳහා ද මාර්ගගත මාධ්‍යයන් බොහෝ වශයෙන් භාවිත කරනු ලබයි. සිලෝන් තේ සහ එමගින් ලැබෙන සෞඛ්‍ය ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගගත/සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් මගින් දිගුකාලීනව කොරියානු වෙළෙඳපොළේ ලංකා තේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම වර්ධනය කිරීමට දායක වනු ඇත.

2020 වසරේ දී ශ්‍රී ලංකාව විසින් දකුණු කොරියාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 238.78ක් වූ අතර එහි වටිනාකම රුපියල් මිලියන 308.89 කි. 2019 තේ අපනයන සංඛ්‍යාලේඛන හා සැසඳීමේ දී, පරිමාව අතින් සැලකීමේ දී 12.86% ක පහත බැසීමක් සහ වටිනාකම අනුව දකුණු කොරියාව වෙත ශ්‍රී ලංකා තේ අපනයනයේ 4.96%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වගුව 3.6.25. දකුණු කොරියාවට ලංකා තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	10,010	86,227	11,237	0	107,473	98,863,059	919.88
2017	14,176	154,224	13,698	4,032	186,130	211,271,230	1,135.07
2018	24,363	118,960	18,598	5,092	167,012	222,735,666	1,333.65
2019	18,585	231,064	17,374	7,002	274,025	294,307,710	1,074.02
2020	30,974	171,394	30,825	5,587	238,780	308,894,360	1,293.64

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.6.4 උතුරු සහ දකුණු ඇමරිකානු කලාපය

ඇමරිකා එක්සත් ජනපදය

රුසියාවට සහ පකිස්ථානයට පසුව ලෝකයේ තේ ආනයනය කරන 03 වැනි විශාලතම රට ලෙස ඇමරිකා එක්සත් ජනපදය සැලකේ. නම්‍යශීලී බව, පහසුව සහ සීනි සහිත පාන වර්ග වෙනුවට භාවිත කළ හැකි සෞඛ්‍ය සම්පන්න විකල්ප පානයක් වශයෙන් මිනිසුන් තේ පානය සඳහා වැඩි කැමැත්තක් දක්වයි. එක්සත් ජනපදයේ බීම භාවිත කරන පාරිභෝගිකයන් අතර සොඳා දහමට සමීප බීම වර්ග කෙරෙහි වූ ඉල්ලුම ඉහල ය. පාරිභෝගිකයින්, විශේෂයෙන්ම නව යෞවනයන්, අතර කෘතිම අමු ද්‍රව්‍ය නොමැති හා අඩු කාලයකින් හා ශ්‍රමයකින් සකස් කරන ආහාර හා බීම වර්ග සඳහා ඉල්ලුමක් පවතී.

චීනය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, වියට්නාමය සහ ඉන්දුනීසියාව අභිබවා ආර්ජන්ටිනාව 36.4% ක කොටසක් සහිතව ඇමරිකා එක්සත් ජනපදයට තේ සපයන ප්‍රධාන සැපයුම්කරු වශයෙන් සිටී. ප්‍රධාන හරිත තේ සැපයුම්කරුවන් වූයේ චීනය සහ ජපානයයි. වටිනාකම අතින් ගත් කල, ජපානය, ආර්ජන්ටිනාව සහ ඉන්දියාව චීනය 2020 වසරේ දී ඇමරිකා එක්සත් ජනපදය තේ ආනයනය කරන ලද ප්‍රධාන මූලාශ්‍රය බවට පත් විය.

වගුව 3.6.26. ඇමරිකා එක්සත් ජනපදය ට තේ ආනයනය කිරීම

රට	2016	%	2017	%	2018	%	2019	%	2020	%
ශ්‍රී ලංකාව	5458	4.2	5245	4.2	5829	4.9	6906	5.9	6214	5.9
ඉන්දියාව	15141	11.5	14722	11.7	12748	10.7	12599	10.8	13716	13.0
ඉන්දුනීසියාව	4082	3.1	3637	2.9	3357	2.8	4991	4.3	3759	3.6
වියට්නාමය	6023	4.6	6857	5.4	6561	5.5	5402	4.6	4993	4.7
චීනය	19389	14.8	16939	13.4	16983	14.2	16327	13.9	11512	10.9
කෙන්යාව	3129	2.4	3171	2.5	2003	1.7	2212	1.9	2428	2.3
ආජන්ටිනාව	53230	40.6	52111	41.3	49195	41.2	43881	37.4	38447	36.4
මලවි	9220	7.0	7422	5.9	5651	4.7	6543	5.6	4615	4.4
වෙනත් රටවල්	15440	11.8	16224	12.8	17058	14.3	18316	15.6	20010	18.9
එකතුව	131112		126328		119385		117177		105694	

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුව

වගුව 3.6.27. ඇමරිකා එක්සත් ජනපදය ට සිලෝන් තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	823,284	1,392,534	2,125,706	177,940	4,519,463	3,747,335,202	829.15
2017	563,956	1,294,654	2,041,389	137,606	4,037,606	3,844,081,759	952.07
2018	538,552	1,842,866	2,051,453	210,800	4,643,670	4,374,047,532	941.94
2019	583,794	3,358,000	2,179,269	135,332	6,256,395	5,379,452,336	859.83
2020	441,335	2,633,053	1,750,159	27,168	4,851,715	4,285,775,822	883.35

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

2019 වසර තුළ ශ්‍රී ලංකාවෙන් කරන ලද අපනයනය මෙට්‍රික් ටොන් 6,256 ක් වූ අතර එහි වටිනාකම දළ වශයෙන් රුපියල් බිලියන 5.4 කි. 2020 වර්ෂය තුළ රුපියල් බිලියන 4.28 ක වටිනාකමකින් යුත් ලංකා තේ මෙට්‍රික් ටොන් 4,851 ක් අපනයනය කර ඇත.

කැනඩාව

මිනිසුන් අතර සෞඛ්‍යය සහ යහපැවැත්ම පිළිබඳ උනන්දුව වර්ධනය වීම හේතුවෙන් තේ මගින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ මිනිසුන්ගේ දැනුවත්භාවය වැඩි වී තිබේ. කැනඩා ජාතිකයන් සෑම වසරකම තේ කෝප්ප බිලියන 10 කට වඩා පානය කරන අතර කැනඩාවේ ජනගහනය 35,881,659 කි. ප්‍රමිතියෙන් යුත් කළු තේ ප්‍රමුඛව හාවිත වන තේ වර්ගය ලෙස පවතින අතර, තේ අලෙවියෙන් 84%ක ප්‍රමාණයක් සඳහා දායක වේ. කැනඩාව 2019 වසර තුළ කළු තේ මෙට්‍රික් ටොන් 14,598ක් ආනයනය කර ඇති අතර 2020 දී 4.90%ක වෙළඳපල කොටසක් සහිතව මෙට්‍රික් ටොන් 716ක් ශ්‍රී ලංකාවෙන් ආනයනය කර ඇත.

වගුව 3.6.28. කැනඩාවට තේ ආනයනය කිරීම (මෙට්‍රික් ටොන් වලින්)

රට	2016	2017	2018	2019	2020
ඉන්දියාව	2847	3249	2500	3031	2811
ශ්‍රී ලංකාව	756	709	733	716	767
ඉන්දුනීසියාව	194	183	197	136	206
චීනය	1132	918	786	498	408
ජපානය	43	33	63	54	61
වියට්නාමය	27	16	18	12	05
කෙන්යාව	972	954	1091	1095	897
මලාවි	157	81	52	24	35
ටැන්සානියාව	76	102	74	0	0
එක්සත් රාජධානිය	3301	3442	3188	3185	3424
ජර්මනිය	197	162	135	142	197
අනෙකුත් යුරෝපා රටවල්	214	213	306	481	501
අ.එ.ජ	5253	4922	4561	4208	3940
ආජන්ටිනාව	165	226	198	205	293
වෙනත් රටවල්	422	523	621	811	742
එකතුව	15756	15733	14523	14598	14287

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුවල ප්‍රවත් සඟරාව

2020 වසරේ දී ශ්‍රී ලංකාවෙන් කැනඩාවට කරන ලද තේ අපනයනය මෙට්‍රික් ටොන් 445ක් වූ අතර එහි වටිනාකම රුපියල් මිලියන 580ක් විය. 2019 වසරේ තේ අපනයන සංඛ්‍යාලේඛන හා සසඳන විට, කැනඩාව වෙතට සිදුකරන ලද ශ්‍රී ලංකා තේ අපනයනය ප්‍රමාණය අතින් 12%කින් ද වටිනාකම අතින් 8%කින් ද අඩුවීමක් වාර්තා කර ඇත.

වගුව 3.6.29. කැනඩාවට තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	117,892	165,505	133,088	416,486	484,912,387	1,164.30
2017	104,475	311,798	171,725	587,997	696,188,048	1,184.00
2018	88,194	239,478	134,181	461,853	567,139,263	1,227.97
2019	86,969	285,475	135,040	507,483	627,831,800	1,237.15
2020	79,548	205,544	159,765	444,857	579,756,375	1,303.24

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.6.5 යුරෝපීය කලාපය

ප්‍රංශය

සාම්ප්‍රදායිකව ප්‍රංශයේ වැසියන් තේ වලට වඩා කෝපිවලට ප්‍රිය කරති. කෙසේ වෙතත්, තේ මගින් වැඩි වැඩියෙන් නව පාරිභෝගිකයින් ආකර්ෂණය කරනු ලබයි. පාරිභෝගිකයින්ගේ පක්ෂපාතිත්වය රඳවා ගැනීම සඳහා නිෂ්පාදකයින් උත්සහ දරනු ලබයි.

මෙට්‍රික් ටොන් 8,425ක වෙළඳපල ප්‍රමාණයක් සහිත කළු තේ මගින් සමස්ථ ආනයනයෙන් 49% නියෝජනය කරන අතර මෙට්‍රික් ටොන් 8,901ක පරිමාවක් සහිත හරිත තේ සහ මුළු ආනයනයෙන් 51%ක කොටසකට හිමිකම් කියනු ලබයි. ප්‍රංශයට ආනයනය කරනු ලබන තේවලින් 75%ක් පමණ පෙර ඇසුරුම් කළ ඒවා වන අතර 25%ක ප්‍රමාණයක් පමණ තොග වශයෙන් ආනයනය කරනු ලබයි. 19%ක කොටසක් සහිතව විශාලතම කළු තේ සැපයුම්කරු වන්නේ චීනයයි. ශ්‍රී ලංකාව (16%), ජර්මනිය (16%), බෙල්ජියම සහ ලක්සම්බර්ග් ද මේ අතර වේ. 40%ක ප්‍රමුඛ කොටසක් සහිතව චීනය හරිත තේ සැපයුම සම්බන්ධයෙන් ප්‍රධාන වේ. ජර්මනිය (23%)ක හා බෙල්ජියම (3%)ක කොටසකට හිමිකම් කියනු ලබයි

.

වගුව 3.6.30. ප්‍රංශයට තේ ආනයනය කිරීම

රට	2016	2017	2018	2019
ඉන්දියාව	541	554	764	706
ශ්‍රී ලංකාව	1032	1157	1132	1367
චීනය	1661	1602	1520	1590
කෙන්යාව	16	0	3	1
එක්සත් රාජධානිය	601	463	439	392
බෙල්ජියම සහ ලක්සම්බර්ග්	1287	1335	1317	911
ජර්මනිය	953	1086	1078	1343
වෙනත්	2204	2187	2265	2115
චීනය (G)	4393	4318	5068	3590
බෙල්ජියම (G)	421	360	323	290
ජර්මනිය (G)	1156	1776	1610	2068
වෙනත් (G)	2473	2590	2663	2953
මුළු ආනයන	16738	17428	18182	17326

මූලාශ්‍රය: ජාත්‍යන්තර වෙළඳ කම්ටුවල පුවත් සඟරාව

වගුව 3.6.31. ප්‍රංශයට සිලෝන් තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු..)	FOB (රු./කිලෝ.)
2016	151,758	195,264	316,067	0	663,088	619,791,211	934.70
2017	100,732	283,134	277,016	0	660,883	728,983,533	1,103.05
2018	87,106	277,752	443,421	28	808,307	866,429,048	1,071.91
2019	117,473	236,559	397,530	1,280	752,842	863,055,913	1,146.40
2020	123,244	182,030	314,193	171	619,637	793,366,065	1,280.37

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

එක්සත් රාජධානිය

"සිලෝන් තේ"යනු එක්සත් රාජධානියේ වෙළඳපොල තුළ සුප්‍රසිද්ධ සහ ස්ථාපිත සන්නාමයකි. මෑත වසරවල දී, එක්සත් රාජධානියේ වෙළඳපොළට සිදු කරන ලද ශ්‍රී ලංකා තේ අපනයනය (අපනයන අගය මත පදනම්ව) පිළිවෙලින් 42%, 14%, 7% හා 6.4%ක වෙළඳපොල කොටසකට හිමිකම් පෑ කෙන්යාව, ඉන්දියාව, මලාවි සහ පෝලන්තයට ද පිටුපසින් 4.1%ක වෙළඳපල කොටසක් චාර්තා කරමින් 5වන ස්ථානය දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. තවද, ශ්‍රී ලංකාව කළු තේ සඳහා 7වන සැපයුම්කරු වන අතර එක්සත් රාජධානියට ආනයනය කරන කළු තේ ප්‍රමාණයෙන් 2.7% ක් වේ.

මුලික වශයෙන් මිල තරගයේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් රාජධානිය තුළ ශ්‍රී ලංකාවේ වෙළඳපල කොටස හැකිලී ඇත. කෙසේ වෙතත්, සිලෝන් තේ සාර්ථක ලෙස වෙළඳපොලෙහි අලෙවි කරන නිර්මාණශීලී ශ්‍රී ලාංකේය අපනයනකරුවන් සිටින අතර, එමගින් සුබෝපභෝගී අයිතමයක් වශයෙන් ලංකා තේ නැවත ස්ථානගත කිරීම සඳහා ප්‍රධාන අවස්ථාවක් ජනිත කරනු ලබයි. 2020 වසරේ දී එක්සත් රාජධානියට ශ්‍රී ලංකාවෙන් සිදු කළ තේ අපනයනය මෙට්‍රික් ටොන් 964ක් වූ අතර එහි වටිනාකම රුපියල් මිලියන 1,369ක් විය. 2019 වසරේ තේ අපනයන සංඛ්‍යාලේඛන හා සසඳන විට, එක්සත් රාජධානියට ශ්‍රී ලංකා තේ අපනයනය පරිමාව අනුව සහ වටිනාකම අනුව පිළිවෙලින් 3.39% සහ 18.22%ක අඩුවීමක් චාර්තා කර ඇත.

වගුව 3.6.32. එක්සත් රාජධානියට සිලෝන් තේ අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම(රු.,)	FOB (රු./කිලෝ.)
2016	187,715	614,889	154,444	2	957,050	1,168,146,373	1,220.57
2017	210,128	842,662	152,725	1,000	1,206,515	1,628,712,009	1,349.93
2018	212,934	538,120	199,418	0	950,473	1,594,092,563	1,677.16
2019	204,422	571,006	222,351	0	997,779	1,675,067,750	1,678.80
2020	187,079	535,603	241,246	0	963,928	1,369,850,226	1,421.11

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

3.6.6 දකුණු ආසියානු කලාපය සහ අනෙකුත් රටවල්

ඉන්දියාව

ඉන්දියාවේ තේ වෙළඳපොලෙ හි සෞඛ්‍ය සම්පන්න බිම වර්ග නිෂ්පාදනය හා පානය බහුල ව පවති. 2020 වසරේ දී, රට තුළ තේ ටොන් මිලියන 1.10 කට ආසන්න ප්‍රමාණයක් පරිභෝජනය කර ඇත. 2021-2026 කාල වකවානුව තුළ රටේ වෙළඳපොළ තවදුරටත් 4.2%ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයක් අනුව වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වර්ෂ 2026 දී, ඉන්දියාවේ තේ කර්මාන්තය ටොන් මිලියන 1.40ක ප්‍රමාණයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉන්දියාවේ තේ කර්මාන්තය තුළ ඉහළ මට්ටමකින් රටේ සමාජ-ආර්ථික පන්ති හරහා බීම පරිභෝජනය කරනු ලබයි. ඉන්දියාවේ ඉහල ආර්ථික වර්ධනය සහ පසුව ඇති වූ (මූලාශ්‍රය: ඉන්දියා තේ මණ්ඩලය) මධ්‍යම පාන්තික ජනගහනය ද ගුණයෙන් උසස් සන්නාමවලට වැඩි රුචිකත්වයක් දක්වන බැවින් එය කර්මාන්තයේ වර්ධනය සඳහා හේතුවන බව සඳහන් කළ හැකිය.

වගුව 3.6.33. ඉන්දියාවට සිදු කළ සමස්ථ තේ ආනයනය

වසර	ප්‍රමාණය (කි.ග්‍රෑම් මිලියන)	CIF අගය (ඇ.ඩො මිලියන)	ඒකක/මිල (ඇ.ඩො/ කිලෝ)
2016	20.97	42.49	2.03
2017	21.12	45.97	2.18
2018	24.92	50.62	2.03
2019	15.85	33.9	2.14
2019 (ජන -නොවැ)	14.67	31.79	2.17
2020 (ජන -නොවැ)	21.14	50.01	2.37

මූලාශ්‍රය : ඉන්දියා තේ මණ්ඩලය

වෙළඳපොලේ ඇති ප්‍රධාන ලංකා තේ සන්නාම: ඩිල්මා (Dilmah) (උතුරු සහ නැගෙනහිර ප්‍රාන්ත). වෙළඳපොලේ පවතින අනෙකුත් ආනයනික තේ සන්නාම: Twinings, Lipton, Tazo, Yorkshire තේ, TWG තේ, Tetley Market leaders: Tata Global Beverages Limited, Hindustan Unilever Limited, Gujarat Tea Processors iy Packers Ltd, Amar Tea Private Ltd, Organic India Private Ltd , Duncans Industries Ltd, Pataka Industries Private Ltd.

2020 වසරේ දී මෙට්‍රික් ටොන් 613 ක් සිලෝන් තේ ඉන්දියාවට අපනයනය කරන ලද අතර එහි වටිනාකම රුපියල් මිලියන 455 කි.

වගුව 3.6.34. ලංකා තේ ඉන්දියාවට අපනයනය කිරීම

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු..)	FOB (රු./කිලෝ.)
2016	18,837	1,060,255	2,626	0	1,081,718	724,703,863	669.96
2017	12,574	255,588	2,992	8,797	279,951	244,099,530	871.94
2018	14,062	824,377	2,092	30	840,561	820,261,593	975.85
2019	5,364	3,337,202	5,737	9,503	3,357,806	3,086,226,902	919.12
2020	5,789	596,890	1,559	9,091	613,329	455,070,810	741.97

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

දකුණු අප්‍රිකාව

දකුණු අප්‍රිකාවේ කළු තේ වෙළඳපොල වසරකට මෙට්‍රික් ටොන් 27,000ක් වේ. සමස්ථ උණුසුම් බීම වෙළඳපොල ඩොලර් මිලියන 600ක වටිනාකමකින් යුක්තය. දකුණු අප්‍රිකාව විසින් මලාවි, ශ්‍රී ලංකාව, සිම්බාබ්වේ, ටැන්සානියාව සහ කෙන්යාවෙන් කළු තේ ආනයනය කරනු ලබයි. මලාවි යනු දකුණු අප්‍රිකාවට තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රට වේ. එය වසරකට මෙට්‍රික් ටොන් 14,000 ත් 18,000 ත් අතර ප්‍රමාණය කි.

රුයිබෝස් යනු දකුණු අප්‍රිකාවේ වගා කරන වඩාත් ජනප්‍රිය දේශීය වාණිජ තේ ප්‍රභේදය වන අතර එයින් කොටසක් වෙනත් රටවලට ද අපනයනය කරනු ලබයි (වසරකට මෙට්‍රික් ටොන් 6,000). කෙසේ වෙතත්, පසුගිය වසර 20ක කාලයක පටන් රුයිබොස් තේ අස්වැන්නේ අබණ්ඩව පහත වැටීමක් දක්නට ලැබුන අතර සාමාන්‍ය නිෂ්පාදක මිල මධ්‍යස්ථ මට්ටමකින් ඉහළ නගී. 2014 වසරේ දී, ඔවුන් භූගෝලීය දර්ශකය (GI) යටතේ වෙළඳ ලකුණ සුරක්ෂිත කරගෙන තිබේ. සාම්ප්‍රදායික තේ සහ තේ බෑග් වලට වඩා විශේෂිත තේ සහ අයිස් තේ වැනි අගය එකතු කළ තේ නිෂ්පාදන මෙම වෙළඳපොලේ වඩාත් ජනප්‍රිය ව පවතී. වර්තමානයේ ලිප්ටන් සමාගම විසින් දකුණු අප්‍රිකානු වෙළඳපොල සඳහා ටින් කළ සහ අයිස් තේ නිෂ්පාදනය කරනු ලබන අතර එම නිෂ්පාදන සුපිරි වෙළඳපොල දාමවල ඉතා ජනප්‍රිය ය. Tetley යනු දකුණු අප්‍රිකාවේ නැගී එන තේ සන්නාමය යි.

ෆයිව් රෝසස් යනු සිලෝන් බ්ලෙන්ඩ් ඇතුළු තේ ප්‍රභේද ගණනාවක් නිෂ්පාදනය කරනු ලබන දකුණු අප්‍රිකාවේ (වෙළඳපොල කොටසෙන් 50%කට වඩා වැඩි) තේ සන්නාමය වේ. ඩිල්මා හා බැසියුර් සහ ටී හෝයු මගින් දකුණු අප්‍රිකාවට පිරිසිදු ලංකා තේ සපයනු ලබන නමුත් සැලකිය යුතු ප්‍රමාණයකින් නොවේ. බැසිලූර් තේ සමාගම විසින් දකුණු අප්‍රිකාවේ "පිරිසිදු ලංකා තේ" අලෙවිය සඳහා වෙන් කළ අවකාශයක් සහිත "අව්‍යාජ තේ හා කෝපි නිවාස " විවෘත කරන ලදී.

වගුව 3.6.35. පැසවා ගත් කළු තේ ආනයනය කිරීම (පරිමාව මෙට්‍රික් ටොන් වලින්)

රට	2016	2017	2018	2019	2020
මලවි	18,518	16,744	12,212	11,445	12,852
සිම්බාබ්වේ	3,761	4,288	4,867	5,156	4,545
ටැන්සානියාව	1,884	2,898	1,464	2,041	2,585
ශ්‍රී ලංකාව	2,035	1,763	1,715	1,616	2,681
කෙන්යාව	715	599	673	567	690
එකතුව	27,680	27,051	21,905	20,824	23,353

ජාත්‍යන්තර තේ කමිටුවේ මාර්ග සිතියම සහ දකුණු අප්‍රිකාණු ආදයම් සේවය (SARS)

වගුව 3.6.36. HS 090240 යටතේ කළු පැසුණු තේ ආනයනය කිරීම (රස ගන්වන ලද හෝ එසේ නොකළ, කිලෝ ග්‍රෑම් 3ට වැඩි කළු පැසුණු තේ සහ අර්ධ වශයෙන් පැසුණු තේ ඇසුරුම්) - වටිනාකම (ඇ.ඩො) දහස් වලින්

රට	2016	2017	2018	2019	2020
මලාවි	26,817	25,780	19,385	17,943	17,198
සිම්බාබ්වේ	4,795	5,696	6,883	6,750	5,428
ටැන්සානියාව	4,305	6,417	3,300	3,726	4,584
ශ්‍රී ලංකාව	7,629	8,237	7,926	5,850	6,386
කෙන්යාව	2,318	1,953	2,070	1,408	1,619
එකතුව	45,864	48,081	39,564	35,677	35,215

ජාත්‍යන්තර තේ කමිටුවේ මාර්ග සිතියම සහ දකුණු අප්‍රිකාණු ආදයම් සේවය (SARS)

වගුව 3.6.37. HS 090230 යටතේ කළු පැසුණු තේ ආනයනය කිරීම (රස ගන්වන ලද හෝ එසේ නොකළ, කිලෝ ග්‍රෑම් 3ට අඩු හෝ සමාන කළු පැසුණු තේ සහ අර්ධ වශයෙන් පැසුණු තේ ඇසුරුම්)

රට	2016	2017	2018	2019	2020
මලවි	25	51	26	23	8
සිම්බාබ්වේ	28	54	29	83	48
ටැන්සානියාව	0	1	0	0	0
ශ්‍රී ලංකාව	186	349	172	282	123
කෙන්යාව	0	1	8	4	12
එකතුව	239	456	235	392	191

ජාත්‍යන්තර තේ කමිටුවේ මාර්ග සිතියම සහ දකුණු අප්‍රිකානු ආදායම් සේවය (SARS)

2020 වසරේ දී , දකුණු අප්‍රිකාව විසින් උක්ත රටවල් හැර අනෙකුත් රටවලින් තේ මෙට්‍රික් ටොන් 614ක් ආනයනය කරන ලද අතර දකුණු අප්‍රිකානු සම්භවයක් ඇති කළු පැසුණු තේවලින් මෙට්‍රික් ටොන් 4,853ක් ලොව අනෙකුත් රටවලට අපනයනය කර ඇත. එම වසර තුළ දී, දකුණු අප්‍රිකාව කළු තේ මෙට්‍රික් ටොන් 5ක් ප්‍රති අපනයනය කර ඇත.

පකිස්ථානය

කෙන්යාව සහ නැගෙනහිර අප්‍රිකානු රටවල් විසින් පකිස්ථානයේ තේ වෙළඳපොල ආධිපත්‍යය උසුලනු ලබයි. පකිස්ථාන පාරිභෝගිකයන් කෙන්යානු තේවල රසයට හුරුවී සිටිති. වර්තමානයේ පකිස්ථානයට සිදු කරනු ලබන ලංකා තේ අපනයනය ඉතා අවම මට්ටමක පවතී. 2020 වසර තුළ දී එය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 150.79ක් වූ අතර 2019 වසරේ දී එම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 129.74ක් විය. ප්‍රධාන වශයෙන් CTC වර්ගයේ තේ සඳහා වන මිල තරගකාරිත්වය සහ රුචිකත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය පහත බසින් පවතී.

වගුව 3.6.38. පකිස්ථානයට සිලෝන් තේ අපනයනය

වසර	බෑග්	තොග	ඇසුරුම්	ඇසුරුම් (>3 කිලෝ)	මුළු ප්‍රමාණය (කිලෝ)	වටිනාකම (රු.)	FOB (රු./කිලෝ.)
2016	12,373	940,366	3,503	0	956,242	439,999,498	460.13
2017	10,681	115,880	2,341	0	128,902	83,807,971	650.17
2018	2,705	30,170	2,277	600	35,752	31,688,607	886.33
2019	5,893	103,991	2,720	17,135	129,740	107,974,724	832.24
2020	919	120,040	0	29,835	150,794	146,290,092	970.13

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

4. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය තත්ව ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2020 (රු.)	2019(රු.)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	F	834,002,398.10	839,699,291.15
ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම්	G	2,580,107.81	2,656,493.41
අස්පෘශ්‍ය වත්කම්	H	18,683,407.32	21,441,486.01
		855,265,913.23	863,797,270.57
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	I	35,975,522.72	21,543,060.18
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	J	86,978,501.12	81,831,001.78
තැන්පතු සහ පෙර ගෙවුම්	K	45,623,918.19	94,038,878.47
අනෙකුත් මූල්‍ය වත්කම්	L	7,621,289,731.25	7,780,196,624.51
ණය	M	2,210,370,586.25	1,786,381,806.21
මුදල් සහ මුදල් හා සමාන දෑ	N	151,302,423.72	230,219,655.62
		10,151,540,683.25	9,994,211,026.77
මුළු වත්කම්		**11,006,806,596.48**	**10,858,008,297.34**
හිමිකම් සහ වගකීම්			
දායක ප්‍රාග්ධනය		672,012,201.85	672,012,201.85
රඳවා ගත් ඉපැයුම්		(138,037,671.84)	(117,001,094.04)
ප්‍රවර්ධන සහ අලෙවි බද්ද	O	9,151,390,517.56	9,003,547,466.93
ප්‍රත්‍යාගණන සංචිත		537,223,480.50	509,766,985.70
මුළු හිමිකම්		**10,222,588,528.07**	**10,068,325,560.44**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ බැඳීම්	P	70,461,681.09	67,074,289.96
		70,461,681.09	67,074,289.96
ජංගම වගකීම්			
ගෙවිය යුතු ආදායම් බදු	R	34,614,463.63	72,653,169.38
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	S	678,318,079.34	514,186,766.60
බැංකු ණය	Q	-	135,682,622.16
බැංකු අයිරාව	T	823,844.35	85,888.80
		713,756,387.32	722,608,446.94
මුළු වගකීම්		**11,006,806,596.48**	**10,858,008,297.34**

පිටු අංක 86 සිට 96 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 97 සිට 105 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේය.

Director Finance	Director General	Chairman	Director
Date: 19/2/21	Date:	Date:	Date:

ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2020 (රු.)	2019(රු.)
ආදායම			
	A	455,013,176.55	474,268,569.86
වියදම්			
තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම්	B	(63,979,702.12)	(71,841,824.18)
පරිපාලන වියදම්	C	(442,916,930.49)	(436,658,015.58)
මෙහෙයුම් අතිරික්තය / (හිඟය)		**(51,883,456.06)**	**(34,231,269.90)**
මූල්‍ය ආදායම්	D	47,487,608.47	82,771,112.22
මූල්‍ය වියදම්	E	(6,335,483.30)	(29,239,913.43)
බදු අය කිරීමට පෙර අතිරික්තය / (හිඟය)		**(10,731,330.89)**	**19,299,928.89**
පොළී ආදායම මත ගෙවූ බදු	R	(10,716,323.56)	(16,624,405.41)
බදු අය කිරීමෙන් පසු අතිරික්තය / (හිඟය)		**(21,447,654.45)**	**2,675,523.48**

පිටු අංක 79 සිට 85 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 86 සිට 92 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

වෙනත් සංයුක්ත ආදායම් පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය)	**(21,447,654.45)**	**2,675,523.48**
ප්‍රත්‍යාගණන අතිරික්තය / (අලාභය)	27,456,494.80	1,553,729.16
කාලපරිච්ඡේදය තුළ මුළු අතිරික්තය/ (හිඟය)	**6,008,840.35**	**4,229,252.64**

පිටු අංක 86 සිට 96 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 97 සිට 105 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	දායක ප්‍රාග්ධනය (රු.)	ප්‍රවර්ධන හා අලෙවි බද්ද (රු.)	ප්‍රත්‍යාගණන සංචිත (රු.)	සමුච්චිත ලාභය (රු.)	එකතුව (රු.)
2018 ජනවාරි 01 දිනට					
ශේෂය	672,012,201.85	6,806,198,361.00	508,216,543.00	(172,191,903.00)	7,814,235,202.85
ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O)	-	631,890,344.00	-	-	631,890,344.00
ගැළපුම්	-	36,422,096.00	-	4,668,051.00	41,090,147.00
2018 වර්ෂය සඳහා අතිරික්තය	-	-	-	43,977,748.00	43,977,748.00
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**672,012,201,85**	**7,474,510,801.00**	**508,216,543.00**	**(123,546,104.00)**	**8,531,193,441.85**
2019 ජනවාරි 01 දිනට ශේෂය	672,012,201.85	7,474,510,801.00	508,216,543.20	(123,546,104.00)	8,531,193,442.05
ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O)	-	1,082,860,694.06		-	1,082,860,694.06
ගැළපුම්	-	446,175,971.87	1,550,442.50	3,869,486.48	451,595,900.85
2019 වර්ෂය සඳහා අතිරික්තය	-		-	2,675,523.48	2,675,523.48
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**672,012,201.85**	**9,003,547,466.93**	**509,766,985.70**	**(117,001,094.04)**	**10,068,325,560.44**
2020 ජනවාරි 01 දිනට ශේෂය	672,012,201.85	9,003,547,466.93	509,766,985.70	(117,001,094.04)	10,068,325,560.44
ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O)	-	148,907,390.13	-	-	148,907,390.13
ගැළපුම්	-	(1,064,339.50)	-	411,076.65	(653,262.85)
2020 වර්ෂය සඳහා අතිරික්තය	-		27,456,494.80	(21,447,654.45)	6,008,840.35
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**672,012,201.85**	**9,151,390,517.56**	**537,223,480.50**	**(138,037,671.84)**	**10,222,588,528.07**

පිටු අංක 86 සිට 96 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 97 සිට 105 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය	(21,447,654.45)	2,675,523.48
පහත සඳහන් කාරණා සඳහා ගැලපුම්:		
දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම	43,153,712.06	30,799,910.41
දේපල, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ලාභය හෝ පාඩුව	-	(2,377,637.84)
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම	76,385.60	76,385.60
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	3,953,111.71	3,606,230.43
පාරිතෝෂික ප්‍රතිපාදන	18,461,431.13	17,741,359.04
මූල්‍යමය වියදම්	6,335,483.30	29,239,913.43
මූල්‍යමය ආදායම්	(47,487,608.47)	(82,771,112.22)
බොල්ණය අඩමාණ ණය සඳහා කපා හැරීම්	-	(25,000,000.00)
බදු සඳහා ප්‍රතිපාදන	10,716,323.56	16,624,405.41
	35,208,838.89	**(12,060,545.74)**
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය	**13,761,184.44**	**(9,385,022.26)**
භාණ්ඩ ලැයිස්තුවල අඩුවීම / (වැඩිවීම)	(15,170,750.99)	16,772,511.35
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම /(වැඩිවීම)	(7,669,328.84)	374,052.22
තැන්පතු සහ පෙර ගෙවුම් අඩුවීම /(වැඩිවීම)	48,414,960.28	(3,004,191.42)
වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ අඩුවීම /(වැඩිවීම)	171,595,789.11	(399,563,109.16)
ගෙවියයුතු ආදායම් බදු	(35,298,324.06)	18,485,612.08
ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා ණය	(423,988,780.04)	(930,525,563.21)
	(262,116,434.54)	(1,297,460,688.14)
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල	(248,355,250.10)	(1,306,845,710.40)
ගෙවනු ලැබූ පාරිතෝෂික	(15,074,040.00)	(3,186,104.04)
බදු ගෙවීම්	(13,456,705.65)	(16,573,682.88)
ප්‍රවර්ධන කටයුතු සඳහා ශුද්ධ වියදම	147,843,050.63	1,529,036,665.93
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල	**119,312,304.98**	**1,509,276,879.01**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ	(129,042,945.12)	202,431,168.61
ආයෝජන ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ		
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහ	-	2,763,276.80
මූල්‍ය ආදායම්	47,487,608.47	82,771,112.22
මූල්‍ය ආදායම්	1,195,033.02)	(3,875,581.77)
දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(13,793,605.58)	(50,539,114.26)
පිරියත හා යන්ත්‍රෝපකරණ ඇතුළු ආයෝජන	158,906,893.26	112,471,235.49
ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිත කරන ලද මුදල් ප්‍රවාහ	191,405,863.13	143,590,928.48
මූල්‍ය කටයුතුවලදී භාවිත කරන ලද මුදල් ප්‍රවාහ		
මූල්‍ය වියදම්	(6,335,483.30)	(29,239,913.43)
බැංකු ණය	(135,682,622.16)	(211,161,451.84)
ශුද්ධ මුදල් ප්‍රවාහ / මූල්‍ය කටයුතුවලදී (භාවිත කරන ලද)	(142,018,105.46)	(240,401,365.27)
ශුද්ධ වැඩිවීම (අඩුවීම) / මුදල් සහ මුදල් හා සමාන දේවල්	(79,655,187.45)	105,620,731.82
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	230,133,766.82	124,513,035.00
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	150,478,579.37	230,133,766.82

පිටු අංක 86 සිට 96 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 97 සිට 105 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. සංස්ථාව පිළිබඳ තොරතුරු

පොදු

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබූ අතර මෙම මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 24 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මූලික කාර්යයන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය කිරීම, සංවර්ධනය කිරීම, සහ ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමයි. එයට තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම හා අධිකාරිය පැවරී ඇත. එනම්, තේ නිෂ්පාදනය, නව තේ වගාකිරීම සහ තේ නැවත වගාකිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යනාදී කටයුතු ය. තවද, තේ වෙන්දේසි පැවැත්වීම, ගුණාත්මක තත්වය අධීක්ෂණය කිරීම මෙන්ම තේ විකිණීම, අපනයනය, තැරැව්කරුවන්, ගබඩා සහ තේ බෙදා හැරීම ආදී කටයුතු නියාමනය කිරීම ද එමගින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ මෙන්ම අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර.) පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මුදල් වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර) සහ ලංකා ගිණුම් ප්‍රමිති (ලං.ගි.ප්‍ර) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

3.1 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිත කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත පරිදි වේ.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

කාර්යාල කටයුතුවලින් පසු වියදම් - අපනයන	297,518.21	1,022,995.28
සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය	23,948,061.84	23,307,662.92
සේවක භාරකාර අරමුදලට දායකත්වය	4,788,966.30	4,429,061.35
කාර්ය මණ්ඩල පාරිතෝෂික	18,461,431.13	17,741,359.04
	224,058,642.38	**211,280,911.54**
6.2 වෙනත් පරිපාලන වියදම්		
සාමාජිකත්ව දායකත්වය (වෘත්තිය)	16,000.00	125,500.00
කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා	4,000,000.00	4,350,000.00
වෛද්‍ය ප්‍රතිලාභ / පුද්ගලික අනතුරු වෙනුවෙන් හිමිකම් ඉල්ලීම්	22,731,833.07	22,751,012.45
කාර්ය මණ්ඩලයට සපයන දියර තෙ	1,765,281.70	2,143,512.00
කාර්ය මණ්ඩලයට පැකට් කළ තේ සැපයීම	6,066,360.00	4,633,427.49
සේවක සුබසාධනය	1,696,386.60	1,836,946.06
මරණ පරිත්‍යාගය	750,000.00	500,000.00
ක්‍රීඩා / විනෝදාත්මක පහසුකම්	250,000.00	250,000.00
කාර්යමණ්ඩල දේපල ණය සඳහා පොළිය	752,800.92	790,001.10
කාර්ය මණ්ඩල පුහුණු / සම්මන්ත්‍රණ / වැඩමුළු	1,127,020.00	10,719,182.23
මණ්ඩල / කමිටු සාමාජිකයින්ට ගාස්තු ගෙවීම්	1,135,920.00	1,856,980.00
මණ්ඩල රැස්වීම් වියදම්	73,660.00	66,060.00
විශ්ලේෂණ රසායනාගාරය - පරිභෝජන ද්‍රව්‍ය	2,271,923.26	3,168,588.55
විභාග ගාස්තු	464,847.00	664,710.00
ගනුදෙනුකරුගේ තැන්පතු ආපසු ගෙවීම්	30,000.00	15,000.00
උපදේශන ගාස්තු	1,417,975.00	-
සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු	12,825.00	43,400.00
	44,562,832.55	**53,914,319.88**
07. ගමන් වියදම්		
ගමන් වියදම් (දේශීය)	16,931,533.04	13,020,407.15
	16,931,533.04	**13,020,407.15**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
08. සැපයුම් සහ අවශ්‍යතා		
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	5,110,732.36	8,297,635.96
ඉන්ධන සහ ලිහිසි තෙල	4,071,517.44	4,451,925.46
යාන්ත්‍රික, විදුලි හා සාමාන්‍ය භාණ්ඩ	262,287.50	297,286.00
පොත්, චාර සඟරා සහ පුවත්පත	3,373,714.90	819,621.00
නිල ඇඳුම්	1,718,939.50	1,518,222.25
තේ පරීක්ෂණ කාමර අවශ්‍යතා	-	16,550.00
තේ අපනයන ඒකක අවශ්‍යතා	-	11,040.00
	14,537,191.70	**15,412,280.67**
09. අලුත්වැඩියා , නඩත්තු කිරීම සහ ප්‍රාග්ධන වත්කම්		
වාහන අලුත්වැඩියාව හා නඩත්තුව	1,784,217.37	2,685,051.07
පිරියත හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව	1,949,136.07	3,239,877.36
ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුව	1,057,697.96	1,979,112.14
කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව	6,828,726.96	12,898,800.62
ගෘහ භාණ්ඩ හා සවිකුරු අලුත්වැඩියාව හා නඩත්තුව	33,348.00	150,079.10
වෙනත් උපයෝජන සේවා	60,366.00	88,030.96
සනීපාරක්ෂක සේවය	6,240,473.50	6,657,861.84
විද්‍යාගාර ප්‍රතිතනය හා උපකරණ නඩත්තු කිරීම	723,305.39	351,432.30
	18,677,271.25	**28,050,245.39**
10. උපයෝගිතා සහ වෙනත් වියදම්		
පුවත්පත් දැන්වීම්	1,349,338.50	5,222,242.00
දුරකථන, ෆැක්ස් සහ අන්තර්ජාලය	9,029,381.76	8,258,671.62
තැපැල් ගාස්තු	1,067,683.94	1,363,960.60
විදුලිය	10,926,319.58	11,687,325.80
ගාස්තු සහ බදු	1,688,463.07	1,465,186.24
කුලිය	8,208,570.00	7,056,600.00
රක්ෂණය - ගොඩනැගිලි, වාහන ආදිය	1,556,617.45	1,019,038.74
ආරක්ෂක සේවා	9,730,584.10	11,709,293.55
විගණන ගාස්තු	1,200,000.00	1,200,000.00
නීති ගාස්තු	572,155.00	1,658,086.00
වෙනත් ගාස්තු	770,307.07	185,061.00
තේ සාම්පල පරීක්ෂණ ගාස්තු	1,726,063.21	3,605,596.36
ජල සැපයුම සහ උණුසුම් කිරීම	678,806.48	1,131,777.91
තේ රස බැලීමේ මණ්ඩල ගාස්තු	2,352,100.00	2,769,300.00
විවිධ වියදම්	426,187.13	702,999.69
ප්‍රවාහන හා කුලි ගාස්තු	107,500.00	-
වාහන සඳහා බදු කුලි	19,259,556.21	20,764,293.27
ඉඩම් සඳහා බදු කුලි	1,513,500.00	330,000.00
හදිසි අවස්ථා - කෝවිඩ් -19	6,575,470.42	-
නුවර එළිය වියදම්	34,040.00	2,201,688.55
	78,772,643.92	**82,331,121.33**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
11. තොග		
11.1 රසායනාගාරය		
රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය	7,268,252.51	6,450,193.05
	7,268,252.51	**6,450,193.05**
11.2 පරිභෝජන ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය	8,628,347.99	4,699,661.82
ප්‍රචර්ධන ද්‍රව්‍ය	6,026,463.88	156,010.00
	14,654,811.87	**4,855,671.82**
11.3 තේ සහ වෙනත් තොග		
තේ - ප්‍රධාන ගබඩා	4,088,745.93	3,987,288.64
තේ - විකුණුම් කවුන්ටරය	354,148.48	269,973.29
කාර්ය මණ්ඩල සඳහා තෙ	805,185.00	186,365.00
හිස් පෙට්ටි	3,553,486.71	3,101,236.77
තේ රැගෙන යන බෑග	89,241.85	3,500.00
ගැට ගසන පටිය	33,400.00	33,400.00
	8,924,207.97	**7,581,763.70**
11.4 සංක්‍රමණ භාණ්ඩ	5,128,250.37	2,655,431.61
	5,128,250.37	2,655,431.61
	35,975,522.72	**21,543,060.18**
12. ලැබිය යුතු දේ		
විවිධ ලැබීම්	39,754,875.30	4,172,789.48
ණය ගැතියන් - ක්‍රිකට් ටී ෂර්ට්	679,123.30	690,503.02
ණය ගැතියන් පාලනය	937,733.65	4,052,128.70
ලැබිය යුතු ආදායම	1,227,497.16	262,497.16
පැකට් කළ තේ අලෙවිය	448,176.28	227,560.81
හිඟය	1,313,986.03	1,327,371.41
	44,361,391.72	**10,732,850.58**
12.1 තානාපති කාර්යාල ගිණුම්		
චීනය	84,764.07	84,764.07
බැංකොක්	-	473,803.46
එක්සත් රාජධානිය	368,447.03	345,421.01
ජර්මනිය	-	479,914.95
ජපානය	19,089.91	17,649.80
ප්‍රංශය	513,985.35	456,283.57
පෝලන්තය	422,294.06	417,864.32
ඕස්ට්‍රේලියාව	27,965.78	24,771.03
	1,436,546.20	**2,300,472.21**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
12.2 තේ ප්‍රවර්ධන එකකය - ජංගම ගිණුම්		
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	790,450.15	750,185.40
මොස්කව්	706,093.59	2,420,122.12
චීනය	352,681.17	315,948.10
	1,849,224.91	**3,486,255.62**
13. ණය සහ අත්තිකාරම්		
ඒකාබද්ධ ණය - තේ කොමසාරිස් අංශය	6,847,852.57	8,118,502.77
ඒකාබද්ධ ණය - ප්‍රධාන කාර්යාලය	31,486,862.54	31,040,547.56
අත්තිකාරම් - උත්සව	649,400.00	496,900.00
කාර්ය මණ්ඩල තේ ප්‍රතිසාධනය	202,625.00	490,980.00
කාර්ය මණ්ඩල ණය ගැතියන	10,000.00	11,850.00
ණය - ගංවතුර සහන	-	114,629.00
අත්තිකාරම් ගෙවීම්	23,138.85	26,554.71
ණය සහ අත්තිකාරම් - මොස්කව්	11,459.33	11,459.33
වෙනත් අත්තිකාරම් - ප්‍රාදේශීය කාර්යාල	100,000.00	-
	39,331,338.29	**40,311,423.37**
14. තැන්පතු සහ පෙර ගෙවුම්		
තැන්පතු	5,204,386.19	4,735,211.19
මුද්දර තැන්පතු	160,000.00	160,000.00
පාර්සල් තැපැල් තැන්පත	44,940.00	44,940.00
තැන්පතු සහ පෙරගෙවුම් - එක්සත් අරාබි එමීර් රාජ්‍යය	1,025,373.59	32,948,364.03
තැන්පතු සහ පෙරගෙවුම් - මොස්කව්	277,824.75	4,228,541.53
තැන්පතු සහ පෙරගෙවුම් - චීනය	652,781.00	913,570.60
පෙර ගෙවීම්	5,858,440.98	20,616,554.15
පෙරාතුව ගෙවීම - චීනය	-	91,702.97
පෙරාතුව ගෙවීම - එක්සත් අරාබි එමීර් රාජ්‍යය	-	61,551.55
සජීවිකරණ අත්තිකාරම්	32,400,171.68	30,238,442.45
	45,623,918.19	**94,038,878.47**
15. ආයෝජන		
ස්ථාවර තැන්පතුව - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	454,409,000.00	539,409,000.00
ලාබය යුතු ස්ථාවර තැන්පතු පොළී - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	8,658,603.97	16,973,669.02
ස්ථාවර තැන්පතුව - ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්ද	6,956,839,407.93	6,507,471,909.63
ලාබය යුතු ස්ථාවර තැන්පතු පොළී - ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්ද	198,683,436.01	228,409,137.71
අතිරික්ත භාරකාර අරමුදල - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	-	61,612,252.97
අතිරික්ත භාරකාර අරමුදල - ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්ද	-	423,621,371.84
නිවාස ණය තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2,699,283.34	2,699,283.34
	7,621,289,731.25	**7,780,196,624.51**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
16. මුදල් සහ මුදල් හා සමාන දෑ		
16.1 මුදල්		
සුළු අක්මුදල් - මුද්දර	10,000.00	10,000.00
අත ඇති විකුණුම් මත එකතු කිරීම	564,111.29	396,111.72
	574,111.29	**406,111.72**
16.2 බැංකු ශේෂ		
ලංකා බැංකුව - කොල්ලුපිටිය 2	17,443,958.19	10,752,105.22
ලංකා බැංකුව- ආයතනික (ප්‍රධාන කාර්යාලය)	7,360,716.77	10,819,674.38
ලංකා බැංකුව - බම්බලපිටිය	53,890,207.06	142,593,305.33
ලංකා බැංකුව - ආයතනික (තේ කොමසාරිස් අංශය)	14,771,515.46	13,953,472.02
ලංකා බැංකුව - නිදහස් වතුරශ්‍රය	719,225.00	380,925.00
ලංකා බැංකුව - තේ සහනාධාරය	37,899,557.29	21,938,330.41
මහජන බැංකුව	11,927,139.89	25,048,172.04
	144,012,319.66	**225,485,984.40**
16.3 ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්		
ගාල්ල	668,134.62	236,065.50
මාතර	416,354.34	95,443.09
රත්නපුර	702,144.92	933,772.55
මතුගම	352,980.50	218,283.40
බණ්ඩාරවෙල	425,693.30	90,389.47
ගම්පොල	390,947.15	511,142.47
නුවරඑළිය	161,477.50	1,147.38
	3,117,732.33	**2,086,243.86**
16.4 ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ එකතු කිරීමේ ගිණුම්		
ගාල්ල	401,251.74	14,014.70
රත්නපුර	-	16,228.54
මතුගම	2,817,634.50	1,560,460.60
බණ්ඩාරවෙල	379,374.20	638,996.40
නුවරඑළිය	-	11,615.40
	3,598,260.44	2,241,315.64
	151,302,423.72	**230,219,655.62**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
17. ණය හිමියන් සහ ප්‍රතිපාදන		
17.1 වෙළඳ ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු දෑ	9,207,524.78	14,891,056.14
ණය හිමි පාලනය	447,839.75	-
ණය හිමි තේ ඇණවුම්	24,641.88	26,724.88
ණය හිමියන් සහ ප්‍රතිපාදන - එක්සත් අරාබි එමීර් රාජ්‍යය	76,316.82	2,829,334.15
ණය හිමියන් සහ ප්‍රතිපාදන - චීනය	44,710.80	113,858.71
ණය හිමියන් - තේ ඉඩම් ලියාපදිංචි කිරීම	84,455.00	88,565.00
ණය හිමියන් සහ ප්‍රතිපාදන - මොස්කව්	3,057.37	1,230,130.89
විවිධ ණයගැතියන්ගේ බදු	24,808,058.70	40,034,757.77
ගෙවිය යුතු හරිත පත්‍ර සහනාධාර	912,229.53	912,229.53
	35,608,834.63	**60,126,657.07**
17.2 වෙනත් ගෙවීම්		
සාමාන්‍ය තැන්පතු	220,515,162.50	220,156,672.62
ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතුව	9,000.00	9,000.00
රදවා ගැනීමේ මුදල් තැන්පතු	22,687,433.42	25,135,125.07
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල අසුරුම්කරු	14,505,079.99	18,931,386.08
කාර්යමණ්ඩලයේ ණය හිමියන්	4,697,094.30	4,631,452.39
හිඟ - හරිත පත්‍ර තැන්පතු	10,597,266.91	10,928,763.61
සේවක අර්ථ සාධක අරමුදල - ගෙවිය යුතු	3,217,320.96	4,340,579.66
Cusdec තැන්පතුව	161,400.00	161,400.00
රදවා ගැනීමේ දිරි දීමනා - විකුණුම් කවුන්ටරය	41,930.42	162,683.88
ආදර්ශ තේ වතු සඳහා සහනාධාර ක්‍රමය	12,079,356.50	17,312,606.50
ගෙවිය යුතු වැට් බදු	2,263,561.90	7,391.62
	290,774,606.90	**301,777,061.43**
17.3 කල් ඇතිව ලැබීම්		
කල් ඇතිව ලැබීම්	200,142.00	142,798.70
නුවරඑළිය - විකුණුම් මධ්‍යස්ථානය	1,620,000.00	1,620,000.00
වෙළඳ ප්‍රදර්ශනය	2,350,000.00	34,900,000.00
බලපත්‍ර ගාස්තු	8,167,900.00	7,603,365.00
ප්‍රතික්ෂේපිත තේ	510,000.00	2,070,000.00
ගබඩාව අලුත් කිරීම	1,920,000.00	1,905,000.00
නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තුව	1,750,000.00	1,750,000.00
සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම	-	15,000.00
තේ කර්මාන්තශාලා ලියාපදිංචිය	1,210,000.00	-
තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම	50,000.00	30,000.00
තේ අපනයනකරුවන් අලුත් කිරීම	34,480,000.00	34,600,000.00
තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීම	2,460,000.00	2,510,000.00
තේ ගබඩාව ලියාපදිංචි කිරීම	75,000.00	25,000.00
දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම	-	30,000.00

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2020 (රු.)	2019 (රු.)
අපනයනකරුවන් ලියාපදිංචි කිරීම	50,000.00	25,000.00
තේ ආනයනකරුවන් අලුත් කිරීම	415,000.00	405,000.00
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය සඳහා වෛද්‍ය තැන්පතු	366,834.00	230,142.00
ඒකාධිකාරී කුලිය	108,333.34	754,166.67
විකුණුම් කවුන්ටරය - කුලී තැන්පතුව	1,235,000.00	1,195,000.00
තැන්පතු - BMF	174,643.00	52,443.00
	57,142,852.34	**89,862,915.37**
17.4 උපචිත වියදම්		
උපචිත වියදම්	11,639,019.48	25,737,868.20
උපචිත වියදම් ප්‍රවර්ධන හා අලෙවි බද්ද	267,125,405.06	20,084,132.63
ගෙවිය යුතු පොළිය - බැංකු ණය	-	1,072,874.34
	278,764,424.54	**46,894,875.17**
17.5 වෙනත් ප්‍රතිපාදන		
කාර්ය මණ්ඩල ගමන් බිමන්	-	689,273.28
ගමන්	5,588,982.27	2,850,683.46
වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම	-	652,320.00
විගණන ගාස්තු	2,400,000.00	1,687,856.00
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල වාර්තාව මුද්‍රණය කිරීම	138,056.71	2,852,163.39
ඉන්ධන සහ ලිහිසි තෙල	403,074.00	221,114.50
වාර සඟරා සහ පුවත්පත	13,010.00	13,580.00
නඩත්තු වියදම්	513,810.13	653,031.74
තැපැල් හා සන්නිවේදනය	999,488.94	618,039.98
විදුලිය සහ ජලය	1,602,642.79	926,871.95
කුලී සහ දේශීය බදු	107,500.00	-
සනීපාරක්ෂක සේවා	590,664.62	519,898.20
ආරක්ෂක සේවා	449,172.00	952,169.34
නෛතික සහ වෙනත් ගාස්ත	54,150.00	123,500.00
වෛද්‍ය ප්‍රතිලාභ	1,648,868.00	1,314,977.00
කොවිඩ් 19 වියදම්	1,464,024.00	-
අතිකාල සහ දෛනිකව ගෙවන වැටුප	53,917.47	1,449,778.72
	16,027,360.93	**15,525,257.56**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

18. ප්‍රාදේශීය වැවිලි සමාගම සඳහා ලබා දී ඇති ණය ශේෂ

	උත්සව අත්තිකාරම් ණය	ආපදා ණය	වැටුප් වර්ධක ණය
හොරණ වැවිලි සමාගම	11,591,800.00	1,400,846.58	3,666,666.56
කහවත්ත වැවිලි සමාගම	2,004,200.00	-	-
හපුගස්තැන්න වැවිලි සමාගම	6,368,560.00	-	972,222.30
උඩ පුස්සැල්ලාව වැවිලි සමාගම	4,140,400.00	-	750,000.00
මදුල්සිමා වැවිලි සමාගම	8,453,280.00	-	2,303,057.12
කොටගල වැවිලි සමාගම	27,449,465.60	18,056,365.12	19,986,661.90
අගරපතන වැවිලි සමාගම	39,607,200.00	33,449,814.86	11,150,423.61
ඇල්කඩුව වැවිලි සමාගම	8,760,400.00	-	-
බොගවන්තලාව තේ වතු සමාගම	-	6,867.47	-
කැගල්ල වැවිලි සමාගම	-	3,997.64	-
පුස්සැල්ලාව වැවිලි සමාගම	-	6,380.87	-
තලවකැලේ තේ වතු සමාගම	-	6,552.97	-
මතුරට වැවිලි සමාගම	-	-	611,111.15
	108,375,305.60	**52,930,825.51**	**39,440,142.64**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පීඑල්ඒ/බී/එස්එල්ටීබී/ 01/20/08 මෙම අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2021 සැප්තැම්බර් 24 දින

සභාපති,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 පරිදි සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභයට ගැලපීම් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් ප්‍රත්‍යාගණන අතිරික්තයද ගැලපීමෙන් පසු එළඹී ලාභයට ගැලපීම් කර තිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වලනයට බලනොපාන ලද අයිතම් වශයෙන් තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ අරමුදලෙහි ආදායම් බදු වෙන්කිරීම් රු. 144,758,895 ක් සහ ස්ථාවර වත්කම් ගැලපුම් වශයෙන් රු. 14,521,855 ක් ද 2019 වර්ෂයට අදාළ පුස්තකාල පොත් වෙනුවෙන් වූ රු. 53,350 ක ක්ෂය වියදමද පසුගිය වර්ෂයට අදාළව ප්‍රවර්තන වර්ෂයේදී සිදුකළ රු. 653,262 ක ගැලපීම්ද මෙහෙයුම් ප්‍රතිඵලයට ගැලපුම් කර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 119,194,204 ක් වූ රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා උපකරණ, ජලය, විදුලිය හා උපකරණ, සැරසිලි උපකරණ හා පුස්තකාල පොත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ පිරියත හා උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කාර්යාල උපකරණ, යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රධාන කාර්යාලයට අයත් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඈ) 2019 වර්ෂයේදී තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු අරමුදලින් රු. මිලියන 1,000 ක් ද 2020 වර්ෂයේදී තවදුරටත් එම අරමුදලේ අතිරික්ත මුදල් රු. මිලියන 509.62 ක් ද මහා භාණ්ඩාගාරය වෙත මණ්ඩලය විසින් ලබාදී තිබුණු අතර මෙම මුදල් මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු ණය ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේවුවද, මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙම ශේෂ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ගෙවිය යුතු ශේෂයන් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ සනාථයන්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ජුනි මස 10, 11 යන දිනයන්හිදී ඇමෙරිකාවේදී පැවැත්වීමට නියමිතව තිබූ ලෝක තේ වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටි වෙන්කරවා ගැනීම වෙනුවෙන් 2020 ජනවාරි 08 දින රු. 4,474,728 ක් (USD $ 24,395) එක්සත් ජනපදයේ චිකාගෝ නුවර පිහිටි පුද්ගලික ආයතනයක අංක 811104744 දරන බැංකු ගිණුමට ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වෙතත් ඒ වන විට පැවති ගෝලීය කොරෝනා තත්ත්වය මත මෙම ප්‍රදර්ශනය නොපැවැත්වීමට ප්‍රදර්ශන කමිටුව තීරණය කර තිබුණු අතර 2020 අගෝස්තු 29 දින විදුහුත් තැපෑල මඟින් මෙම ගෙවා ඇති මුළු මුදලම ආපසු නොගෙවා 2021 ජුලි මස 14, 16 දිනයන්හිදී පැවැත්වීමට නියමිත ලෝක තේ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටි වෙන්කරවා ගැනීමට බැර කරන ලෙස මණ්ඩලය විසින් ඉහත ආයතනයට දැනුම් දී තිබුණි. එසේ තිබියදී මෙම අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණි. තවද මෙම වියදම තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය ලදුපත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) පුහුණු පාඨමාලා වියදම් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට උපචිත කරන ලද රු. 2,280,165 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා එම ප්‍රමාණය උපචිත වියදම් ගිණුමට හර කරනු වෙනුවට වියදම් ගිණුම හර කර තිබුණි. ඒ අනුව වියදම් ගිණුම සහ උපචිත වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) බැංකු තහවුරු කිරීමේ ලිපිය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නිවාස ණය තැන්පතුව වෙනුවෙන් ලැබුණ පොලිය රු. 103,877 ක් වුවත් එය ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) ප්‍රධාන කාර්යාලයේ තේ අළෙවි සැළෙහි අළෙවි කරනු ලබන තේ, පාරිභෝගිකයන්ට නිකුත් කිරීමේදී ඒවා බහාලීම සඳහා පුද්ගලික ආයතනයකින් " ඇණවුම් අංක 18829 " යටතේ 2018 වර්ෂයේදී සැපයුම් කරන ලද රු. 3,645,000 ක කුඩා හා විශාල කඩදාසි කවර 30,000 ක් සම්බන්ධයෙන් නියමිත ආකාරයෙන් තොග සටහන් පවත්වාගෙන යාම සිදු වී නොතිබූ බව නිරීක්ෂණය විය. සියලුම හානි වූ සහ දෝෂ සහිත කවර සැපයුම්කරු වෙත ආපසු බාර දී තිබියදී සැපයුම්කරුට ගෙවිය යුතු මුදල් ලෙස රු. 1,404,640 ක් 2020 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් යටතේ දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 207,342,040 ක් ජංගම වත්කම් යටතේ ලැබිය යුතු පොලී ලෙස දක්වනු වෙනුවට ස්ථාවර තැන්පතු ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ඒ) 2019 වර්ෂයේ ආදර්ශ තේ ඉඩම් පිහිටුවීමේ වැඩසටහන යටතේ සහනාධාරලාභියෙකු වෙත නිකුත් කරන ලද ලංකා බැංකුවේ අංක 562353 දරන චෙක්පත මඟින් ගෙවන ලද රු. 300,000 ක සහනාධාර මුදල එම ව්‍යාපෘතිය සඳහා ඔහුගේ අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා ආපසු ගෙවා තිබූ අතර එම රු. 300,000 ක මුදල අදාල වියදම් ගිණුම බැර කිරීම වෙනුවට තවදුරටත් සහනාධාරලාභියා වෙත ගෙවිය යුතු මුදලක් ලෙස 2020 දෙසැම්බර් 31 වන දිනට ගිණුම්වල ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඔ) රසායනාගාර ආදායම, ලිපිද්‍රව්‍ය තොගය සහ හිස් ඇසුරුම් පෙට්ටි තොගය මූල්‍ය ප්‍රකාශන අනුව පිළිවෙලින් රු. 2,461,600 ක් , රු. 8,628,347 ක් සහ රු. 3,553,486 ක් වුවද රාසායනාගාර ආදායම රාසායනාගාර පරීක්ෂණ වාර්තා අනුවත්, ලිපි ද්‍රව්‍ය තොගය හා හිස් ඇසුරුම් පෙට්ටි තොගය තොග සත්‍යාපන වාර්තා අනුවත් වටිනාකම පිළිවෙලින් රු.7,050,200 ක්, රු. 6,912,816 ක් සහ රු. 4,674,398 ක් වන බැවින් එකතුව රු.7,425,043 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ) සහ (ඇ), 2.2.2 (අ), (ඇ) සහ (ඈ) සහ 3 (අ), (ආ), (ඈ) සහ (එ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති	පනතේ විධිවිධාන අනුව සෙස් බදු තේ මණ්ඩලයේ අරමුදලකට බැර කළයුතු නමුත් ඊට පටහැනිව මහා භාණ්ඩාගාරය වෙත බැර කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ 751	මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයේ ගබඩාව විසින් බඩු ලේඛන පොත් විධිමත්ව පවත්වා නොතිබුණි.
(ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය	2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. 7,411,248,407 ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.
(ඈ) 2018 සැප්තැම්බර් 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග	මණ්ඩලයේ අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබූ, 2009 වර්ෂයේදී රු. 32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පලිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය(Liquid Chromatography Mass Spectrometer) වාර්තාවේ දින දක්වා භාවිතා කර නොතිබුණි. අභ්‍යන්තර විනය පරීක්ෂණය නිම කිරීම සඳහා වර්ෂ 11ක් ගතවී තිබූ අතර විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර අවසන් තීරණයකට එළඹ නොතිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) තේවල පවත්නා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය කිරීම සඳහා රසායනාගාරයේ ස්ථාපිත කර තිබූ යන්ත්‍රය (Gas Chromatography Mass Spectrometer) භාවිතයෙන් ඉවත් කර ඇති බැවින් නව යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා 2018, 2019 වර්ෂයන්හි රු. 50,000,000 ක අයවැය ප්‍රතිපාදනයක් කර තිබුණ අතර 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුළ රු. 60,000,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද 2021 අප්‍රේල් 30 විගණන දිනය වන විටත් ප්‍රසම්පාදනය නිමකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙහි ක්‍රියාකාරිත්වය වසර 06 ක කාලයක් සඳහා රු. 8,162,296 ක බදු මුදලකට ගෙවීමේ හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව පුද්ගලික පාර්ශවයකට පවරා තිබූ අතර, බදු ගිවිසුමට අනුව 2019 මැයි 27 සිට 2020 මැයි 26 දක්වා රු. 100,000 බැගින්ද 2020 මැයි 27 සිට 2021 මැයි 26 දක්වා රු. 105,000 බැගින්ද බදු වාරික අයවිය යුතුව පැවතුණද 2020 වර්ෂය සඳහා මාස 03 ක බදුකුලී පමණක් ලැබී තිබුණු අතර 2021 වර්ෂය සඳහා කිසිදු බදු වාරික මුදලක් විගණිත දින දක්වාම ගෙවා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව බදුකරුගෙන් ලැබිය යුතු ලෙස රු. 900,000 ක් දක්වා ඇති අතර ලැබිය යුතු හිඟ වාරික වටිනාකම රු. 35,000 ක් හා සියයට 1 ක දඩ මුදල්ද වෙළඳසැලේ ජල විදුලි පරිභෝජනය වෙනුවෙන් රු. 99,267 ක මුදලක්ද වාර්ෂික විකුණුම් වලින් සියයට 02 ක මුදලක්ද තේ මණ්ඩලයට ලැබිය යුතු වූවද ගිණුම්වල එම මුදල අඩුවෙන් දක්වා තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 19 දින ලබාදෙන ලද රු. 25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි තේ කෞතුකාගාරයේ (Ceylon Tea Museum) අයිතිය අත්කර ගැනීම හා එම ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව තීරණයකට එළඹ තිබූ නමුත්, 2021 අප්‍රේල් 30 විගණන දින දක්වා

වර්ෂ 08 කට වැඩි කාලයක් ගත වුවද මෙම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. තේ කෞතුකාගාරයෙහි අයිතිය පවරාගැනීම හා ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද අංක 2020/ 492/ 65 දරන කළමණාකරන මණ්ඩල තීරණය අනුව 2020 පෙබරවාරි 27 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායන්හි කම්කරු වැටුප් ගෙවීම සඳහා තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට නැවතත් රු. 10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණි.

(ආ) හිටපු අමාත්‍යවරයෙකු, අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරයෙකු සහ තේ පර්යේෂණ ආයතනයේ නිලධාරින් ඇතුළු පිරිසකගේ විදේශ ගමන් වියදම් එකතුව වූ රු. 975,257 ක් වසර 03 සිට 04 දක්වා කාලයක සිට ලැබිය යුතු ශේෂයක් ලෙස පවතින අතර 2021 අප්‍රේල් 30 විගණන දින වන විටත් වැවිලි අමාත්‍යාංශයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සහ වැවිලි අමාත්‍යාංශය යන ආයතනයන්හි නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු. 631,061 ක් වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා කාලයක සිට ලැබිය යුතු මුදල් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා ඇතත් විගණන දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු. 51,604,457 ක මුදලින් රටවල් 15 ක ඉතිරි වූ රු. 1,810,840 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඉ) ලැබිය යුතු ආදායම් ශේෂය තුළ ඇතුළත් රු. 261,060 ක් වූ නුවරඑළිය සිලෝන් ටී හවුස් හි ශේෂය වසර 6 ක සිට ඉදිරියට ගෙන එමින් පවතින අතර 2021 අප්‍රේල් 30 විගණන දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) නිෂ්පාදන දෝෂ සහිත හිස් ඇසුරුම් පෙට්ටි වෙනුවෙන් පුද්ගලික ආයතනයකින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 1,313,986 ක් එම ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුමේ 4.3 වගන්තිය පරිදි අයකරගත යුතු වුවත් එසේ අය කර ගෙන නොතිබුණි. මෙම ශේෂයෙන් රු. 1,312,231 ක් 2019 වර්ෂය තුළදී අයවිය යුතු ශේෂයක් වී තිබුණි.

(උ) 2018 වර්ෂයේ සිට පැවත එන රු. 771,552 ක් වූ රඳවාගැනීම් බදු ශේෂය සමාලෝචිත වර්ෂය දක්වා හිලව් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2018 හා 2019 වර්ෂයන්ට අදාළ ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය, ඉන්ධන, අතිකාල යනාදිය සඳහා වූ උපචිත වියදම් එකතුව රු. 595,816 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර නොතිබුණි.

(එ) 2012 වර්ෂයේදී සිරියාවේ පැවැත්වීමට නියමිතව තිබී එවකට පැවති යුධ තත්වය නිසා අවලංගු වූ "ෆුඩ් එක්ස් සිරියා" ප්‍රදර්ශනය වෙනුවෙන් 2011 වර්ෂයේදී මණ්ඩලය විසින් විදේශීය පුද්ගලික ආයතනයකට සිදුකළ රු. 629,261 ක ඉදිරියට කළ ගෙවීම් අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ඒ) 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැඩ අවසන් කළ කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද රු. 9,550,530 ක මුදල් ප්‍රමාණයක් වසර 02 ක් ඉක්මවා පැවතියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) තේ කම්හල්හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති තැන්පතු මුදල් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වසර 1 සිට 18 දක්වා එනම් 2000 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා නිරවුල් නොකරන ලද තැන්පතු ප්‍රමාණය රු. 7,061,339 කි. එය මුළු තැන්පතු ප්‍රමාණය වන රු. 10,597,267 න් සියයට 67 කි.

(ඕ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු. 80 ක අවම මිලක් පවත්වාගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. 6,738,000,000 ක් වූ සහනාධාර මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉතිරි රු. 912,229 ක් ගිවිසුම් ප්‍රකාර භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි.

(ක) එක්සත් අරාබි එමීර් රාජධානි විදේශ තානාපති කාර්යාලයෙන් හා මොස්කව් විදේශ තානාපති කාර්යාලයෙන් 2017 වර්ෂයේ සිට ලැබිය යුතු පිළිවෙලින් රු. 249,130 ක් හා රු. 203,847 ක මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) භූමි ප්‍රමාණය අක්කර 10 ට වැඩි මධ්‍යම පරිමාණ සහ මහා පරිමාණ වතු ක්ෂේත්‍රය ආවරණය කරගනිමින් අවම පැළ ධාරිතාවය තේ පැළ ලක්ෂයක් වන තේ පැළ තවාන් 138 ක් සඳහා සහ කුඩා පරිමාණ තේ පැළ තවාන් 500 ක් පිහිටුවීමට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට රු. මිලියන 250 ක්ද ඇතුළුව එකතුව රු. මිලියන 450 ක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ අරමුදලින් මුදල් ලබාදීමට තීරණ අංක 2020/ 491/ 45 සහ 2020/ 498/ 238 මඟින් අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. 2010 ඔක්තෝබර් 27 දිනැති හා අංක 1677 / 14 දරන තේ ප්‍රවර්ධන සහ අලෙවි ක්‍රමෝපාය සඳහා බදු එකතු කිරීම ගැසට් නියෝගය අනුව තේ ප්‍රවර්ධනය සහ අලෙවිකරණ බදු අරමුදලේ මුදල් ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත තේ ප්‍රවර්ධනය සහ අලෙවි ක්‍රමෝපායට අදාළ කටයුතුවල නියුක්තවීමේ කාර්යය සඳහාම පමණක් භාවිත කළයුතුව ඇති හෙයින් මෙම වියදම තුළින් ඉහත නීතිය උල්ලංඝනය කර තිබුණි

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම මුදල පොලී රහිත ණය මුදලක් සේ නිකුත් කිරීමට තීරණය කර තිබුණද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට 2020 අගෝස්තු 31 දින ගෙවන ලද රු.මිලියන 75 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර දෙපාර්ශවය අතර කිසිදු අවබෝධතා ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඡ) ක්‍රියාකාරකම් පදනම් කරගත් පිරිවැය ක්‍රමයක් (Activity Based Costing System) ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබියදී උපදේශක ගාස්තු සඳහා රු. 850,000 ක් උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය විය.

(ට) ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් පිළිවෙලින් රු. 1,900,000 ක් හා රු. 1,800,000 ක් වටිනා කැබ් රථ දෙකක් 2017 නොවැම්බර් 28 දින ජාතික වැවිලි කළමණාකරණ ආයතනය වෙත පරිහරණය සඳහා ලබාදීමට කටයුතු කර තිබුණද 2021 අප්‍රේල් 30 විගණන දින වන විටත් මුදල් අයකර ඉහත වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාදීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රු. 2,665,121 ක් වැය කරමින් පුද්ගලික කුලී රථ භාවිතා කර තිබුණි.

(ඩ) ආදර්ශ තේ වගා ව්‍යාපෘතිය - 2019 යටතේ ප්‍රධාන අදියර 04 කින් සහනාධාර මුදල් ලබාදීමට සැලසුම් කර තිබූ අතර ගිවිසුම්ගත ඉල්ලුම්කරුවන්ගෙන් 07 දෙනෙකු සඳහා පළමු අදියර වන " තේ ඉඩමෙහි බිම් සකස් කිරීම " සඳහා වන රු. 2,100,000 ක සහනාධාර මුදල 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිකුත් කර නොතිබුණු අතර පළමු අදියර යටතේ තේ වගා බිම් සැකසීම සඳහා රු.300,000 ක් බැගින් වන සහනාධාර ලබාදී තිබූ තවත් 07 දෙනෙකු සඳහා

2020 දෙසැම්බර් 31 දින දක්වා දෙවන අදියර සඳහා සහනාධාර නිකුත් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ණ) දේශීය පරිභෝජනය සඳහා හෝ අපනයනය කිරීම සඳහා හෝ තේ ඇසුරුම් කිරීමෙහිලා නිරත සියලු ඇසුරුම්කරුවන් සම්බන්ධයෙන් අංක 386 / 13 සහ 1986 ජනවාරි 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග අදාළ වන අතර එහි අංක 04 හා 06 වගන්ති ප්‍රකාරව ලියාපදිංචි ගාස්තුව රු. 1000 ක මුදල හා ලියාපදිංචිය අලුත්කිරීමේ ගාස්තුව රු. 500 ක මුදල විධිමත්ව සංශෝධනය කර නොමැති වුවද මණ්ඩලය ලියාපදිංචි ගාස්තුව සංශෝධනය කිරීමටත් ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු අය නොකිරීමටත් කටයුතු කර ඇති බැවින් 2015 වර්ෂයේ සිට දේශීය තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචිය අලුත්කිරීමේ ගාස්තු ආදායම මණ්ඩලයට අහිමි වී තිබුණු අතර 2020 වර්ෂයේදී විධිමත් අනුමැතියකින් තොරව අයකළ ලියාපදිංචි ගාස්තුව රු. 1,303,800 ක් වේ.

(ත) 2020 වර්ෂය අවසානයට මණ්ඩලයෙහි ලියාපදිංචි මුළු දේශීය තේ ඇසුරුම්කරුවන් සංඛ්‍යාව 758 ක් වූ අතර ඉන් 2020 වර්ෂයේ ලියාපදිංචි නව ඇසුරුම්කරුවන් හැර ඉතිරි ඇසුරුම්කරුවන් සංඛ්‍යාව 538 ක් වේ. එම ප්‍රමාණයෙන් 212 ක් පමණක් ලියාපදිංචිය අලුත් කර තිබූ අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 28 කි. එම නිසා ලියාපදිංචිය අලුත්කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයෙහි අධීක්ෂණය සතුටුදායක මට්ටමක නොපැවති බව නිරීක්ෂණය වේ.

(ද) උක්ත (ණ) හි දැක්වෙන අති විශේෂ ගැසට් පත්‍රයේ 06 වගන්තිය ප්‍රකාරව ඇසුරුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරත වීම සඳහා අවශ්‍ය සෑම ලියාපදිංචි කිරීමක්ම එක් එක් වර්ෂයේ ජනවාරි 31 වන දින හෝ ඊට පෙර සිදු කරනු ලැබිය යුතුය. එසේම 08 වන වගන්තිය අනුව සෑම ලියාපදිංචි ඇසුරුම්කරුවෙකු විසින්, අඩංගු තේ වල නියෝජිත සාම්පලයක් සමඟ සිල්ලර ඇසුරුම් බඳුනේ සාම්පලයක් ද මණ්ඩලය වෙත සැපයිය යුතුය. එසේ වුවද දැනට මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින ඇසුරුම්කරුවන් ඒ අනුව කටයුතු කිරීමෙන් තොරව ව්‍යාපාර කටයුතු සිදුකරන අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. තවද 2013/ 420 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් පරිදි දේශීය පරිභෝජනයට සුදුසු තේ පිළිබඳ සෑම මාස තුනකට වරක් සිදු කළයුතු නියාමන කටයුතු වල වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.මේ හේතුවෙන් දේශීයව පරිභෝජනය සඳහා යෝග්‍ය නොවන තේ වෙළඳපල තුළ අලෙවි වීමට අවස්ථාව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(න) උපදේශකයකු බඳවා ගැනීම සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය තුළ හෝ වෙනත් වක්‍රලේඛයක කිසිදු විධිවිධානයක් නොතිබියදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2020 මැයි 15 දින සිට විශේෂිත තේ ප්‍රචාරණ වෘත්තීය උපදේශකවරයකු ලෙස හිටපු අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) ගේ සේවය අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව දීර්ඝකර දීමනා වශයෙන් රු. 1,829,930 ක ගෙවීමක් සිදු කර තිබුණි.

(ප) මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුව 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සියයට 18 ක්ව පැවතියදී ඵලදායී ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගික සැලැස්ම, 2020 දෙසැම්බර් දක්වා අපේක්ෂිත අයුරින් ඉටුකිරීමට නොහැකි වී තිබුණු අතර අන්තර්ජාතික තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplementary to International Tea Committee News Bulletin - 2020) අනුව සමාලෝචනය වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 14.6 ක් දක්වා පහළ බැස තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල

ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
තැ.පෙ.: 1750, කොළඹ, ශ්‍රී ලංකාව
දුක.: 011 2582121 / 011 2583687
ක්ෂණික ඇමතුම්: 011 2587814
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපෑල: teaboard@pureceylonte.com
වෙබ් අඩවිය: www.pureceylontea.com

සභාපති

දුක: 011 2587814/2590968
ෆැක්ස් : 011 2585701
විද්‍යුත් තැපෑල: chairman@pureceylontea.com

අධ්‍යක්ෂ ජනරාල්

දුක: 011 2587814/2508991
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපෑල: dgsltb@pureceylontea.com

කොමසාරිස් අංශය
තේ කොමසාරිස්

දුක: 0112580182/2580152/2502485/
2584845/2587814/2587773
ෆැක්ස්: 011 2580161
විද්‍යුත් තැපෑල: tcd@pureceylontea.com

තේ අපනයන අංශය
නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)

දුක: 011 2502485/2584845/2587814/
2504090/2587773
ෆැක්ස්: 011 2584844
විද්‍යුත් තැපෑල: exports@pureceylontea.com

තේ ප්‍රවර්ධන අංශය
අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)

දුක:0112583343/2587814/2581418/2580169
ෆැක්ස්: 011 2587341
විද්‍යුත් තැපෑල: promotion@pureceylontea.com

විශ්ලේෂණ රසායනාගාරය
අධ්‍යක්ෂ (රසායනාගාර)

දුක: 011 2587814/2581576
ෆැක්ස්: 011 2581576
විද්‍යුත් තැපෑල: lab@pureceylontea.com

ප්‍රාදේශීය කාර්යාල

ගම්පොල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
140, අඹගමුව පාර,ගම්පොල
දුර.කථ/ෆැක්ස්: 081-2352279
විද්‍යුත් තැපෑල: atcgampola@pureceylontea.com

මාතර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
23, අලුත් මාවත
උයන්වත්ත, මාතර
දුර. / ෆැක්ස් : 041-2222636
විද්‍යුත් තැපෑල :
atcmatara@pureceylontea.com

බදුරලිය

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
281, වතුරන පාර, බදුරලිය
දුර. / ෆැක්ස් : 034-2247444
විද්‍යුත් තැපෑල: atcmathugama@pureceylontea.

රත්නපුර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
61/1, නව නගරය, රත්නපුර
දුර. / ෆැක්ස් 045-2222136
විද්‍යුත් තැපෑල:atcrathnapura@pureceylontea.com

බණ්ඩාරවෙල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
විශාඛා මාවත, නව බදුල්ල පාර,
බණ්ඩාරවෙල
දුර. / ෆැක්ස් 057-2222812
විද්‍යුත් තැපෑල: atcbandarawela@pureceylontea.com

ගාල්ල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
59/A, ඉහල ඩික්සන් පාර, ගාල්ල
දුර. / ෆැක්ස් 091-2232052
විද්‍යුත් තැපෑල : atcgalle@pureceylontea.com

විදේශීය ශාඛා

අධ්‍යක්ෂ :තේ ප්‍රවර්ධන- – M.E./ ගල්ෆ්/NA

සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ කොන්සාල
ජනරාල් කාර්යාලය
තැ.පෙ.51528,
තැ.පෙ.51528,ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය
දුර : 00971 4 3987871
දුර (Direct) : 00971 4 3989349
ෆැක්ස්: 00971 4 3987872
විද්‍යුත් තැපෑල : ctbureau@emirates.net.ae
ceylonteadubai@gmail.com
ceylonte@eim.ae

3 වන ලේකම් (ප්‍රවර්ධන නිලධාරී)

සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
තානාපති කාර්යාලය
24, ස්වෙජ්කින විදිය
මොස්කව් 129090 රුසියාව
දුර : 007 495-688-1620
95-68811651/495-688-1463
ෆැක්ස් : 007-495-688-1757
විද්‍යුත් තැපෑල : tea@srilankaembassy.ru

3 වන ලේකම් (ප්‍රවර්ධන නිලධාරී)

සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
අංක. 3, (ලාන් හුවා ලුල
බීජිං - 100600,
චීන මහජන සමුහාණ්ඩුව
දුර: 00-86-10-65322919
ෆැක්ස් : 00-86-10-65325426
විද්‍යුත් තැපෑල: ceylontea@slemb.com

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

574, ගාලු පාර,
කොළඹ 03,

ශ්‍රී ලංකාව

දු.ඒ. : +94 112 582121, +94 112 587773
ෆැක්ස් : +94 11 2587341
විද්‍යුත් තැපෑල : teaboard@pureceylontea.com
වෙබ් අඩවිය : www.srilankateaboard.lk

